සබරගමු උදාන අංක. 6

# සබරගමු කවියෝ



ප්‍රකාශනය

සබරගමු පළාත් සංස්කෘතික අමාත්‍යාංශය

සම්පාදනය

බන්දුල ලියනගේ

# සබරගමු

# කවියෝ.

## සබරගමු උදාන ග්‍රන්ථ මාලාව

අංක 1 — සබරගමුවේ ජනකවි
අංක 2 — ඓතිහාසික රත්නපුර
අංක 3 — රත්නපුර විහාරවංශය
අංක 4 — මිණිපුර සිරි
අංක 5 — කෑගල්ල විහාරවංශය
අංක 6 — සබරගමු කවියෝ
අංක 7 — සබරගමුවේ කෙම්ක්‍රම
අංක 8 — කෑගලු චිත්ති
(සම්පාදනයේ පවතී)

# සබරගමු කවියෝ.

\- සම්පාදනය -

ධර්ම ශාස්ත්‍ර විශාරද, ධර්ම කීර්ති ශ්‍රී කාව්‍ය කීර්ති,
ශාස්ත්‍රපති, ධර්මවේදී

**බන්දුල ලියනගේ.**

\- ප්‍රකාශනය -

**සබරගමු පළාත්සභාවේ සංස්කෘතික අමාත්‍යාංශය.**

ප්‍රථම මුද්‍රණය 1995

ISBN 955 - 9290 - 02 - 9

චිත්‍රකවරය:—

හේරත් රූපසිංහ

මුද්‍රණය:—

ඉසුරු මුද්‍රණ
අංක 08, හිග්ගස්හේන,
කුරුවිට.

# පිළිගැන්වීම.

රජයේ විද්‍යාලයන්හි සේවය කළ ගුරු භවතෙක් හා විදුහල්පතිවරයෙකු වශයෙන් අඛණ්ඩ සේවයක් කළ උදර සේවයට අමතරව කවි කලාව කෙරෙහි ඉමහත් උනන්දුවක් දක්වමින් කවි ලියා - කවි එකතුකර ඒ වෙනුවෙන්ම මුළු ජීවිත කාලයම මෙසේ කැපකළ කරදන කේ. එන්. තියෝනිස් ගුණදස මහත්මාටද ,

තම පියාගේ එම සේවය තව දුරටත් ඉදිරියට ගෙන යමින් තමන්ට හැකි අන්දමින් කවි කලාවේ දියුණුවට ද සම්මාදම් වෙමින් තම පියාගෙන් යම් සේවයක් යම් අංශයකට ඉටු නොවීනිද ඒ හැම ඒ සැටියෙන්ම සපුරා ලීමේ හොඳ චේතනාවෙන් කටයුතු කරණ පියා තැබූ පියවරෙහිම තවත් ඉදිරියට පියවර තබා අද එම මෙහෙවර සිතට ගෙන , ගතට ගෙන , කටයුතු කරමින් ඒ නිසාම යම් මානසික සතුටක් ලබන කේ. එන්. ඩී. චන්ද්‍රසේන මහතාටද "සබරගමු කවියෝ" ග්‍රන්ථය පිළිගැන්වේ.

# ස්තු ති . . . . .

1) සබරගමු පළාතේ කර්මාන්ත, වෙළඳ, නිවාස, ග්‍රාම සංවර්ධන. හා සංස්කෘතික අමාත්‍ය ගරු ජී. ජී. විජේතුංග මැතිතුමාට.

2) සබරගමු පළාත් සභාවේ කර්මාන්ත, වෙළඳ, නිවාස, ග්‍රාම සංවර්ධන, හා සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියළු මහත්ම මහත්මීන්ට.

3) මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ ඇති වැදගත් කම පෙන්වාදී ඒ සඳහා මා උනන්දු කළ කිරිඇල්ල කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති කේ. ඇන්. ඩී. චන්ද්‍රසේන මහතාට.

4) පොත යතුරු ලියනය කරදුන් සබරගමු පළාත් සභාවේ පද්මා මාලනී දමයන්ති, ලිහිණිය කුමාරි හා ප්‍රියංකා මෙනෙවියන්ට.

5) යතුරු ලියන පිටපත් වල සෝදු පත්‍ර බැලූ එමෙන්ම මෙම ග්‍රන්ථය මුද්‍රණය කර ගැනීමට බෙහෙවින් සහයෝගය දුන් සහකාර ලේකම් පුෂ්පා අබේකෝන් මෙනෙවියට.

6) අලංකාර පිට කවරයක් සපයා දීමෙන් කවදත් මෙවැනි ප්‍රයත්නයනට සහයෝගය දක්වන සබරගමු පළාත් සභාවේ හේරත් රූපසිංහ මහත්මාට

7) පොත් බැඳීම හා වෙනත් අවශ්‍යතාවලට නිතර සහයෝගය දක්වන මාරපන මහත්මාට.

8) පොත මැනවින් මුද්‍රණය කරදුන් කුරුවිට - හිග්ගස්හේනේ ඉසුරු මුද්‍රණ ආයතනයේ කාර්‍ය මණ්ඩලයට.

# පෙරවදන් . . . . .

ඓතිහාසික සබරගමුවෙහි අනන්‍යතාවය තහවුරු කිරීමට ඉවහල් වූ එසේ නැත්හොත් සබරගමු සංස්කෘතිය රැක ගැනීමට ඉවහල් වූ සංස්කෘතික අංග අතර සාහිත්‍යයද ප්‍රධාන තැනක් ගනී.

සබරගමු සාහිත්‍ය ගැන කතා කරණ විට සබරගමුවේ කවියන් ද කිසිසේත් අමතක කළහැකි නොවේ. සබරගමු කවි පරපුරෙහි ආරම්භය කවදද කොතැනද යන්න පැවසීමට මෙහි උත්සාහ නොගතිමි. ඇතැම් විට එය ශ්‍රී ලංකාව ජනාශ්‍රිත වූ මුල් කාලයට පවා සම්බන්ධ කිරීමට හැකිවනු ඇත. ඉනුත් ඇතට ගියහොත් අවුරුදු තිස් දහසක පමණ ඈත වංශ කතාවක් ඇති සබරගමුවේ සාහිත්‍ය කාලයද ඒ කාලය දක්වා දිවෙන්නෙකැයි කෙනෙකුට පෙන්වා දීමට පුළුවන. බලන්ගොඩ මානවයාගේ සංස්කෘතියද – රාවණ පුරාවෘත්තද ශ්‍රී පාදය හා සමන් දෙවියන් පිළිබඳ පුරාවෘත්තද මෙම කාරණය තහවුරු කිරීමට ඉදිරිපත් කළහැකි සාක්ෂි වෙත්.

සබරගමු කවි පරපුර වුවද ආදිතම අවධිය, මධ්‍යතන අවධිය හා නූතන අවධිය ආදී වශයෙන් ගෙන සාකච්ඡා කිරීම පහසුවෙයි. සබරගමු කවි පරපුරට අයත්ව මෙහිදී විස්තර වන්නේ මධ්‍යතන යුගය හා නූතන යුගයට සම්බන්ධ කවියන් ගැනය. එහෙත් නූතන යුගයේ මෑත භාගයද දෙවෙනි වතාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරණ නිසා මෙයට ඇතුළත් නොකළෙමි.

සබරගමු සාහිත්‍ය ගැන කථා කරණ විට කරදන ඊසූ ශාස්ත්‍රෝන්නතිකාමී කේ. එන්. ටී. ගුණදාස මැතිතුමා දයාවෙන් සිහිපත් කළ යුතුය. පැරණි පොත පතට බලවත් ඇල්මක් දැක්වූ එතුමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු භවතෙකු ලෙසින් වුවද සේවය ගුරු වෘත්තියට සීමා නොකළේය. පොත් පත් ලිවීමෙන් විශේෂයෙන්ම කවි රචනයෙන් එතුමා ගත් උදාර ප්‍රයත්න රාශියක් අප අතර ඉතිරිව ඇත. මෙහිදී එතුමා දයාවෙන් සිහිපත් කරණ අතර එතුමාගේ පුත්‍ර විද්‍යාපති කේ. එන්. ඩී. චන්ද්‍රසේන මහත්මා රටට දැයට හිතැති දහමට හිතැති කාරුණික සුජාත පුත්‍ර රත්නයකි. මේ දෙපොල ගැන විශේෂයෙන් මෙහිදී සඳහන් කළ යුතුය.

සබරගමු පළාතේ ආගමික සංස්කෘතික අංශයේ දියුණුවට විශාල වැඩකොටසක් පසුගිය කාලය තුළදී කළහැකි වූයේ ඒ සම්බන්ධයෙන් මට ලැබුණ බලවත් සහයෝගය නිසයි. විශේෂයෙන්ම සබරගමු පළාත් සභාවේ කර්මාන්ත, සෞඛ්‍ය, නිවාස, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික අමාත්‍ය ගරු ඒ. ඒ. විජේතුංග මැතිතුමා ගැන මෙහිදී සඳහන් නොකළහොත් එය බලවත් වරදක් වියහැකි යනු මගේ හැඟීමයි. සංස්කෘතික අංශයේ විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් මෙසේ ක්‍රියාත්මක කිරීමට හැකිවූයේ එතුමාගේ ඉදිරිපත්වීම නිසයි.

වැඩ කරණ අය අඩු එහෙත් වැඩ විවේචනය කරණ පිරිස වැඩි සමාජයක මෙබඳු ක්‍රියා සම්බන්ධයෙන් ඇතිවන ප්‍රතිචාර ගැන සඳහන් කළ යුතුය. මා කරන්නේ මට හැකි අන්දමෙන් මගේ ශක්ති ප්‍රමාණයේ වූ තරමට ගැළපෙන වැඩ කොටසකි. අනෙක් අයද තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් වැඩ කොටසක් කරන්නේනම් අපේ සංවර්ධනීය අංශ කෙතරම් පරිපූර්ණ වන්නේද? කෙසේ වුවද සබරගමුවේ මෙවන් ප්‍රයත්නයන් අගය කරණ විශාල පිරිසක් සිටිනු දක්නට ලැබීම වාසනාවකි. එවන් අයගේ ප්‍රශංසා හා උපදෙස්ද, දිරිගැන්වීම්ද අගය කරමි. සබරගමු උදාන ග්‍රන්ථාවලියේ තවත් පොත් කීපයක් සකස් කිරීමට කටයුතු කර ඇත. සබරගමුවේ ජනප්‍රවාද, කුකුළු කෝරළයේ ජනප්‍රවාද, කැගලු විත්ති පොත් ඉදිරිකාලයේදී එළිදැක්වීමට බලා පොරොත්තුවෙමි.

බන්දුල ලියනගේ.

## ගරු ආණ්ඩුකාර තුමාගෙන්....

සබරගමු පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් ලෙසින් සබරගමු උදාන නාමින් පළ කෙරෙණ ග්‍රන්ථ මාලාවේ තවත් ග්‍රන්ථයක් එළි දක්වන මේ අවස්ථාවේ ඒ ගැන මගේ බලවත් ප්‍රසාදය පළකර සිටිමි.

රටක සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දී එහි සංස්කෘතික අංශයේද සංවර්ධනයක් අනිවාර්යයෙන් බලාපොරොත්තු විය යුතුය. සංස්කෘතික හා සදචාරාත්මක අපේක්ෂාවලින් තොරවූ සංවර්ධනීය සැළසුම් බලවත් ඌණතා වලින් යුක්ත විය හැක. රටක මෙන්ම ජාතියක අනන්‍යතාවය පැහැදිලි වන්නේ එම රටේ හා ජාතියේ සංස්කෘතික රටාවෙනි.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය ගැන කතා කරණ විට සබරගමු පළාතට ලැබෙන්නේ විශේෂ ස්ථානයකි. ශ්‍රී ලංකාවේ මානව වර්ගයාගේ ආරම්භය සිදුවූ ප්‍රදේශ සහිත මෙම පළාත පුරා විද්‍යාත්මක වටිනාකම අතින් විශේෂ වෙයි.

මෙම කරුණු විමසා බලන තවත් අංශයක් වශයෙන් '' සබරගමු කවියෝ '' ග්‍රන්ථය එළි දැක්වීම අතිශයින් වැදගත් වෙයි. සබරගමු උදාන පර්යේෂණ ග්‍රන්ථ ව්‍යාපෘතියේ තවත් අවස්ථාවන් අනාගතයේද දකින්නට ලැබේවා යනු මාගේ ප්‍රාර්ථනයයි.

සාලිය මැතිව්,
සබරගමු පළාතේ ආණ්ඩුකාරවර.

# ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන්. . . .

සබරගමු උදන ග්‍රන්ථ මාලාවේ අංක 6 සබරගමු කවියෝ නමින් මුද්‍රණය කරන්නට සම්බන්ධ වන්නට ලැබීම ගැන අතිශයින් සතුටුවෙමි.

මෙම ග්‍රන්ථ මාලාවේ අංක 1 සබරගමු ජනකවි නමින්ද, අංක 2 ඓතිහාසික රත්නපුර නමින් ද, අංක 3 රත්නපුර විහාර වංශය නමින්ද, අංක 4 මිණිපුර සිරි නමින්ද, අංක 5 කෑගල්ල විහාර වංශය නමින් ද පෙර වතාවලදී මුද්‍රණය කර ගැනීමට හැකිවිය. මින් මතුවටද ඒ ව්‍යාපෘතියේ තවත් ග්‍රන්ථ කීපයක් මුද්‍රණය කරවීමේ අපේක්ෂාවක් ඇත.

පොදුවේ සබරගමු පළාතේ ආගමික හා සංස්කෘතික අංශවල ප්‍රගතියට පසු ගිය කාලයේ මට විශාල වැඩ කොටසක් කළහැකි විය. නැටුම් කලාවේ හා සාහිත්‍යයේ දියුණුවට කළ වැඩ අතරේ මෙවැනි ග්‍රන්ථ ව්‍යාපෘතියක් සාර්ථකව කර ගැනීමට අතහිත දුන් සියලු දෙනාටම මගේ ස්තුතිය හිමිවෙයි.

කාලයේ කඩතුරාවෙන් වැසීගිය සබරගමුවේ යටගියාව මෙපමණකින් හෝ එළි දක්වන්නට ලැබීම ගැන කොයිකාගෙත් ප්‍රශංසාව එහි නියුතු වූ අයට ලැබිය යුතු බව මගේ විශ්වාසයයි.

ඒ. ඒ. විජේතුංග
සබරගමු පළාතේ
කර්මාන්ත, වෙළඳ, නිවාස, ග්‍රාම සංවර්ධන හා සංස්කෘතික අමාත්‍යය.

## පසසමි. . . . .

ඓතිහාසික වටිනාකමෙන් අනුරාධපුර පොළොන්නරු යුගයන් හා සමාන තත්වයක් විදහා පෙන්වන සබරගමුව ගැන ලියවුණු පොත පත ප්‍රමාණවත් නොවන බව පෙනේ. සබරගමු උදන, ව්‍යාපෘතිය මේ ඌණතාවය දුරුකිරීමට ගන්නේ නොමද වෙහෙසකි. මෙම ග්‍රන්ථාවලියේ සබරගමුවේ ජන කවි හා ඓතිහාසික රත්නපුර යන පොත් දෙක අතිශයින්ම ජනප්‍රිය විය.

උසස් අධ්‍යාපනයක් ලබන අයට මෙන්ම පොදුවේ සාහිත්‍ය හා ඉතිහාසය හදාරණ කොයි කාටත් මෙම ග්‍රන්ථ නොමද පිටුවහලක් වනු ඇත. ජනසංනිවේදන මාධ්‍යයක් වශයෙන් කවිය හඳුන්වා නොතිබුණ යුගයක හුදු විනෝදය තකා කවි කිව සබරගමුවේ පැරණි කවියෝ රාශියක් සිටි බව නොයෙකුත් වාර්තා වලින් පැහැදිලිවෙයි. එබඳු කවියන්ගේ කවි මුද්‍රණය කිරීමේ ක්‍රමයක් නොතිබුණෙන් එමෙන්ම එක්රැස් කිරීමේ ක්‍රමයක් නොතිබුණෙන් අප අතරින් ගිලිහී ගිය ප්‍රමාණයද සුළුපටු නොවේ. මෙම ප්‍රයත්නය එම ක්‍රියා දාමයේ සාර්ථක ප්‍රයත්නයකි.

ඩී. එම්. පී. බී. දසනායක
සබරගමු පළාත් සභා
ප්‍රධාන ලේකම්.

# අ ග ය ම් . . . . . .

සංස්කෘතික අංශයේ සංවර්ධනයක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් දියත් කරණ ලද සබරගමු උදාන ග්‍රන්ථාවලිය කාලීන අපේක්ෂාවන් ඉටු කිරීමක් ලෙසින් ද හඳුන්වා දිය හැකිය. මන්ද එමගින් සබරගමුවේ අතීත ස්වරූපය හාරා අවුස්සා ලබා දීමට සෑහෙන ප්‍රයත්නයක් ගනු ලබන හෙයිනි.

සිංහල සාහිත්‍යයේ මෙන්ම සිංහල කවි කලාවේ දියුණුවට දායක වූ බොහෝ කවියෝ සබරගමුවෙහි සිටි බව කිවයුතු නොවේ. එහෙත් මෙවැනි කවියන් ගැන විස්තර කාලයත් සමගම අප අතරින් නැතිවී ගියේ අපටත් නොදැනුවත්වය. මේ නිසා ඇතැම් ප්‍රදේශවල සිටි ප්‍රාදේශීය වශයෙන් දක්ෂ වූ කවියෝ ගැන අද තොරතුරු අසන්නට ලැබෙන්නේ ද කලාතුරකිනි. මෙවැනි අංශ ගැන තොරතුරු එකතු කිරීමක් සබරගමු පළාතේ නොවීය. සබරගමු උදාන ග්‍රන්ථ මාලාව ආරම්භ වූයේ මෙවැනි බලාපොරොත්තු රැසක් වෙනුවෙනි. ක්‍රමයෙන් පියවර තබමින් ඉදිරියට ගිය සබරගමු උදාන ගමන් මගෙහි නවත් පියවරක් ලෙස සබරගමු කවියෝ හඳුන්වා දිය හැක.

එස්. වර්ණකුලසූරිය.
ලේකම්,
කර්මාන්ත, වෙළඳ, නිවාස, ග්‍රාම සංවර්ධන
හා සංස්කෘතික අමාත්‍යාංශය.

# පටුන

පිටු අංකය


1. කාව්‍ය ශාස්ත්‍රය. ... .. 1
2. කරදන විදනෙලාගේ කඩීසර අප්පුහාමි මහතා. .. 6
3. කරදන ලේකම්ලාගේ අප්පුහාමි මහතා. ... .. 8
4. ඇලපාත මුදලි ( විමල ධම්ම ) තුමා. ... ... 9
5. තක්කාච්ච වෙදරාල මහතා. ... .. 12
6. දෙරපෙන් මුකවෙට්ටි අතපත්තු මුහන්දිරම් මහතා. .. 13
7. හල්කඳලියේ ලේකම් මහතා. ... .. 15
8. පණ්ඩිත වේරගම පුංචිබණ්ඩාර තුමා ... .. 23
9. අප්පු සිංඤො මහතා. ... .. 25
10. පුස්සැල්ලේ කපුරාල මහතා ... .. 27
11. කළුගොඩ රාල හා කැකිරිගොඩ රාල දෙපොල .. 30
12 නෑනෑත්කාර තෙරනමක් ... .. 31
13. එපිටවල දසනායක අප්පුහාමි විදනෙ මහත්මයා .. 32
14. දොඩම්පෙ ලොකු බණ්ඩා සහ උක්කු බණ්ඩා දෙපොල .. 33
15. නෑදුරණ හෙන්ද්‍රික් රාමචන්ද්‍ර අප්පුහාමි මහතා .. 37
16 දොඩම්පෙ බාලහාමි වෙද මහත්මයා ... .. 40
17. උක්කැත්තෙ කන්දෙ ලේකම් මහතා ... .. 41
18 කුට්ටි කන්දෙ මල්හාමි කවියා ... .. 42
19. කිරිඇල්ල ඒදණ්ඩමුල වත්තෙ ලොකුහාමි විදනෙ මහත්මයා .. 43
20. ඒදණ්ඩමුල වත්තේ මුදලිහාමි ලේකම මහත්මයා .. 45
21. කිරිඇල්ලේ හාමි ආරච්චි මහත්මයා ... .. 47
22. එපිටවල දසනායක මුදලිහාමි විදනෙ මහතා ... .. 48
23. දුම්බර තෝනන්චි කංකානම ... .. 49
24. රත්නපුරේ මෝයස් තිලකරත්න මුදලි තුමා ... .. 50
25. නවදුන් කෝරළේ කර්තේලිස් අප්පුහාමි ගම ආරච්චි මහතා .. 51
26. මාරපන අංගප්පුලියා ... .. 52
27. පුස්සල කන්ද ... .. 55
28. කරවිල කන්දෙ හාමුදුරුවෝ ... .. 56
29. නවදුන් කෝරළේ සිටි කවියෙක් .. .. 57
30. නවදුන් කෝරළේ වේරගම ආරච්චි මහතා ... .. 57
31. යටිපච්චෙ අතුකෝරළ අප්පුහාමි ... .. 58
32 නවදුන් කෝරළේ රන්මල්හාමි කිවිඳිය .. .. 60
33. කරදන ශ්‍රී සෝභිත මහා ස්ථවිර පාදයන් වහන්සේ .. 61
34. කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ .. 62
35 කොස්ගොඩ රාල සහ උඩුගහපිටියෙ රාල ... ... 64
36. කරදන කේ. එන්. ටී. ගුණදාස මහතා ... .. 66
37. බඹරබොටුවෙ සුධර්ම සෙනෙවිරත්න මහතා ... .. 80
38. අත්තරගම බණ්ඩාර රාජගුරු තුමාගේ ශිෂ්‍යයෙක් .. 83
39. කරදන කේ. එන්. ටී. චන්ද්‍රසේන මහතා ... .. 84
40. පූජ්‍ය පණ්ඩිත ඇරැපොල පේමරතන ස්වාමීන් වහන්සේ .. 86
41. පූජ්‍ය කොටාමුල්ලේ මේධංකර ස්වාමීන් වහන්සේ .. 87
42. තිඹිරිඋපාලේ අදිකාරම් තුමා .. .. 88
43. හංගමුවෙ ජයසිංහ මනම්පේරි මහතා ... .. 88
44. කරදන තිලක මහතා .. .. 89


( ඇ. පි. බා. )

පිටු අංකය


| | | |
|---|---|---|
| 45. | කන්දෙ විලවත්තේ ආනන්ද ඇහැළියගොඩ මහතා | 90 |
| 46. | මාරපන සිරිහාමි මහතා | 91 |
| 47. | ගලගම විලියම් අප්පුහාමි මහතා | 92 |
| 48. | ඔවිල්පේ හෙන්රි තෙන්නකෝන් මහතා | 93 |
| 49. | දෙමුවාවත ප්‍රේමාලෝක ස්වාමීන් වහන්සේ | 95 |
| 50. | දේවාලෙගොඩ නිමල් කුමාරවංශ මහතා | 97 |
| 51. | කරදන විද්‍යාරත්න මහතා | 99 |
| 52. | දිමියාගොඩැල්ලේ මුදියන්සේ මහතා | 100 |
| 53 | සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ 1 | 102 |
| 54. | සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ 2 | 108 |
| 55. | සාගර පලන්සූරිය මහත්මා | 114 |
| 56. | සබරගමුවේ කවියෝ කියන ලද කලම්මලේ කවි | 116 |
| 57. | සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ 3 | 118 |
| 58. | සබරගමු කවි | 119 |
| 59. | සබරගමු ජනප්‍රවාද ආශ්‍රිත කවි | 122 |

# කාව්‍ය ශාස්ත්‍රය.

කරදන කෝ. ඇන්. ටී. ගුණදස වියතාණන් විසිනි.

(මෙය මෙතුමා විසින් 1933. 12. 01. දින ලියන ලද්දකි.)

මනෝඥ වූ අර්ථ රසයෙන් යුක්ත වාක්‍ය තෙම ක්‍ාව්‍ය නම්වේ. ඒ වනාහී ශෘංගාර හාස්‍යාදී නව විධ රසයෙන් හා රති හාස්‍යාදී ස්ථායී භාවයෙන්ද යුක්තයි. මෙබඳු ලක්‍ෂණ වලින් යුක්ත වුවත් එය කවීන් විසින්ම කරණ ලද්දක් බව කිවයුතු නොවේ. හිතානුශාසනයට උපකාරි වූයේ කාව්‍යය ශාස්ත්‍රයයි. මනෝහර වූ අර්ථ රසයෙන් යුත් වාක්‍ය සංඛ්‍යාත කාව්‍යය අභිවෘද්ධි මාර්ගයෙහි ගමන් කිරීමට අනුශාසකයෙක් නුයි කාව්‍ය ශාස්ත්‍ර නම්වේ.

කාව්‍යයක් හඳුනා ගැනීමේ ලක්‍ෂණය කාව්‍ය ශරීරය වේ. පණ්ඩිත ගෝචර වූ අර්ථ රසයෙන් නුසුන් වූ පද්‍යාවලී සංඛ්‍යාත කාව්‍ය ශරීරයත් අලංකාර වත් කාව්‍ය ලක්‍ෂණයෝ වෙත්. කාව්‍ය ශරීරය වනාහී අලංකාරයන් ගෙන්ම ශෝභන වේ. යම් තැනෙක්හි කාව්‍ය ශාස්ත්‍රය වේනම් අලංකාර ශාස්ත්‍රයද එහිම විද්‍යමානය. ඒ නිසා කාව්‍ය ශරීරය අලංකාරය යන දෙක කාව්‍ය ලක්‍ෂණය බව දතයුතුයි. පද්‍ය කාව්‍ය, ගද්‍ය කාව්‍යය, මිශ්‍ර කාව්‍යය කියා කාව්‍යයේ භේදත්‍රයක් වේ.

අක්‍ෂර මාත්‍රාදිය අනුව නියම කරණ ලද යම්කිසි පාද ගණනකින් යුක්ත කොට බඳිනා ලද්දේ පද්‍ය කාව්‍යයයි. හේ බොහෝ කොට සතර පාදයකින් යුක්තයි. හේ වනාහී වෘත්තය ජාතියයි. ද්වීප්‍රකාරවෙයි. ඔවුන් පිළිබඳ ප්‍රභේද වෘත්තරත්නාකරාදියෙන් දත හැකි වේ. තවද මුක්තක - කුලක - කෝෂ - සංඛ්‍යාත යයි. පද්‍ය විස්තර චතුෂ්ක- යෙක්ද වේ. අන්‍ය පද්‍යයක සම්බන්ධයෙන් තොරවූ එක් පද්‍යයක්ම ආත්ම කොට ඇති නිබන්ධය මුක්තක නම්වේ. පද්‍ය පඤ්චකයක් හෝ ඊට වැඩි ගණනක් ආත්ම කොට ඇත්තේ කුලක නම්. අන්‍යෝන්‍ය නිරපේක්‍ෂත්වය ඇති පද්‍ය සමූහය "කෝෂ" නම්. වෙන් වෙන්ව පරිසමාප්තිය ඇති අර්ථවත්වූ පද්‍යයන්ගෙන් කථාවසානය වේනම් ඒ සංඛ්‍යාත නම්වේ. තවද සමහර ආචාර්ය වරයෝ පද්‍ය එකකින් - දෙකකින් තුනකින් - සතරකින් - පහකින් සහ හයකින් කථාවසානය ඇති කාව්‍යයක් පිළිවෙලින් මුක්තක - යුග්මක - විශේෂක - කලාප - කුලක සහ කරභාටක නමින් දක්වන මෙකී ප්‍රභේදයෝ පද්‍යාත්මක මහා කාව්‍යයන්හී දක්නට ලැබෙත්. ඉෂ්ට ප්‍රාර්ථනාව නමස්- කාරය හෝ වස්තු නිර්දේශය ආදියෙහි දක්වීමෙන් වර්ග වශයෙන් බඳනා ලද්දේ මහා කාව්‍යයයි. හේ වනාහි ඓතිහාසිය කාරණයක් හෝ සත්‍ය වූ කතා ප්‍රවෘත්තියක් මූලාශ්‍රය කොට ඇත්තේය. ධර්ම - අර්ථ - කාම - මොක්‍ෂ - සංඛ්‍යාත චතුර්වර්ග සම්පත් ඵලයෙන් යුක්තය. කාර්ය කුශල වූ ශ්‍රෙෂ්ටයෙක් නායක කොට ඇත්තේය. නගර - සාගර - ශෛල - ඍතු - චන්ද්‍රොදය - සූර්යෝදය - උද්‍යාණ සලිල ක්‍රීඩා ආදී වර්ණයන්ගෙන් සමලංකෘතය. රස භාවයන්ගෙන් අභිව්‍යාප්ත වූ අතිශයින් විස්තීර්ණ වූ සර්ගයන්ගෙන්ද - කනට මිහිරි වූ වෘත්තයන්ගෙන්ද සර්ගවසානෙහි භින්න වෘත්ත ඇති පද්‍යයන්ගෙන්ද යුක්ත වූ මේ මහා කාව්‍ය පණ්ඩිතයන්ගේ චිත්තාරාධනයෙහි අතිශයින් සමර්ථවේමය. මේ මහා කාව්‍යයෙහි යුක්ත විය යුතු වූ යම්කිසි අංගයක් අඩුවූ පමණකින් කාව්‍යය දූෂ්‍ය නොවේ. වර්ණිතවූ පදර්ථ සම්පත්තියෙන් අනූනව රචනා මාධූර්යයෙන් යුක්තවී නම් එයම පණ්ඩිත ජනමනෝනන්දය කෙරේ.

මාත්‍රා වශයෙන් හෝ අක්‍ෂර වශයෙන් හෝ නියම කරණ ලද පාද සංඛ්‍යාවක් නැති අර්ථවත් පද සමූහය ගද්‍ය නම්වේ. ශ්ලෝක, ගාථා, කවි, ගී ආදියට නොනැගූ

කාව්‍යය යන අදහසයි. හේ වනාහී අඛ්‍යායිකා, කථා යයි ප්‍රභේදද්වයක් ඇත්තේ වෙ. කාව්‍ය නායකයා විසින්ම කියන ලද ගද්‍ය කාව්‍ය අඛ්‍යායිකා නම් කාව්‍ය නායකයා විසින් හෝ අනෙකෙකු විසින් හෝ කියන ලද්දී කතා නම්.

නාටකාදී දෘෂ්‍ය කාව්‍යයෝ පද්‍ය වූද ගද්‍ය වූද උභය කාව්‍යාත්මක හෙයින් මිශ්‍ර කාව්‍ය යයි කියනු ලැබෙත්. ගද්‍ය පද්‍ය දෙකින් කරණ ලද කිසියම් කාව්‍යයක් "චම්පූ" කියාද කියනු ලැබෙ. චම්පූ කාව්‍යයෙහි වනාහී ගද්‍ය පද්‍ය යන මොවුන් ගේම බාහුල්‍යය විය යුතුයි. ස්වල්ප ස්ථානයෙක්හි ලැබෙන පද්‍යයන් සඳහා ආඛ්‍යායිකාවක් හෝ චම්පූ සංඛ්‍යාවෙහි නොවැටේ. පද්‍ය ගද්‍ය මිශ්‍ර සංඛ්‍යාත භේදත්‍රයකින් යුක්ත වූ මේ කාව්‍ය ශාස්ත්‍රය සංස්කෘත - ප්‍රාකෘත - අපභ්‍රංශ - මිශ්‍ර යයි භාෂා විෂයෙහි සිව් වැදෑරුම් කොට පණ්ඩිතයෝ කීහ. මහර්ෂීන් විසින් ප්‍රකෘති ප්‍රත්‍යය විභාෂාදීයෙන් සංස්කරණය කරණ ලද දෛවී භාෂාව සංස්කෘත නම් වූවාය ශූරසේන - ගෞඩ - ලාටාදී ඒ ඒ දේශයන්හි ව්‍යවහාර ප්‍රාප්ත සියලුම දේශීය භාෂාවෝ ප්‍රාකෘත නම් වෙත්. නාටකාදී කාව්‍යයන්හි ගැනෙන ගොපලු සැඩොලු ආදීන්ගේ බස් අපභ්‍රංශ නමැයි ද නොයෙක් භාෂාවන් හා මිශ්‍රවූ නාටකාදිය මිශ්‍ර නමැයිද ව්‍යවහාර ප්‍රාප්ත විය මෙයින් මහා කාව්‍යාදිය සංස්කෘත භාෂායෙන්ද ස්කන්ධකාදී ඡන්දසින් බඳිනා ලද කාව්‍ය ප්‍රාකෘත භාෂාවෙන්ද අසාරාදී ඡන්දසින් බඳනා ලද කාව්‍ය අපභ්‍රංශ භාෂාවෙන්ද නාටකාදිය මිශ්‍ර භාෂාවෙන්ද — ආඛ්‍යායිකා කථා සංඛ්‍යාත ගද්‍ය කාව්‍යය සියලුම භාෂා වලින්ද කරණ ලද බව සැලකිය යුතුය.

නැවත මෙකී කාව්‍ය දෘශ්‍ය කාව්‍ය ශ්‍රව්‍ය කාව්‍ය යයි ද්වි ප්‍රභේද වෙ. ලාස්‍ය — ජලිතශල්‍යාදිය දර්ශකය කටයුතු බැවින් දෘශ්‍ය කාව්‍ය නමවේ. ශෘංගාර රසාත්මික වූ ස්ත්‍රීන්ගේ නෘත්‍යය ලාස්‍ය නම්. පුරුෂයින්ගේ නෘත්‍යය ජලිත නම්. කම්මුලෙහි අත තැබීම පෙරටු කොට ඇති නෘත්‍යය ශල්‍ය නම්. මේ සියල්ල දර්ශනය කටයුතු බැවින් දෘශ්‍ය කාව්‍ය නම්. මෙයින් අන්‍ය වූ මුක්තක තුලකාදී කාව්‍ය බන්ධකයෝ ශ්‍රවණ මාත්‍රයට විෂය කොට ඇති බැවින්, ශ්‍රව්‍ය කාව්‍යනමින් ප්‍රචලිත වූහ. මේ දක්වන ලද්දේ කාව්‍යය ශාස්ත්‍රය සම්බන්ධ විස්තරයෙන් එකදේශ මාත්‍රයෙහි ලේඛණ බාහුල්‍යය භීතිය වැඩි විස්තරයෙහි ඉඩ නොදෙයි.

යම්කිසි භාෂාවක්හුගේ පෞඪත්වයෙන් නොකිළිටි වූ චිර ජීවනයක් ගද්‍ය පද්‍යාත්මක කවි ප්‍රයෝගයන්ගේ බාහුල්‍යයෙන්ම සිදුවන බව ප්‍රාඥයන් විසින් කියන ලදී. වෛයාකාරයන් විසින් ප්‍රකෘති ප්‍රත්‍යය විභාෂාදියෙන් සම්පාදිත වූද කයින් අතිරික්ත වූද වාග් ප්‍රසාද ශක්තියෙන්ම ලෝකයාත්‍රාව (ලෝක ව්‍යවහාරය) පවතී. ශබ්ද නැමැති ආලෝකය මුළු ලොව පැතිරගෙන නොබබලා නම් සකල භුවනත්‍රයම අන්ධකාරවේ. ඒ ඒ භාෂා පිළිබඳ ශිෂ්‍යයන් විසින් අනුශිෂ්‍ය වූ ශබ්ද ශක්ති ස්වභාව හේතුවෙන් පූර්ව කාලීන රාජාදීන්ගේ යසස් නැමැති ප්‍රතිබිම්බය කාව්‍ය ශාස්ත්‍ර නමැති ආදර්ශ තලයට පැමිණ ඔවුන්ගේ අභාවයෙන් පසුත් අවිනෂ්ටව පවතී. මේ කාව්‍යය ශාස්ත්‍රයෙහි ප්‍රයෝජනයයි.

කාව්‍ය ශාස්ත්‍රය සම්බන්ධ ඉහත සඳහන් කරුණු සාමාන්‍යයෙන් සංස්කෘතාදී භාෂාණුගත ක්‍රමය වූවත් එය සිංහල භාෂාවට ආරෝපණය කර ගැනීම ද වරද නොවේ. සිංහල භාෂාව පිළිබඳ ව්‍යාකරණ නිෂ්පාදනය ද පාලි සංස්කෘතාදී ව්‍යාකරණ අනුගමනය කිරීමෙන් කරණ ලද හෙයිනි. භාෂාවන්ගෙන් මූල භාෂාව සංස්කෘත හෝ පාලි හෝ කොයික වෙතත් ව්‍යාකරණ නිෂ්පාදනය අනෙක් කරුණකි. එහෙයින් සිංහල භාෂාවද කාව්‍ය ශාස්ත්‍රය නිසාම පෝෂිත වූ බව සැළකිය යුතුය.

සිංහලද්වීපිය වාසීන් අතර ප්‍රචලිත වූ මේ භාෂාව චනාභී ව්‍යාකරණ ඡන්දෙලංකාරාදී භාෂාංගයන්ගෙන් අනූන වූ රාජ පූජිත භාෂාවක් වූවාය. ඒ, මේ සිංහල භාෂාවෙහි තත්වාවබෝධය පිණිස මාතෘ භාෂා වූ පාළි සංස්කෘත භාෂාද් ග්‍රහණය බෙහෙවින් උපකාරී වෙයි. එසේම මෙහි අගය දන්නාහුද පාළි සංස්කෘතාදී භාෂාද්ග්‍රහණය කෙළෙලමය. පුරාණ කාලයෙහි ඒ භාෂා විෂයෙහි හසල බුද්ධිමත් පණ්ඩිතවරෙණ්‍යයෝ සිංහල භාෂාව පිළිබඳවද පටුකර බුද්ධිමත් වූවාහු තද්භාෂාවෙන් නානාප්‍රකාර ග්‍රන්ථයන් නිපදවූහ. එසේම තම තමන්ගේ අදහස් පවසාලීමෙන් හිත මිත්‍රාදීන්ට යවන ලද ලේඛණද ඒ ඒ ප්‍රස්ථාවයන්හිදී ඇසූ දුටු විශ්මයජනක කරුණු ද පිඩු කිරීමෙන් සිංහල භාෂාවෙන් පද්‍ය රචනාකර තිබෙන බව පෙනේ. කෙළි සෙල්ලම් ආදිය පිණිස ද යම්කිසි කරුණක් ඇසූ දුටු විගසම සිංහල භාෂාවෙන් කාව්‍යය බන්ධනය කර තිබේ.

කල් යත් යත් පුරාණ කිවිවරයන්ගේ අභාවය සිද්ධ වූවාක් මෙන්ම සිංහල භාෂාවේ තත්ත්වය පහත් කොට සලකන පරදේශීය චාරිත්‍රාවනත සිංහල තරුණයන්ගේ සංඛ්‍යාව සීඝ්‍රාකාරයෙන් වර්ධනය වන්නට විය. එයින්ම සිංහල භාෂාවේ උද්දීප්තියද ක්‍රමයෙන් පසුබසින්නට විය. නමුත් අද තත්ත්වය ගැන සළකා බලන විට එතරම් භයවීමට කරුණක් නොපෙනේ. ජාතික සිරිත් හා භාෂාව සම්බන්ධ තද හැඟීමක් සිංහලයන් තුළ හටගෙන තිබීම සතුටුදයක කරුණකි. භාෂාව දියුණු කිරීමේ කතාවෙන් ද උද්‍යොගයද බලවත්ය. අද සිංහල භාෂාව ප්‍රමාණවත් දියුණුවකින් පවතින බව සාමාන්‍ය කල්පනාවයි. නමුත් එහි සත්‍යය එය නොවේ. පරිහානි මාර්ගයෙහි වූ සීඝ්‍ර ගමන් වේගය තරමක් අඩුවී "කාල්පාවටු" වූවක් මෙන් තිබෙන බවනම් ඇත්තකි. මනා සංවිධාන නැමති සැපදයක අන්තෘයානාදීයෙන් ගමන් විඩා දුරුකර දියුණු මාර්ගයට හරවා ඒ ඔස්සේ ගමන් කරවීමට මේ සුදුසු කාලයයි. ව්‍යක්ත ප්‍රබල පණ්ඩිත ස්ථවිර ස්වාමී පාදයන් වහන්සේ සිංහල භාෂාවේ තත්වය මොනවට දන්නාහු පරිහානි පක්ෂයෙහි වූ ගමනට බාධාකොට මේ අවස්ථාවට පත්කළහ. ඒ නිසා මේ භාෂාවේ සාරාංශය උන් වහන්සේ දැන සිටිත් යයි පවසාලීම අතිශයෝක්තියක් නොවේමය. මෙහිදී ගෘහස්ථ පක්ෂය ගැන සඳහන් නොකිරීම අකෘතඥකමකැයි නොසිතිය යුතුය. සිංහල භාෂාවේ ගුරුත්වය සලකා දියුණුව අපේක්ෂාවෙන් කටයුතු කරණ ගෘහස්ථ පඩිවරයන්ද වෙත්. ප්‍රාචීන භාෂා සම්බන්ධ ගෘහස්ථයාගේ පණ්ඩිතකම ප්‍රව්‍රජිත පක්ෂය නිසාම ඇති වූවකි. එය එසේ නොවේ යයි කීමට සමර්ථයෙක් මේ මිහිපිට ඇතැයි අපි නොසිතමු. ඒ නිසා ප්‍රව්‍රජිත පක්ෂය මතක් කිරීමෙන් ගෘහස්ථ පඩිවරයෝද ඊට ගැනෙත්. බුදුනට කරණ ලද වැඳුම් පිදුම් ත්‍රිවිධ රත්නයටම කරණ ලද්දහු වෙත්. ධර්ම රත්නය හා සංඝ රත්නය බුදුන් නිසාම ඇතිවූ හෙයිනි. ගෘහස්ථයන් ගැන මෙහිදී කිවයුතු කරුණක්ද ඇත. එහෙත් එය ඔවුන්ගේ ගෞරවය පිණිස වූවක් නොවේ. සිංහල භාෂාවට යම් යම් විටෙක නින්ද අපහාස කළෝත්, සතුරුකම් කළෝත් ගිහියෝම වෙත්. එසේම සිංහල භාෂාව දැනීමේ දුර්වලත්වය නිසා ඔහු තුමූද යම් යම් අවස්ථාවල නින්ද අපහාසයන්ට භාජන වූවෝය. එහෙයින් ස්වකීය ජන්ම භාෂාව දැන ගැනීමත් එහි සංවර්ධනයට ක්‍රියා කිරීමත් සිංහලද්වීපික හැම දෙනාටම උරුම වූ කාර්යයන් වෙත්. සිංහල භාෂාව දුප්පත්ද පොහොසත්ද යන්න පසුගිය කාලයේ ලොකු වාදයකට භාජනය වූ බව කව්රුත් දනිති. ඒ කාලයේ නොයෙක් පත්තිවල උගත්තු මේ ගැන විවිධ මත පළ කළහ. භාෂාව දියුණු කිරීමේ නානාප්‍රකාර යෝජනාද ඉදිරිපත් කළහ. වචන නිපදවා හැරීමේ කාරක සභාවක්ද පත් වූවාය. නමුත් මේවා කොපමණ දුරට ක්‍රියාවෙහි යොදන ලද්දහු දැයි කියන්නට අපි නොදනිමු. ශබ්ද නිෂ්පාදන කාරක සභාවේ වැඩ නම් තැපැල් මගින් කරණ නිසා මේතාක් දැනගන්නට නොලැබුණ බව සිතිය හැක. උණුසුම් වාද විවාද කිරීමටත් යෝජනා ඉදිරිපත් කිරීමටත් සිංහලයා

ගජ සමනෙකි. යම් කරුණක් මතු වූ විට චාතුර්ද්වීපික මහා මෙඝයක් මෙන් ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලය කරා හැම දෙසින්ම ලියුම් වර්ෂා වසින්නට පටන් ගනිත් ඒවායින් ඉදිරිපත්වන යෝජනාවන්ගෙන්ද සංඛ්‍යාව අති විශාලය. නමුත් බළලාගේ කරේ මිණි ගෙඩිය බඳින්නට කෙනෙකු නැතිවීමෙන් මහලු මීයාගේ යෝජනාව නිෂ්ප්‍රභා වූවාක් මෙන් ඒවා ක්‍රියාවෙහි යොදවන්නට කෙනෙකු නැතිවීමෙන් සියල්ලම යටපත් වෙයි. ලැබෙන එකම ප්‍රතිඵලය නම් කාරණය පෙර තිබුනාටත් වඩා අවුල් වියවුල් වීමය. විසුරුවා හරින ලද නූල්බෝලය මෙනි. ඒ එසේ වෙතත් සිංහල භාෂාවේ දියුණුව ගැන කරණ ලද යෝජනා එසේ නොවෙතැයි සිතමු.

ග්‍රන්ථ කරණය වනාහී භාෂාවක දියුණුවට මූලික හේතුව බව අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. පෙර සිටි සම්භාවනීය පඬිවරයන් විසින් ලියන ලද ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ සමූහය නිසා මේ දක්වාම සිංහල භාෂාව අවිනෂ්ටව රැකුණ බව සැළකිය යුතුයි. හුදෙක් ඔහු තුමූ භාෂාවේ දියුණුව තකාම ග්‍රන්ථ නිෂ්පාදනය කළෝය පඬිවරයන් වශයෙන් ප්‍රසිද්ධවීම හෝ වෙනයම් ධන ලාභයක් හෝ අපේක්‍ෂා නොකළේය. නමුත් අපේ වර්තමාන පඬිවරුන්ගේ සිරිත මීට ඉඳුරාම වෙනස්ය. ග්‍රන්ථ කරණයෙහි නිර්මාණ ශක්තියෙන් මොහුතුමූ ඉතාම දිළින්දෝය. පෙර පඬිවරුන්ට දෙස් කියමින් ඔවුන් විසින් කරණ ලද පොත් වලට සන්න, ගැටපද විවරණ වර්ණනා ලියමින් එයින් ධන රැස්කරමින් භාෂාව දියුණු කරන්නට දඟලති. අධ්‍යාපන මණ්ඩලය මඟින් ඒ ඒ විභාග වලට නියම කරණ පොත් වලට පමණක් විවරණ ලියති. අලගියවන්න මුකවෙටි තුමා බොහෝ පහත් කොට සලකමින් එතුමාගේ පොත් වලට මුලු ශක්තිය යොදු විවරණ ලියති. මෙය කෙතරම් මදිකමක්ද? මේ කාලය සන්න ගැටපද සමයයි කියයුතු තරමට ඒවා සුලබව තිබෙත්. එක පොතට තුන් හතර දෙනා විවරණ වර්ණනා ලියති. සන්න ගැටපද සමයට අසුවී පිඩාවින්ද පොත් අතුරින් ලෝවැඩ සඟරාව, සුභාෂිතය යන පොත් දෙක ප්‍රධාන වෙත්. සන්න ගැටපද විවරණ භාෂාවේ දියුණුවට හේතු නොවෙතැයි අපි නොකියමු. නමුත් ඒ ගැනම ඇලී ගැලී නොසිට නිර්මාණ ශක්තියෙන් අමුතු ග්‍රන්ථ නිෂ්පාදනයෙහිද සතුටුවිය යුතුය.

ප්‍රාචීන භාෂෝපකාර සමිතියෙන් පණ්ඩිත නාමය ලබන ඇතැම් පඬිවරුද සන්න ගැටපද වලටම ප්‍රිය කෙරෙති. අමුතු ග්‍රන්ථ කිරීමෙහි මැළිවෙත්. එය අභාග්‍යයකි. පෙරසිට පණ්ඩිත වරෙණ්‍යයෝ මෙකල සමහරුන්ගේ කල්පනාවල හැටියට වරද්ද වරද්ද හෝ අනුන්ගෙන් කොපි කරගෙන හෝ මේ පෞරාණික ග්‍රන්ථාවලිය සම්පූර්ණ නොකළෝ නම් අද අපේ දිළිඳුකම කෙතරම්දැයි සැලකුව මැනවි. ඒ නිසා නවීන පඬිවරයන්ගේ පාණ්ඩිත්‍යය නවීන ග්‍රන්ථ නිෂ්පාදනයෙහිම යොදවනු ලැබේවා. එය භාෂෝන්නතිය පතන්නවුන්ගේ ප්‍රසාදයට කරුණකි. එසේ නැතිව සිදත් සඟරාවට දෙස් කීමෙන්වත් පෙර පඬිවරුන්ගේ ඇද පලුදු සෙවීමෙන් වත් භාෂාවේ දියුණුවට වැඩක් සිදු නොවේ. පෞරාණික පොත්පත් ශුද්ධ කර ප්‍රචාරයට පැමිණවීම ප්‍රයෝජනවත් නවකථා ලිවීම අන්‍ය භාෂා වලින් ලියා තිබෙන නොයෙක් ශිල්ප ශාස්ත්‍ර සම්බන්ධ පොත් ස්වභාෂාවට පරිවර්තනය කිරීම යනාදියද භාෂාවේ දියුණුවට මෙ පඬිවරුන්ගෙන් ලැබිය යුතු උපකාරයෝ වෙත්. සම්පූර්ණ ශබ්ද කෝෂයක්ද ඇතිවිය යුතුය. මේ පාඩුව රාජකීය ආසියාතික සමිතිය මඟින් පිටකරන්නට යන සිංහල මහා ශබ්ද කෝෂයෙන් ළඟදීම නැතිවේයයි සිතිය හැක.

තල මලක් පිපීම අලංකාර පින්කමකි. භයංකාර මිනී මැරුමක් ලොකු කෝලාහලයක් දුම්රිය අනතුරක් යනාදී විශේෂ කරුණු කවිකොළ කාරයාගේ භාග්‍යය

පිණිස වෙත්. මෙතරම් මෙබඳු ප්‍රස්ථාවයන්හිදී ඒ සම්බන්ධ කවි ගොතා දහස් ගණන් පත්‍රිකා මුද්‍රණය කොට විකුණා දිවි රැක ගනියි. භාෂාව දියුණු කිරීමේ අදහසක් ඔහු තුළ සිහිනෙනුදු නැත. නමුත් භාෂාවට ඔහුගෙන් යහපතක් සිදුවේයයි සොයා බැලිය යුතුය. හෙතෙම භාෂාව කිළිටි කරන්නෙකි යන්න බොහෝ දෙනාගේ කල්පනාවයි ඔහුගෙන් භාෂාව සම්බන්ධ වැදගත් මෙහෙයක් සිදුවන බව සමහරුන්ගේ මතයයි. ඒ කෙසේ වෙතත් සමහර පඬිවරුන්ට වඩා හෙතෙම නිර්මාණ ශක්තියෙන් යුක්ත වූවෙකැයි කිවහැක. භාෂාව ආණ්ඩු කිරීමේ නීති රීති වූ ව්‍යාකරණය අතින් කෙසේ වුවත් ඔහුගේ සමහර උපමා අලංකාරාදිය අතිශයින් චිත්තාකර්ශණීය කෙරෙති. ඒ නිසා පද්‍යයෝද කාව්‍ය රසයෙන් අනූන වෙත්. එහෙයින් භාෂාව අතින් සුළු ප්‍රයෝජනයක් වත් මොහුගෙන් නොලැබේයයි නොසිතිය හැක.

පෙර සිටි පණ්ඩිත නොයෙක් දෙනා විසින් යම් යම් අවස්ථාවන්හිදී යම් යම් දේ ගැන කරණ ලද පද්‍ය බන්ධන බොහොමයක් ප්‍රවෘත්ති පත්‍ර - කවි - සඟරා ආදිය මගින් ප්‍රසිද්ධවී ඇතත් තවත් බොහෝ කාව්‍යයෝ අලුයට තිබෙන ගිනි පුපුරු මෙන් මෙතාක් අප්‍රකටව පවතිත්. විරිදු කීමෙහිදී සිංහලයෝ දක්ෂව සිටියෝය. බොහෝ හාසෝත්පාදක විරිදු දක්නට ලැබෙත්. ඔවුන්ගේ ගොයම් කවි - නෙළුම් කවි - පැල්කවි ආදියද ජනකතාද සැබවින්ම ප්‍රියංකරයි. මේවා සොයා ප්‍රසිද්ධ කිරීම පශ්චිම ජනතාවට කරණ බලවත් අනුග්‍රහයකි. පසුගිය කාලයේ ශාස්ත්‍රීය සමිති සමාගම් මගින් මේ ව්‍යාපාරය ගැනද නොයෙකුත් යෝජනා කථාබස් ඇතිවූ බව පත්‍රාවලෝකනය කරන්නෝ දනිතියි සිතමු. ඒවායේ මනා ප්‍රතිපල මෙතාක් දක්නට නොලැබීම ඛේදයට කරුණකි.

ඒ කාලයේ ඇතිවූ උද්ඝෝෂණය නිසා මෙම පන්තියේ කවි සිව්පද සෙවීමෙහි අප සිතද යොමුවිය. මගේ උත්සාහය වූයේ ප්‍රචාරයට නොපැමිණි කාව්‍ය ප්‍රබන්ධාදිය ද රැස් කිරීමයි.

# කරදන විදනෙලාගේ කඩිසර අප්පුහාමි මහතා

රත්නපුර කරදන ප්‍රදේශයේ විසූ දක්ෂ කවියෙක් බව සඳහන් වන කරදන විදනෙලාගේ කඩිසර අප්පුහාමි මහතා හිටිවනම කවි කීමෙහි දක්ෂයෙකු වූ බව කියවේ.

කවිකොළ සම්ප්‍රදායට නැකම් කියන ආකාරයේ විස්තර වාර්තා රචකයෙකු වූ මොහු විසින් රචනා කරන ලදැයි සලකන යටිපව් කන්දේ ඇතු ගලෙන් පෙරලුණු සිද්ධිය ඔහුගේ රචනා ශක්තිය විදහා පෙන්වන කදිම නිර්මාණයකි.

යටිපව් කන්දේ ඇතු පෙරලුණ සිද්ධිය පිළිබඳ පද්‍ය රචනයට මුල්වී ඇති ප්‍රවෘත්තිය ද රසවත් එකකි. මීට අවුරුදු එකසිය දොළහකට පමණ පෙර ක්‍රි. ව. 1881 දී මෙම සිද්ධිය සිදුවී ඇත.

යටිපව්වේ හින්මීරිය කන්දේ ගල්තලාව දිගේ පැමිණි ඇතෙක් දුටු ඒ ආසන්නයේ කිතුල් ගසක මල කපමින් සිටි අප්පුහාමි නැමැත්තෙකු මේ අරුම පුදුම දෙය දැක " මෙන්න බොලේ අලියෙක් ඇවිදිල්ලා - වරෙල්ලා බලපල්ලා " යනුවෙන් මහත් හඬින් කෑ ගැසුවේය.

මේ ශබ්දයෙන් බියට පත් ඇතා එම හඬ ආවෙ කොයි දෙසකින්ද යන්න විපරම් කර බැලීමට පස්සෙන් පස්සට යත්ම හදිසියේ පය ලිස්සා ගොස් බඹ හැත්තෑපහක් පමණ ගැඹුරැති ගල පල්ලට වැටී මැරී ඇත. මෙම ගල පල්ලෙන් වැටී මියගිය ඇතාගේ පුවත කරදන විදනෙලාගේ කඩිසර අප්පුහාමි මහතා විසින් පද්‍යයට නගා ඇත.

එම පද්‍ය රචනයේ එන කවි කීපයක් මෙසේය.

සතවරුසේ එක්වා දහසේ අටසිය තුන මෙලෙසින් පසුවෙච් වී
බිනර මසේ ජලවක සැලසේ ඉරිද දවසේ ඉර පායව් වී
එම විගසේ ඇතු ගලට බැසේ මගයන විලසේ ගොස් වැරදිව් වී
අස සතොසේ යටිපව් පියසේ කන්දකි මෙලෙසේ ඇතු පෙරළිච් වී

කරුම කෙරූ මේ වග දන ගන්නට සකිව් මෙයින් සැහවී ගොල්ලේ
අරුම පුදුමවල් ඇහුවද මෙහෙමට ගජකුව වැටුණා ගල පල්ලේ
බොරුම නොවෙති මේ ඇතාව වැටුණේ කරපු දෙයක් සේ එක එල්ලේ
උරුම වෙන්ට තිබුණද මේ ඉරණම යටිපව් කන්දේ ගල පල්ලේ

කෙරිච්ච තොරතුරු ගජකුට මේ ගැන අසළ සිටිය ළමයෙක් දුටුවා
ඇහිච්ච හැටියෙම ශසක් කඩන හඬ කන්දේ ගල මුදුනේ බැලුවා
පලච්ච ගලඋඩ වලක් තිබීලා එතකොට මරු ළඟටම ආවා
වැටිච්ච තැන සිට මැරිච්ච ඉඩමට හැත්ත පහයි බඹ මැනබැලුවා

ඇතු පෙරළිච්චි ගලෙන් වැටිච්චි දන පොඩි වෙච්චි රිහි යන් ඩා
ගස් ඉදිරිච්චි ගල් පෙරළිච්චි පාර හැදිච්චි පවතින් ඩා
ගල උඩ වෙච්චි මරු ළං වෙච්චි අද බැරි වෙච්චි ගැලවෙන් ඩා
කිරි අප්පොච්චි ඇතු අද පොඩිවී ගලෙන් වැටිච්චි පණ යන් ඩා

මන්ද මන්ද මේ සුරතල් ඇත් රජ ඇවිදින් ගල පල්ලම පැත්තේ
දූන්ද දූන්ද මේ ඇතා වැටුණ සැටි කල්පනාව සිහියට ගත්තේ
කන්ද කන්ද සොඳ යටිපව් පියසේ කන්දේ දී පව් පල දුන්නේ
කුන්ද ගහිති ගත කුඳන් ගහිති ගත තාලෙට ගල පල්ලට වැටුණේ

හපොයි හැබෑටම ඇතෙක් වැටුණු සැටි මෙහෙම දෙයක් ඇහුවද මිතුරේ
ටිකක් කියමි මම අසනුය ඒ වග ගස් ගල් පොඩි උණී වැටුණු සැරේ
හෙනක් ලෙසින් ගම හැමටම ඇසුණයි යටිපව් කන්දේ බස්න හිරේ
රටක් වටින මේ ඇතාව මැරුණේ ගලපල්ලේ ගස් දෙක අතරේ

ඇතෙක් නොවෙයි ඇත් රජෙක් තමයි මොහු රාජකුලේ ඇවිදින්ට ඇතී
දතුත් ලොකුයි දත් දිගත් නැතියි සකි ඇණුමට කැඩිලා වෙන්ට ඇතී
ගලක් නොවෙයි මරු ඇවිත් හිටියමයි පූරුවෙ පව් පල දෙන්ට ඇතී
බොරුත් නොවෙයි මේ සැබෑවමයි සකි ඇතු සළකුණු මේ ලෙසට වෙතී

# කරදන ලේකම්ලාගේ අප්පුහාමි මහතා.

රත්නපුර කරදන බදුවත්තේ නමැති ගම ප්‍රදේශයේ පදිංචිව සිටි කරදන ලේකම්ලාගේ අප්පුහාමි නමැති කවියා වඩාත් ප්‍රසිද්ධව සිටියේ හාස්‍යොත්පාදක කවිකිම පිළිබඳවය. නොයෙකුත් අවස්ථාවල දී ඔහු විසින් කියන ලද එබඳු කවි බොහෝ ඇති බව දැනගන්නට ලැබුණි.

මේ ප්‍රදේශයේ විසූ කඩිසර අප්පුහාමි නමැති කවියෙකුට කරදන ලේකම්ලාගේ අප්පුහාමි මහතා ලියා යවා ඇති කවියක් මෙසේය.

කඩිසර අයියාම තමා කාටත් හොඳ ගුණ කදිම
වෙඩි සැරමෙන් බෙහෙත් දෙන්නෙ අපිත් ගසෙන් වැටිච්චාම
බඩදරු අහනුන්ට තමා උන්දැගෙ අඩු පිහිට විම
කඩිසර අයියාට අනේ හතර වරම දෙවි පිහිටම

කඩිසර අප්පුහාමි නමැති කවියා වෘත්තියෙන් කැඩුම් බිඳුම් පිළිබඳ වෙදහාමරයෙකි. එමෙන්ම ඔහුගේ භාර්යාව වින්නඹු මාතාවක් වූවාය. ඔවුන් දෙපොල ගැන අප්පුහාමි මහතා ඉහත සඳහන් කවිය කියා ඇත.

තවත් වරෙක කරදන නාගහ වෙල බෝමළුව ගැන කියන ලද කවියක් මෙසේය.

අයම් පළල උස ගල් බැම්මක් බැඳ ඊ පිට බෝමළු පසකි මෙසේ
වටින් මලුව වට පිරිසිදු කර ලඟ සිරිමා බෝතුර පිහිටි ලෙසේ
උඩින් සෙවිලි කර සතරැස් උළු ගෙයි දර පෙනෙයි සේසත විලසේ
බලන් මීතුරෙ බෝ මළුවක ලස්සන නාගහ වෙල කරදන පියසේ

# ඇලපාත මුදලි (විමලධම්ම) තුමා.

රත්නපුර ඇලපාත කුරුප්පු මුදලි පරම්පරාවෙන් පැවත එන ඇලපාත මුදලි ප්‍රසිද්ධ කවියෙක්ව සිටි බව ඔහු පිළිබඳව සඳහන්වන විස්තර වල ඇතුළත්වේ.

ඇලපාත මුදලි පසු කාලයේ ඇලපාත විමලධම්ම නමින් පැවිදිව සිටි බව සඳහන් වෙයි. කුඩා අවධියේදී අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමාගෙන් සහ මහකිරි නැළියේ සාමිගෙන් ශබ්ද ශාස්ත්‍ර අක්ෂර ඉගෙන ගත් මොහු පසු කාලයේදී කවියෙකු වශයෙන් ප්‍රසිද්ධියක් ලැබුවෙකි.

දළ වශයෙන් නුවර යුගයේ රාජාධිරාජසිංහ රජ සමයේ ජීවත්වූ මොහු රත්නපුර සංබපාල රජමහ විහාරාධිපතිව සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක වශයෙන්ද ශ්‍රීපාදස්ථානාධිපති වශයෙන්ද වැඩසිටි පූජ්‍ය කරතොට ධර්මාරාම හිමියන් ලඟ පැවිදිව අනතුරුව පැල්මඩුල්ලේ හා කරන්ගොඩ පොත්ගුල් විහාරස්ථානවල වැඩවසා ඇත.

ඉංග්‍රීසි පාලකයන් අතර විසූ, ජනප්‍රිය පුද්ගලයෙක් ලෙස ඉතිහාසගතව ඇති සර් ජෝන් ඩොයිල් සමඟ කිට්ටු සම්බන්ධයක් පැවැත්වූ ඇලපාත විමලධම්ම හිමි නැවතත් සිවුරු හැර "රටේ මහත්මයා" පදවියෙන් පුදනු ලැබූ බව කියවේ.

ඇලපාත මුදලි පිළිබඳව අද වඩාත් ප්‍රකටව ඇති ගජමන් නෝනාගේ පුවත සම්බන්ධ වන්නේ පැවිදිවීමට කලින් සිටි ඇලපාත මුදලි සමඟද සිවුරු හැරීමෙන් රටේ මහත්මයෙකු වූ ඇලපාත මුදලි සමඟද යන්න පැහැදිලිව සඳහන් කළ නොහැකිය.

කෙසේ වුවද සිංහලයන් හා සිංහල සංස්කෘතිය ගැන හොඳ අවබෝධයකින් සිටි ජෝන් ඩොයිල් ප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේලා කීප නමක් සිවුරු හරවා ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ නොයෙකුත් නිළතල වලට පත්කරගත් බව ජනප්‍රවාදයේ එයි.

ඇතමෙකුගේ අදහස සිවුරු හැරීමෙන් අනතුරුව ආලපාත මුදලි නමින් ඔහු ප්‍රසිද්ධව සිටි බවය.

කෙසේ වුවද නවදුන් කෝරළයේ රටේ මහත්මයා පදවියද දැරූ ඔහු කවිකලාව කෙරෙහිද අවධානය යොමු කරණ ලදී.

ඇලපාත මුදලි වඩාත් ප්‍රසිද්ධ වූයේ මෙහි කළින් සඳහන් පරිදි "ගජමන් නෝනා" ගේ සම්බන්ධතාවය මතය. ගජමන්නෝනා යනු රුහුණේ මාතර දෙනිපිටිය ගමේ විසූ දක්ෂ කිවිදියක වූවාය. ඇය හා ඇලපාත මුදලි අතර, ප්‍රේම සම්බන්ධයක් තිබූ බවත් ඒ නිසා ඔවුන් අතර ලිපි හුවමාරු වූ බවත් කියවේ.

ඇලපාත මුදලි විසින් ගජමන්නෝනාට ලියා යවන ලද කවියක් මෙසේය.

මදමත් දිගු සොඩින් දස අත සිඹින් නිය
ලැමපත් පියයුරෙන් හස පොළඹ වන් නිය
සිරිමත් එගජමන් නෝනා ඇතින් නිය
තෙරහන් රඹ උයන සිඳ බිඳ හෙළන් නිය

මෙයට ගජමන් නෝනා යවා ඇති පිළිතුරු මෙසේය.

නාම රුක පසිඳු ඇලපාතින් පොරණ
පේම දළු ලමින් නැණ අතුවිය දියුණ
සෝම ගුණ දහම් පල ඉදෙමින් නැමුණ
කාම නළ වැදී සහ මුලයෙන් බිඳුණ

වැස තදින් ගලන සිව ඕගය දැන
විසරමින් පිරිගිය නොරඳ මැන
නව දහම බැම්ම බැදි වෙර ඇල පාත
බිඳ ගොසින් වැටුණි කාරිය තොට ඇත

ඇලපාත මුදලි විසින් ගජමන් නෝනාට ලියා යවන ලද තව කවියක්

චන්ද සූරියා වැනි එළදගෙ මුහුණ
ඉන්ද්‍ර නිල දෙක වැනි ළැමද එන තන
අන්ද කාරයට ඇවිලු පාත මෙන
කින්ද ත්‍ති යහන නිදියන්නෝ නෝන

එයට එවූ පිළිතුරු කවිය

බැන්ද මගේ හිමි පරලොව ගිය බැවින
නින්ද අපට පුරුදුව තනියම යහන
වින්ද රති සැපත මට මතක නැති උණ
කින්ද තමුසේට විමසන්ඩ කාරණ

ඇලපාත මුදලි ගජමන් නෝනාට යවන ලද තව කවියක්

පාලා රඹ ජයකොඩි බදිති සැම දෙ නෝ
සීලා චාර සේකම් පාන අවගු නෝ
බාලා අහනුන්ගෙ තව් කපන තොරප නෝ
ගාලා කොතන මුවහත් කරමද නෝ නෝ

මෙයට ගජමන් නෝනා කියන ලද කවිය

පසන් නැණ ගුණැති හිමි සදිනි සසොබ නෝ
සපන් පිරිමින්ගෙ ඔද බිඳින ජල බ නෝ
වසන් කර තිබෙන මගෙ පළිඟු ගල් ව නෝ
නිකන් ගා දිනන්නට නොදෙමි තොරප නෝ

ඇලපාත මුදලි දිනක් දිග ගමනක් ගිය අතර, කිසියම පිට නිවසක නවාතැන් ගත්තේය. තමා සිටි නිවසෙන් නික්ම යන්නට පෙර පුස්කොළ කැබැල්ලක කවියක් ලියා තබා නික්ම ගියේය. එම කවිය මෙසේය.

වැලි එක්වන් දුහුලින් සමගීව උප  න
සුළු තොක්වන් ගමනින් පැන පැන යනෙ  න
රකුසෙක් වන් සත ගත වැද රුහිරු බො  න
බැලි මැක්කන් සන්ද නිදි නැත යහ  න

ඇලපාත මුදලි කරතොට ධර්මාරාම හිමියන්ගේ ආචාර්යත්වයෙන් විමලධම්ම නමින් පැවිදිව සිටි බව කලින්ද සඳහන් කර ඇත. මෙම ස්වාමීන් වහන්සේ බොරු ආරංචියක් අනුව ඇලපාත මුදලිට කියන ලද කවියක් මෙසේය.

දියට සකා තුම පදයක් අයට  දෙකා
නොවැද නිකා ගෙන දෙන සහ සමග  සුකා
නොම සලකා කෙළියට වත් සිතන  එකා
තණ නොම කා බිම වැද බත් කන ගොනෙ  කා

මෙයට ඇලපාත මුදලිද කවියක් කියා ඇත.

කබුදුන් සරණ ගියෙනම අසිපත  රැගෙන
සිරසුන් කෙරෙම කිව මට දෙවියෙකු  විසින
මරබුන් ඔබැර දිය බප නිල වෙත  නයන
සිහිනෙන් විතර නොගනිම් අනිකෙකු  සරණ

# නක්කාවිට වෙදරාළ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළයට අයත් නක්කාවිට ප්‍රදේශයේ සිටි දක්‍ෂ කවියෙකි. නක්කාවිට වෙදරාළ යනුවෙන් හඳුන්වන්නේ.

දිනක් නක්කාවිට වෙදරාළ දූරණියගල පුරාණ දේවාලයට ගොස් එහිදී දේවාලයේ බස්නායක නිළමේ බැහැ දැක්කේය. මේ වනවිට නක්කාවිට වෙදරාළ ගැන බස්නායක නිළමේ අසා තිබුණෙන් බොහොම හොඳයි වෙදරාළ " දේවාලෙ පැත්තෙ ඇවිදල බලල එහෙම කවියක් දෙකක් කිව්ව නං‍ම යනුවෙන් පවසා ඇත.

ඉන් පසුව දේවාලය ඇතුලට ගිය නක්කාවිට වෙදරාළ එහි අඹා තිබූ රූප කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළේය.

එහි එක් තැනක දරුවකු වඩාගත් ආකාරයට අඹා තිබූ කාන්තා රූපයක්ද එම කාන්තා රූපයට අත උරුක්කරගෙන ඉන්නා ආකාරයේ පුරුෂ රූපයක්ද එම පුරුෂ රූපයට වැඳගෙන ඉන්නා අන්දම දක්වන වයසක කාන්තාවකගේ රූපයක්ද විය. නක්කාවිට වෙදරාළ මේ රූප කීපය බලා එම රූප වලින් දක්වන අදහස කවියට නගා ගත්තේ මෙසේය.

පුරුෂයා ස්ත්‍රියට කියන ආකාරයේ කවිය

කොයියත් අයත් සිටිනා මේ සබාව ට
ඇයි දූන් තමා නොකියා ආවේ මෙම ට
මයියත් බලන සොර සැමියකු ඇද්ද ති ට
දෙයියන් වඩින හින්ද නොමරමි අද ට

වයසක කාන්තාව පුරුෂයාට කියන ආකාරයේ කවිය

ඇන්ද දිව සළුව පළඳාපු කුණු ඉ හේ
වින්ද රස පහස ගත නොරිදවා ඇ ගේ
බැන්ද විරිදු කොඩියකි මදන රති දූ ගේ
වැන්ද මෙන්න නොමරා අරුව දුව ම ගේ

# දෙරපනේ මුකවෙටි අතපත්තු මුහන්දිරම්.

රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න කෝරළයේ දෙරපනේ නමැති ගමෙහි මුහන්දිරම් පෙළපතකින් පැවත ආ කවියෙකි. සංඛපාල රජමහ විහාරයෙහි වැඩ විසූ පූජ්‍ය කරතොට ධර්මාරාම ස්වාමීන් වහන්සේගෙන් ශිල්ප ඉගෙනගත් මුකවෙටි අතපත්තු වඩාත් දක්ෂතාවයක් දැක්වූයේ කාව්‍ය කරණයටය.

සිංහල සංදේශ සාහිත්‍යාවලියට එක්වූ එමෙන්ම එම සම්ප්‍රදයට රචිත අන්තිම සංදේශ කවිය ලෙස හැඳින්විය හැකි කැටකිරිළි සංදේශය ලියා ඇත්තේ මුකවෙටි අතපත්තු මුහන්දිරම්ය.

කැටකිරිල්ලක දූත කාර්යයෙහි යොදවා සමන් සුරිඳුගේ අවසරය මත සමන්කුළු පව්වේ සිට කදිරපුර දක්වා ගොස් මහසෙන් දෙවි රදුන්ට පිළිගන්වන හස්නක කතාව කැටකිරිළි සංදේශයේ ඇතුළත් වෙයි.

සිංහල සංදේශ ශෛලියට අනුව රචනා කරණ ලද්දක් වුවද කැටකිරිළි සංදේශය පැරණි සංදේශ පොත් තරම් ශාස්ත්‍රීය නිර්මාණයක් නොවේ.

සමන්තකූට පර්වත මුදුනෙහි සිට කතරගම දක්වා මාර්ග විස්තරය මතරම් අන්දමින් විස්තර කිරීමට කැටකිරිළි සංදේශ කතුවරයා පෙළඹී ඇති බව පෙනේ.

කැටකිරිළි සංදේශයේ එන පහත සඳහන් කවි වලට අනුව ඒවා පැරණි සංදේශවල එන කවිවලට සමාන හෝ අසමාන වන අන්දම සොයා බැලීම කළ හැක.

සැරද සුලකල සඳ - නැණයෙන් අරිවු ඔද ලන
තොප දුටු පමණින් මසිත් - පිනවී කොදසේ සඳ දුටු

කැට කිරිල්ලියට ආශිර්වාද කරන්නේ එසේය. මෙය සැළලිහිණි සංදේශයේ එන ආශිර්වාද කවිය හා සසඳ බලන්න.

සැරද සුලකල කුරු මියුරු තෙපලෙන් රදනා
රජකුල රහස මැතිණිය - සියණිනි සැළලිහිණි සඳ

කැටකිරිළි සංදේශයේ එන තවත් කවි කීපයක් මෙසේය.

සුනිල් මිණි පබඳ කොඳ? වෙරළු මුතු වැ ල
ලකල් පුබුදු පියුමෙක නොව රිවි තැවු ල
විපුල් සයුර නැගි නිල් බුබුලෙක නිම ල
මෙකල් තොපට සරි මිතුරෙක් මෙදිය තු ල

සිරි සැපතක් දෙනු සුගතිඳු කුළුණ කො ට
නොව වෙනසක් වැඩ පිළිගෙන නිල් මිණ ට
සඳ මඩලක් වැනි සියපද දෙන බව ට
හැම එකලෙස් විය මුළු දියත එළි කො ට

පැසී තිබෙන විලිකුන් කද   ලිනා   රඟ
එසී ගෙන්ද බිතුවෙන විලස   රැ   රඟ
පැසී කරල් කෙත් සරුසාර   එල   අඟ
තිසී තැනින් තැන ගම් පටුනු   ලඟ   ලඟ

පිලා මදන ඉඟ ගත හැකි   මීටින්   තෝ
වීලා සුවඳ වරලස නිල   දෙමින්   තෝ
නිලා දුහුල් ඇද පියයුරු   වසන්   තෝ
බලා යන්න මෙළඳුන් සිරියා   පත්   තෝ

තරිඳු වගේ තැන තැන මිණි රැස්   කිර   ණ
සුරිඳු ලගේ බබලන දිලි මිණි   පහ   ණ
සබඳ තගේ නෙත් පල ලදුව   සපැමි   ණ
කිරිදි ගඟේ මදකල් සිට අරු   ගිම   න

රැගෙන අතින් වන බිඳ තබමින්   වැල්ලේ
ගෙන රළමින් මුතුහර ගලවා   බෙල්ලේ
පෑදමළ කතුන් ගිම් දුරලන සුලකල්   ලේ
දකුව තොසින් එළඳුන් රුසිරි   ලොල්ලේ

කවළු නොව පැවති පිළිවෙල අඩු   නොවන
කවුළු සිඳු කිමද? පෙර කිඳුරන් බසි   න
කවුළු රස ඇදින පිසු පිසුවෙති උණු   න
කවුළු රණ පියස ඔහු මුණුබුරු වස   න

මිදී අනගි සිරි දිග සෙත උමා   ය   ස
ලදී මිණි කිරුළු තෙරුවන් නමා   හි   ස
රැදී කිව සයුර නියඟින් තෙමා   බැ   ස
යෙදී කැට කිරිලි අස්නක් අමා   ලෙ   ස

විසේ සවන් කිරි සයුරෙහි නළ   පැති   ර
ඇසේ සවන් පුරමින් හේ සා   නිත   ර
තොසේ වඩන හය රළ පැනයන   එපු   ර
එසේ බලව! තගෙ තුණු සිත   තියුණු   කර

# හල්කඳලියේ ලේකම්.

රත්නපුර නිවිතිගල හල්කඳලිය නැමැති ගමෙහිදී ක්‍රි. ව. 1863 දී පමණ උපත ලැබූ මොහු සබරගමුවේ සුප්‍රකට කවියෙකු ලෙසින් හඳුන්වා දිය හැකිය.

ලාබාල අවදියේ සිටම ඉගෙනීමට මහත් උනන්දුවක් දැක්වූ මොහු අධ්‍යාපනය ලබාගත්තේ පනාවැන්නේ විසූ මැටිගම්පත දුක්ගන්නා නිලමේ පඬිතුමා වෙතින් බව කියවේ. එහිදී ඔහු කාව්‍ය ශාස්ත්‍රය හා වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ දැනීමක් ලබා ඇත.

මෙහි ඉගෙනීමෙ යෙදී සිටින අවස්ථාවේ සිදුවූ රසවත් සිද්ධියක් සඳහන් කළයුතුව ඇත. එක් දිනක් මැටිගම්පත දුක්ගන්නා නිලමේ තුමා කිසියම් කාරණයක් පිළිබඳව කවි හදමින් සිට එක් කවියක් අසම්පූර්ණව තිබියදීම ආහාර ගැනීම සඳහා ගෙතුළට ගොස් ඇත. මේ අවස්ථාවේ දී එතනට පැමිණි හල්කඳලියේ ලේකම් අසම්පූර්ණ කවිය සහිත තල්පත ගෙන කියවා පද අඩුකවියෙහි එම අඩුව සම්පූර්ණ කර තබා පසෙකට වී සැඟවී බලාසිටියේය.

අහර කිස නිමවා යළිත් කවි කීපය සම්පූර්ණ කිරීමට පැමිණි දුක්ගන්නා රාළ අසම්පූර්ණ කවිය සම්පූර්ණ කර තිබෙනු දුටුවේය. වහාම හල්කඳලියේ ලේකම්ට කතාකොට " දූත් නුඹ මගේ අඩු පාඩු පිරිමැසීමට සිටින්නෙදැයි '' අසා ඇත. මෙයට හල්කඳලියේ ලේකම් කිසිත් නොකියා සිටියද දුක්ගන්නා නිළමේ ඔහුට නුගත්වා හැර ඇත.

මේ සිද්ධියෙන් පසු එතනින් ඉවත් වූ හල්කඳලියේ ලේකම් දුක්ගන්නා නිළමේ වෙතින් ඉවත්ව මාතර ප්‍රදේශයට ගොස් ඇත.

මාතර ගොඩපිටිය නම් ගමෙහි විසූ කාව්‍ය ශාස්ත්‍රයේ අගතැන් ගෙන පැමිණ සිටි සුප්‍රසිද්ධ පඬිවර කිරම ධම්මානන්ද මහා ස්ථවිරයන් වහන්සේ වෙත පැමිණ ඉගනීමෙහි නියළුණේය. ඉන්පසුව හල්කඳලියේ ලේකම්ට අවුරුදු විස්සක් පමණ වූ තැන්හි නැවතත් තමාගේ ගම් ප්‍රදේශය වූ නිවිතිගල පැමිණ ඇත. ඉද්දමල්ගොඩ දිසාපතිතුමාගේ ලේකම් වශයෙන් එවකට රාජකාරි කටයුතු කරණ ලද්දේ හල්කඳලියේ ලේකම්ගේ පියතුමාය. හල්කඳලියේ ලේකම්ගේ පියතුමාගෙන් පසු හල්කඳලියේ ලේකම් ඉද්දමල්ගොඩ දිසාපති තුමා ළඟ සේවයට පත්විය.

පියාගේ ගෞරව නාමය ආරක්ෂා කරගනිමින් රාජකාරි කටයුතු කරගෙණ ගිය හල්කඳලියේ ලේකම් ඉඩ ලැබුණු සෑම අවස්ථාවකදීම කාව්‍ය කරණයේ නියැළුණේය.

මේ අතර දිනක් හල්කඳලියේ ලේකම් ස්තුත්‍යාශිර්වාද පත්‍රයක් ප්‍රබන්ධ කොට තම ප්‍රථම ගුරුවරයා වූ දුක්ගන්නා නිළමෙ තුමාට පිළිගන්වා ඇත. මෙය කියවා බැලූ දුක්ගන්නා නිළමේ සියළුම අමනාපකම් ඉවත් කොට හල්කඳලියේ ලේකම්ට තෑගි බෝග පවා දුන් බව ජනප්‍රවාදවල එයි.

**හල්කඳලියේ ලේකම් රචිත යයි සලකන පොත් : —**

( 1 ) සුදර්ශනාලංකාරය
( එක්නැලිගොඩ ඉද්දමල්ගොඩ යන උභය පාක්ෂික දිසාපති වරුන්ගේ කීර්තිය සහ පැල්මඩුලු විහාර වර්ණනාව අන්තර් ගත කොට කරණ ලද්දකි.)

(2) මහසෝන් සමයම
මහසෝනාගේ උත්පත්තිය ආශ්‍රිතව ගොතන ලද මෙම ග්‍රන්ථය භූත විද්‍යාවේ නිරත වූවන්ට ඉතා ප්‍රයෝජනවත් එකකි. භූත විද්‍යාව පිළිබඳව කතුවරයාට හොඳ අවබෝධයක් තිබූ බව මෙයින් පෙනේ.

(3) පෙරකදෝරු හටනය

(4) බාරි කතාව

(5) විරිත් වැකිය

කිරිඇල්ලේ නෑදුන් විහාරාධිපතිව වැඩ විසූ කුරුවිට හාමුදුරුවන්ට මොහු විසින් ලියා යවන ලද කවි පන්තියක් මෙසේය.

සතත ගොවිඳු තිසුලන දිනිඳු බර නෙති
තලත උළිඳු සිරිකත සුරිඳු ගණ පති
සමත සුගුණ දූරු කුරුවිට සමිඳු නිති
සැපත සියළු හිමිකර මෙමුරු රැක දෙති

සතර මහ එල්ල කර පෙන්වා නිබ ද
මිහිර දිය රැල්ල වැනි දෙන දහම් ක ද
වෙහෙර කිරිඇල්ල අධිපති මෙයති සො ද
නොහැර දෙපතුල්ල වැඳ මෙපද දෙමි බැ ද

තැන තැන සමිඳුන්ගෙ යසගොස පවතින් ට
යන එන කිවිඳු දහලති පද බැඳ දෙන් ට
දූනගෙන ඔවුන් විතරණ ගුණ මැන දෙන් ට
වෙන තැන කව්රු වෙති සමිඳුට සරිලන් ට

දෙසු මුනිඳු ලෙස මිහ සහනට එව ර
සුපිරි සිදු කරණ සංවර සිල් සත ර
රැකි පසිඳු කුරුවිට යති මෙත් සයු ර
පාද නමිඳු නිති බැතියෙන් කර අද ර

වරක් හල්කඳලියේ ලේකම්ගේ සහෝදරියක් රෝගාතුරවී ඇත. මේ අවස්ථාවේ ඔහු ඈයට කියන ලද කවි දෙකක් මෙසේය.

ඉද්දර පැදුරක් එළාන
සද්ද ඇතිව කෙඳිරි ගාන
වැද්ද නොහැර අහර පාන
සිද්ද උමන් නගින මාන

ගොවිතැන් බත් පාලු උණා
වතුපිටි හරකට ඇරුණා
කන්ට නැතිව අඩුව උනා
කොලු රැල ඇඩුමට හැරුණා

හල්කඳලියේ ලේකම්කුමා වරක් පාතකඩ ලේකම් මහතා සමග ශ්‍රී පාද වන්දනාවේ යෙදී ඇත. මෙසේ ගොස් එන අතරමගදී මල්වල කඩයට ගොඩ වැදී ඇත.

ශ්‍රී පාද වන්දනා වාරයේ දී කඩ හිමියන් වැඩි මිලට බඩු අලෙවි කිරීම සිරිතය. මෙම කඩයේදී ද හල්කදලියේ ලේකම් හා පාතකඩ ලේකම්ගෙන් කඩ හිමියා වැඩි මුදලක් අයකර ඇත. මේ නිසා මේ දෙපක්ෂය අතර විවාදයක් ඇති විය. අන්තිමේදී කඩ හිමියා පාතකඩ ලේකම්ට පහරදී ඇත. තම මිත්‍රයා ඉදිරිපිට සිදුවූ අගෞරවය ගැන පාතකඩ ලේකම්ගේ සිතේ සංවේගයක් ඇති විය. දෙදෙනා රත්නපුර පැමිණි පසු පාතකඩ ලේකම් හල්කදලියේ ලේකම්ට බුලත් හුරුල්ලක් දී "සිදුවූ දේ ගැන කවි එහෙම නම් ලියන්න එපා" යැයි පැවසුවේය. දෙදෙනා ඉන්පසු වෙන්ව නිවෙස්වලට යන ලදී.

හල්කදලියේ ලේකම්ට පොරොන්දුව ඉටුකර සිටීමට නොහැකි විය. ඔහු ගෙදර ගිය සැණින් කඩදසි සොයාගෙන ශ්‍රී පාද ගමනේදී සිදුවූ සිද්ධිය කවියට නැගුවේය.

ගොඩේ පාතකඩ ලේකම් මැති පවර  
කඩේකට ගොසින් මල්වල කළ දබ ර  
කුඩේ අතින් අල්ලාගෙන මිට නැ ර  
කඩේ සිටි සැවොම ඇණපිය තුන හත ර

හෙල්වල සැවොම පින්කම් කෙරුමක දිච්චා  
එල්වල නැති සරුපකට මැත කම් කිච්චා  
මල්වල කඩේ ඉඳ දබරක් ඉප දෙච්චා  
තල්පල නෙළන ලෙස ටොකු ඇණලා එච්චා

හල්කදලියේ ලේකම් පිළිබඳව තවත් රසවත් සිදුවීමක් මෙසේය.

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇතැම් විහාරස්ථානවල ධර්මශාලා හතර දෙසින් වෙන වෙනම පිරිස් සඳහා වෙන්කර සෑදීම සිරිතක් විය. ධර්මශාලාවේ මැද ධර්මාශනය විය. රදල පෙළන්තියේ අය සඳහා එක් අංශයක් විය. මෙහි උණ ලී ආදිය සිටුවා වටේට ලණු ඇද කොටුවක් සෑදීම සිරිතක් විය. ධර්ම දේශනය ඇසීමට එන මැණිකේවරු හා කුමාරිහාමිවරු බණ අසන ලද්දේ මෙම කොටුවේ සිටගෙනය.

ධර්ම දේශනයක් පවත්වන දිනක හල්කදලියේ ලේකම්ද එක් විහාරස්ථානයකට ගියේය. ධර්ම ශාලාව ඇතුලට යනවිට මැණිකේවරුන් සඳහා වෙන්කල කොටසේ සිටිය එක් මැණිකේ කෙනෙකුගේ පාදය කොටුවෙන් එළියට දමාගෙන සිටියදී හල්කදලියේ ලේකම්ට එය පෑගී ඇත. ඒ විගසම එම මැණිකේ "කව්ද මේ කණා" යනුවෙන් සැර වෙමින් බැණ වැදී ඇත. ඇගේ ආඩම්බරකම ගැන නොසතුටට පත් හල්කදලියේ ලේකම් ඒ අවස්ථාවේම මේ කවිය කියා තිබේ.

මග යන කොටුව බැදිලා සෙනෙහසය ඉන  
ළඟ කර මන දෙමින් ඇකයේ තබා ගෙන  
උගෙ කොට අත්පහර ළපෙමින් ඉවසු කත  
මගෙ පය හැපුණු වරදට තිට උනිද කැත

හල්කදලියේ ලේකම්ට අයත් උදැල්ලක් නිවිතිගල කපුරාළ කෙනෙකුට දී තිබුණි. මෙම උදැල්ල වෙරගම බණ්ඩාර මහත්මාට දෙන ලෙස දන්වා හල්කදලියේ ලේකම් ලියා යැවූ කවියක් මෙසේය.

මත් වෙත කුළුණු කපු තිළමෙ සේම ලැම
දැන් මට එන්ට අපහසුබව කියා ළම
බණ්ඩාර මැති සඳුට අපලත් වෙර ගම
දෙන්නට හොඳේ ඔහි ඇති මගෙ උදළු හම

හල්කඳලියේ ලේකම් වරක් තම යහළු කාන්තාවකට ලියා ඇති කවි කිහිපයක් මෙසේය.

ඔබිනා පුංචිහාමී උඹ සහ යාන
කරණා කෙළි සිනා සිහිවී රැ පාන
දකිනා නැති නිසා උඹෙ සුරතල් මූණ
වසිනා කඳුළු වතුරෙන් ගැලුවා හේන

ඉඳගෙන යහන සිඹ මුව කමල තර කොට
සොඳ නුඹ කරණ සුරතල් සිහිවෙන කලට
විඳගෙන ඉන්ට බැරි නුඹ නොදැක දෙනෙ තට
වැඳගෙන සිටිමි මම නුඹ සිටිනා දෙසට

සඳ ලප විලස වෙන්කොට එක පණසෙ වැස
විඳ රස පහස සුරතල් බස්දී සතොස
ළඳ නුඹ නොදැක පසුවන මේ එක දවස
සොඳ ලෙස සිතමි අවුරුදු සිය දස දහස

වෛද්‍යවරයෙක් ලෙසද ප්‍රසිද්ධව සිටි හල්කඳලියේ ලේකම් ''චන්ද්‍ර කල්කය'' නැමැති බෙහෙත ගැන ලියා ඇති කවි දෙකක් මෙසේය.

රුදුරු නාගර පෙරුන්කායෙන් උපුල් වැල්මී වී ලංගා
සිහුරු පියලිද සඳුන් නිකදළු රත්ත යව නියක ලිංගා
සොඳුරු තිප්පිලි තිපල් කොතඹුරු ඉවද එන්සල් තිවංගා
ඇඳුරු දෙව්දුරු එවැල් තිබබොටු මුල්ද මෙ හැම සමංගා

උදක් සම්බා කළ මෙමුසු සැම අනා තෙලින් තිලායා
මදක් තම්බා කඩ පිමේක ලා ගවා එම තෙල් හෙලායා
සොඳක් එම්බා වෙදහමීයෙන් දෙවෙනිවර අඹර ලායා
සඳක් බිම්බා සදිසි මෙ ඔසු තබා බඳුනෙක තුලායා

හල්කඳලියේ ලේකම් ලියූ පුදසුන් අලංකාරයෙන් ගත් තවත් කවි කිහිපයක් මෙසේය.

සේවිය මෙමැතිඳු ගුණයෙන් තරි දූ
රුවිය සුනිමල පෙරමෙත් රති දූ
බෝවිය දෙන තිළිනෙන් සුර දුමි දූ
නැවිය කගදල දරණින් විරි දූ

දිගුබිත ඇඳියස උර හිස සිනි දූ
දිගුපති තුම එක් නැලිගොඩ පයි දූ
දිගුපති පෙරඋර හරගුරු උවී දූ
දිගුකල් රකදෙති සැපතින් නොම දූ

නික්මෙන කඳුළු නෙතේ පිය පිය නමුදු කොපුල අතේ
දුක්විය අනල සිතේ සපුරා සිටිමින් දැක දෙනෙ තේ
උක්දුනු ගෙන සුරතේ මල්සැර යුදයට නළ සුර තේ
සක්යුරු මිහිමි වෙතේ මෙපවත් කිය සකිසඳ පිනැ තේ

නිළතුරඟුට නංගා බිඟුදිය බැඳලිය සැවුරු ගෙනේ
නළ විය සත නංගා යුදයට මදරද විය උර උරනේ
සිටිමට සිත රංගා සම්දුට දවසැර දළ ලොබි නේ
හළෙළකිම මෙඅනංගා වදයට පින්වත් හිමි සඳි නේ

රන්දන උර සිරිකල් එක්නැළිගොඩ අපහිමි දිගු කල්
කැන්දන කරපු අවුල් බාලෙසිටමා වැනි කත සුර කල්
නින්දන කර වෙනකල් වැයෙනුව පවසා නිසරු තෙ පුල්
කැන්දන වර සකිකල් හිමි සඳ අදවන් වැද දෙප තුල්

නුනු පවන් ලැබ වින පයෝධර දේනුරුවන් තිස රූ
වීනු සුරති ගඟ නුන මදන යුරු සාමිතුමන් අතු රූ
තේනු මිසක් දයමාන සිතක් නොව කීවදනීන් සතු රූ
ගැනු කවිද මසමාන මිහිමි සඳ දිනු යුදෙන් සම රූ

හල්කඳලියේ ලේකම වස්කවි ලිවීමෙහි ද සමතෙකු විය. තමා ඉතා ආදරයෙන් වවාගත් බුලත් වැලක් හොරෙන් කැපුවෙකුට කී වස් කවියක් මෙසේය.

වඩා සෙනේ ඇතිකළ මගෙ බුලත් වැලේ
කඩා කාපි දලුවත් සමඟ එහි කොලේ
කුඩා කතරඟම දෙවියනි නිවීනි ගලේ
කඩාලන් බෙල්ල උගේ ඔබ තෙදිනු දූලේ

දිනක් හල්කඳලියේ ලේකම ගමනක් යන අතරතුර මුද්දුව ප්‍රදේශයේ දී බ්‍රාහ්මණයෙක් හමුවිය. ඔහු සමඟ සතුටු සාමිචියේ යෙදී සිටියදී එම බ්‍රාහ්මණයා ලේකම්ගෙන් ගමට යන පාර විචාලේය. එවිට හල්කඳලියේ ලේකම පහත සදහන් කවිය කියා ඇත.

නෙත් නැති දොලකි අතපය නැති බොකු පතකි
නොසිඳුන ගැඹුරවර පොට ගම කඩ ඉම කී
කුඩ මසු කැටිය ඉන්මුල අදිනා ගම කී
ශාස්ත්‍ර පරුවතේ එතනම තිබෙයි සකී

මේ කවිය කියන ලද්දේ මෙසේ නොව වෙනත් ආකාරයකට බවට තවත් අයගේ අදහසක් ඇත. ඒ අය පවසන්නේ කවිය මෙවන් බවය.

ඇස්නැති දොලකි අතපය නැති බොකු වල කී
නොයිදුන බතකි වරපොට අදිනා ගම කී
කුඩමසු කැටිය සහ පාතින් යන ගම කී
ශාස්ත්‍ර පරුවතේ එතනම ඔන්න ස කී

ඇස්නැති දොල — කණාදොල
අතපය නැති බොකුපත — කොටාමුල්ල
නොසිදුන බත — අමුවල
වරපොට අදිනාගම — හංගොමුව
කුඩමිසු කැටිය — මගුරුගොඩ
පාතින් යන ගම — පාතකඩ
ශාස්ත්‍ර පර්වතය — නිවිතිගල

"පෙරකදෝරු හටන" ග්‍රන්ථයෙන් උපුටාගත් කවි දෙකක් මෙසේය.

රුහුණු පිහිටි මායා යන තෙ සිංහල
රුහුණු සපරගමු පෙදෙසෙහි කලින් කල
දරුණු විලස කෙරෙණා නෙක කෝල හල
අසනු මැනවි මෙහි දුන් කියමි පිළි වෙල

පළමු සිටිය උතුමන්ගෙන් උනි තිය ම
උරුම කමකි නිවතුන්හට බඩ වැඩු ම
නිළම වලට ඒකත් දුන් උණි උරු ම
සිටුම බැරිය අපහට උණිනම් මෙහෙ ම

මහසොහොන් සමයම කවි පොතෙන් ගත් කවි කීපයක් මෙසේය.

සැපත දෙවන සවසතට නියෝ ගේ
සැවත දිනිඳු සිරිසර උවිඳු ගේ
දිමුත සෙවන ඉඳ සවන සරා ගේ
උපත කියමි මහසෝන් යකා ගේ

අසුර රජෙක් පෙර බස් මිසු රාය න
ඉසුරුට මෙහෙවර කරමින් නොපම න
මතුරු දහැනයක් අරගන ඔහු ගෙ න
මතුර ගතිය තම සුරතට එදහැ න

එ අත තිබූ තැන දාලා අඑ වෙ න
යුගත නළසෙ මහ බල ඇති එදහැ න
තිනෙත ගටම අත් වදමි කිවු තැන
දවත ඉසුරු සක්වල වට බිය ගෙ න

ගුරුට සතුරු ඒ බස්ම සුරින් ද
අතට රැගෙන එම තුරු ගිනි කන් ද
ඉසට තබා මරමැයි එසුරින් ද
නොසිට අඹාගත්තේ ලුහු බත් ද

අනුවන කම කල එතැන් නෙතා යා
වෙනු දක දිවැසින් වන් විපතා යා
උණුවන සංළලුන් දුටු නෙසිතා යා
තුණු වග වෙස් ගනිමින් මෙයුතා යා

සිකිපිල් කළඹසෙ දනමන පිනව න
අතිනිල් වරලෙස බැද මල් පටියෙ න
ඉඳුනිල් මිණි යුවලක් මෙන් බබල න
දිගුනිල් නෙත් යුග ගෑ රස අඳුනෙ න

සවන් යුගල රතොවිලි සිරි ඉසු එ
උවත් නිරිඳු දත් කොද කැන් නැබු එ
නොමින් පුබුදු කරමින් නිති බැබ එ
උදුල් ගිරා තුඩු නියසිරි නිය එ

ගිනිගත් එමතුරු දහැනය අරගෙ න
තුන්නෙත් එළවා දක අසුරා එන
වෙනුගත් මායා එළදගෙ රුව ගැණ
සකනත් මිස කෙවණෙකි ඇති විල සිත

හදවත් තොස කරවන දුටු දුටු සත
සොද රුසිරෙන් දිසි එළඳුන් නිල් ගත
බැද ඔන්චිල්ලාවක් එන මා වත
ඉද බබලන සැටි දිටි අසුරා නෙ ත

නිලේ සිරුර රැඳි රුසිරු විපුල් ලා
දූලේ බැදි අසුරා මුව පොල් ලා
සිරේ තබා ගනිමින් තම අල් ලා
මළේ සඳ හිස සිට දෙපතුල් ලා

මහා විෂ්ණු මායමට ලොබින් නේ
මහ බල අසුරා ද අළු වන් නේ
මහ සේනාවක් පිරිවර මින් නේ
මහ සෝනා අළු ගොඩෙන් උපන් නේ

යක්කමක් බලා ගුවනේ ඇවිදින්නා — සොද
ඉක්මනක් වෙලා වටපිට විමසන්නා
කොක් හඩක් ගසා අමු සෝනට පැන්නා — මරු
යක් වෙසක් අරන් මහ සෝනා එන්නා

පැය රත් වලස් මුවකින් බබළන් නා — බිඳ
කාය ඇත් හිසක් අරගෙන අතකින් නා
සායකුත් සුරන් සියොගත පෙරවන් නා — මරු
මාය වෙස් අරන් මහසෝනා එන්නා

පාරතොට කඩුළු පලවල් වල ඉන්නා — දූවු
චාර ගල් ගසා සොල්මන් කරවන්නා
ඝෝර රුදුරුවන් යක්වෙස් පෙරලෙන්නා — අද
රිරි මරු සොහොන් යකු කෙල කෙළ එන්නා

දරන් කඩුව වෙසමුණි රජුගේ අතටා — ඇත
ඉරන් යකුගෙ ගත ඉස සිට දෙපතුලටා
සුරන් සැවොම් අණ දුරුවෙමි සියොලඟටා — අද
වරන් ගතිමි මහ සෝණේ සමයමටා

දිනක් හල්කදලියේ ලේකම් සතර කෝරලේ ගමකට කිසියම් උවමනාවකට ගියේය. එසේ ගොස් එන අතර රෑ බෝ වූයෙන් කුරගමුවේ දී අසළ තිබූ විහාරස්ථානයකට ගොස් රාත්‍රී නවාතැන් ඉල්ලුවේය. නමුත් විහාරාධිපතීන් වහන්සේ අවසර දී නැත. හල් කදලියේ ලේකම් පුස්කොළයක කවියක් ලියා එය පන්සලට යන පාරේ දමා ඇවිත් තිබේ. එදින ලියන ලද කවිය මෙසේය.

පිරුණු වතුර වැහැලා ගුරු කඩ ගිය කා
රැවුණු එපමණක් නොව ගමනක් හිමෙ කා
මෙනෙහි නිවා ගනිමැයි පන්සල සල කා
ගොහිනි බලා සිටියෙමි මහණගෙ මුවේ කා

වේලුණු නෙරළු එලයක් ගෙන උලා කකා
ඌ උණු තෙර ලෙසටූ ඉදගෙන මිටි ඇදෙකා
නාදුනී මගෙ තරම ඒ මහණ පාපි කා
තේරුණු සොරා බව කුරුගමුවේ සැණෙ කා

රෙද්ද පඩුව ඇඳ ඉසමුඩු කරණ මුවේ
සුද්ද මුණිදු සාසන සිඳ බිඳ දමු වේ
ඉද්ද මල් පාන මහණා කුරු ගමු වේ
වැද්ද කුදුණී රැයකට උගෙ ගෙය කොමු වේ

මාර සතුරු පැවදිව උනෙහි සාස නා
කාරියකට නැති පිළිවෙලෙහි හැසිරෙ නා
කුරුගමුවේ මහණා කියන නරි ගො නා
නැරිය එක රැයක් විසුමට නවා තැනා

# පණ්ඩිත වේරගම පුංචිබණ්ඩාර තුමා.

ක්‍රි: ව 1860 දී පමණ රත්නපුර වේරගම උපන් බෝධි නායක ධර්මාලංකාර පුංචි බණ්ඩාර මහතා සබරගමුවේ විසූ ශ්‍රේෂ්ඨ පඬිරුවනක් ලෙස හඳුන්වා දිය හැකිය.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන්ගේ නේවාසික ශිෂ්‍යයෙකු වශයෙන් විද්‍යෝදය පිරිවෙනේ මූලික ධර්ම ශාස්ත්‍ර පිළිබඳ අධ්‍යාපනයක් ලබා ගත්තේය.

එවකට විද්‍යෝදය පිරිවෙනෙහි සිටි උගතුන් අතරින් මතුවී පෙනුන උගතෙකු ලෙසට විශේෂ සම්මානයට පාත්‍ර වූ පුංචි බණ්ඩාර මහතා නොයෙකුත් ශාස්ත්‍රීය කටයුතු වල යෙදුනේය.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන් වහන්සේගෙ අනුශාසකත්වයෙන් 1882 දී ආරම්භ කරන ලද සරසවි සඳරැස පත්‍රයේ ප්‍රධාන කතෘ ධූරයට පත්වූ මෙතුමා එමගින් බෞද්ධ සමාජයට අතිමහත් සේවයක් සිදු කළේය. සරසවි සඳරැස එවකට ප්‍රබලතම සන්නිවේදන මාධ්‍යක් බවට පත්වූයේ වේරගම පුංචි බණ්ඩාර මහත්මාගේ ක්‍රියාකාරිත්වය නිසයි.

මහා කවි කාලිදසගේ ඍතු සංහාරය නැමැති සංස්කෘතික ග්‍රන්ථයට සිංහල භාව සන්නය කළ මෙතුමා එමගින් තමාගේ සංස්කෘත භාෂාවේ විශාරදත්වය මැනවින් පැහැදිලි කළේය. මෙ හැර වේරගම පඩිතුමා විසින් කරණ ලද තවත් පොත් කිහිපයක් ඇත.

1. පද නීතිය (සිංහල ව්‍යාකරණ පිළිබඳ විග්‍රහ කරන ග්‍රන්ථයක්.)
2. ශබ්ද මුක්තාවලිය (කෝශ ග්‍රන්ථයකි.)
3. සම්බුද්ධ චරිතය (ප්‍රකරණ ග්‍රන්ථයකි.)
4. දේව ධර්මය. (ධර්ම ශාස්ත්‍රීය ව්‍යවහාරයේ නොමැකෙන සිහිවටනයකි.)

වේරගම පුංචි බණ්ඩාර මහත්මා වඩාත් ප්‍රසිද්ධ වූයේ කවියෙක් වශයෙන් බව පෙනේ. කාව්‍ය රචකයන්ගේ හිත් පුබුදු කරවමින් ඔහු ගෙතු කවි රාශියකි. 1905 දී පමණ හදිසි අභාවයට පත්වූ මොහු සබරගමුවේ ජනප්‍රිය කවියෙකු වශයෙන් හඳුන්වා දිය හැකිය.

වේරගම පුංචි බණ්ඩාර මහතා විසින් මොලමුරේ නඩුකාර තුමාට ලියා යවන ලද ලිපියක තිබූ කවියක් මෙසේය.

සොමියුරේ රතනපුර ඹර — දිලිසාර
උරතුරේ වසන සිරිසඳ — හැමවාර
මොලමුරේ මැතිඳු තෙම වෙත — නඩුකාර
පද සරේ නැමැද මෙම පත — දෙවහාර

පුංචි බණ්ඩාර මහතා ටී. බී. පානබොක්කේ මැතිඳුට යවන ලද ලිපියක අඩංගු කවියක් මෙසේය.

නිලමෙ කෝ කෝ කියා මදුරුවො කණට නිතරම කොදුරති
කල බොලෙන් බලු මැක්කො දුව පැන ඔබ සොයා දන් ලතවෙති
දළ ලොබින් පෙර පුරුදු මකුනෝ කොටට පැදුරුත් පෙරලති
මළ ඉලව්වේ මුංට මක්කා කියා ගැලවෙම්දෝ ඉති

පුංචි බණ්ඩාර මහත්මා වරක් හමුවූ එක් තරුණියක දැක හිටිවනම කී කවියක් මෙසේය.

දන මන නුවන් බැඳෙනා රූ සිරි කැටිය
ගෙන තින සුපිපි සුවඳැති දෙසමන් මිටිය
පැන ගෙන රියන අදිසියකට මෙන් දුටිය
වන වන මොකද ලද නුඹ ඔය යන සැටිය

තවත් අවස්ථාවකදී රූමත් කාන්තාවක දැක හිටිවනම කියන ලද කවියක් මෙසේය.

සඳක් බදු උවන රඹ පැල යුරු වටොර
ළදක් ලොබ මැදින් නුඹ වැනි රුසිරු සර
අතක් ගෙල ලමින් මුව සිඹ තුරුළු කර
රැයක් ඉන්ට නොලැබුනි මගෙ පවින් පෙර

පුංචි බණ්ඩාර මහත්මා විකට කවි රචනයෙන් දක්ෂයෙක් බව සඳහන් වෙයි. එම්තුමාගේ විකට කවියක් මෙසේය.

ලොදු ගෙමල පහන් කබල බද සිටින අර
සද ගන්නට ජාති සුද්දේ සෙනගත් රැස් කර
බෙද ගන්ට බැරුව සිටින දම්මරතන දුර
ඉදා මෙපොල් මල අරගෙන රැකියන් රා කර

# අප්පු සිඤ්ඤෝ මහතා.

සියනෑ කෝරළේ දන්ගල්ලේදී උපත ලැබූ අප්පු සිඤ්ඤෝ නමැති අය වෙරගම පුංචි බණ්ඩාර මහතාගේ ලඟින් ඇසුරු කළ කෙනෙකි. එයට හේතුව එකම කාල සීමාව තුලදී විද්‍යෝදය පිරිවෙන්හි ඉගෙන ගත් නිසාත් එකට සිටිය නිසාත් විය හැකිය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමියන් විහාරස්ථානයේ කීකරු සේවකයෙක් වශයෙන් සිටි මොහු රත්නපුර ප්‍රදේශයට ද සම්බන්ධව සිටි බව පෙනේ. මිය යන විට අවුරුදු 87 ක් පමණ වයස් ගතවී තිබූ මොහු හිටිවනම කවි කීමෙහි දක්ෂයෙකු විය. එවකට විද්‍යෝදය පිරිවෙන්හි සිටි බොහෝ අයගේ සුළු වරදක් පවා දුටු විට අප්පු සිඤ්ඤෝ ඒ ගැන කවියක් හදා කියයි. මේ නිසා බොහෝ දෙනා අප්පු සිඤ්ඤෝට බියෙන් ඔහුට සලකාගෙන සිටි බව සඳහන් වෙයි.

දිනක් හික්කඩුවේ සුමංගල නායක ස්වාමීන් වහන්සේ අප්පු සිඤ්ඤෝට කථාකොට ලිපියක් දී එය වෙරගම පඬිතුමාට වහාම ගෙන ගොස් දෙන ලෙස දැන්වීය. අප්පු සිඤ්ඤෝ මෙම ලිපියෙහි පිට පැත්තේ පහත සඳහන් කවිය ලියා ගෙන කිසිවෙකු අත මෙම ලිපිය පඬිතුමාට යවන ලදී.

ඝෝරතර නිරයට  
පාර සෑදන යාමට  
වෙරගම බණ්ඩට  
භාරදී එව මෙපත හනිකට

මෙම ලිපිය අතට පත් වෙරගම පඬිතුමා ඉමහත්සේ කිපී ලියුම ද රැගෙන විත් නායක ස්වාමීන් වහන්සේට පෙන්වූයේය. ලිපියේ කවිය කියවන ලද නායක ස්වාමීන් වහන්සේද බලවත් ලෙස කිපී අප්පු සිඤ්ඤෝ වහාම එතනට කැඳවීය. මේ සිද්ධිය දැක බලා ගැනීමට ඒ ස්ථානයට විශාල පිරිසක් එකතුවිය.

නායක ස්වාමීන් වහන්සේ නඩුව ඇසීමට සූදනම් විය. අප්පු සිඤ්ඤෝ කිසිම චකිතයක් හෝ බියක් නැතිව ඉදිරියට පැමිණ අවසර ගෙන සතර අගතියෙන් වෙන්ව නඩුව අසන ලෙස ඉල්ලා සිටියේය. නායක ස්වාමීන් වහන්සේ මෙයින් මහත් කෝපයට පත්විය. එසේනම් කියාපිය සතර අගතියයි නායක ස්වාමීන් වහන්සේ දැන්වීය. අප්පු සිඤ්ඤෝ ශාන්ත දාන්ත ලෙස ඒකත් මගෙන්ම අවසර ලැබෙන්නට යැයි කීය එවිට නායක හාමුදුරුවන්ගේ කෝපය සිනාවට පෙරලිණි. නඩුවද කෙළවර විය

අප්පු සිඤ්ඤෝ ඇතැම් විට නායක ස්වාමීන් වහන්සේ සමඟද වෙරගම පුංචි බණ්ඩාර මහතා සමඟද නොයෙකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් වරින්වර වාදකොට ඇත. අප්පු සිඤ්ඤෝ විසින් හෙයියන් තුඩුවේ නායක ස්වාමීන් වහන්සේට ලියා යවන ලද කවියක් මෙසේය.

—කොයියන් විලසවත් මෙ ලොව් නැති ලෙසින  
දෙයියන් විසින් නිමකර මිස බැරි සදන  
හයියෙන් බණ දෙසන සතහට කර කුළුණ  
හෙයියන් තුඩුවෙ සමිඳුට දෙමි මෙ හසුන

වරක් අප්පු සිඤ්ඤෝ විසින් ලියන ලද කවියකට කෙනෙක් දොස් කියා තිබෙනු අසා ඒ ගැන නොසතුටෙන් ඔහු කියන ලද කවියක් මෙසේය.

නිසිඅත් වැණුම් ඇති මගෙ මනහර කයියේ
පුනරුත් දොසක් පැවසූ මුත් නුඹ ගොයියේ
මෙමටත් හොඳ වෙලාවක් පිය රතන යියේ
ලැබුණොත් වැලි කොටම් නුඹෙ වියරණ කොයියේ

වඩා උගතෙක් නොවුවද අප්පු සිංඤෝ කාව්‍ය රසයෙන් යුත් භාෂා රීතියකට සුමදුර කවි කීමෙහි දක්ෂයෙකු බව පෙනේ. මෙ නිසාම ඇනුම් පදයන්ගෙන් යුක්තව එමෙන්ම අසභ්‍ය වචන සහිතව ඔහු කවි ලියා ඇත.

ඒ කාලයේ වැඩ සිටි වෘධතර මහ ස්ථවිර වහන්සේ නමකගේ අබ්බාහන නම්වූ විනය කර්මයක් සඳහා නායක ස්වාමීන් වහන්සේ වැඩමවන ලදී. ඒ සමඟ අප්පු සිඤ්ඤෝ ද ගිය බව කිවයුතු නොවේ. මෙ සිද්දියෙන් පසු ආපසු පිරිවෙනට පැමිණි අප්පු සිඤ්ඤෝ තම මිත්‍රයන් ඉදිරියේ පහත සඳහන් කවිය කියා ඇත.

සම්බා දිනෙහි අගනුන් සහ වැස බොහොමා
අබ්බා භණය ලැබ ගත්තේ මහළු හමා
නිබ්බානයට යන හැකි නම පිණින් එමා
ඉබ්බා හටත් ලොම ඇතිවෙ මැයි පුදුමා

# පුස්සැල්ලේ කපුරාල.

පුස්සැල්ලේ පැරණි කපු පරම්පරාවට අයත් මොහු රත්නපුර පුස්සැල්ල ප්‍රදේශයේ ඉපදුන අයෙකි. උඩරට නැටුම් කලාව පිළිබඳව මනා දක්‍ෂතාවයක් තිබූ මොහු වඩාත් ප්‍රසිද්ධ වූයේ ඒ සම්බන්ධයෙන් වුවද කවි කලාවටද දක්‍ෂතාවයක් දැක්විය.

තැනට ගැලපෙන ලෙස අදහස් ඉදිරිපත් කිරීමෙ දක්‍ෂතාවයක් දැක්වූ මොහු රදළ ප්‍රභූන් ඉදිරියේදී වුවද නොබියව අදහස් ඉදිරිපත් කළ බව ප්‍රකාශවන ජනප්‍රවාද ද අසන්නට ලැබෙ.

ඒ කාලයේදී පුස්සැල්ල ආසන්නයේ තිබූ වලව්වට නිතර යාමෙ ඒමෙ සිරිතක් පුස්සැල්ලේ කපුරාලට විය. එහෙත් මෙ වලව් අතරින් එක්නැලිගොඩ වලව්වෙන් ඔහුට ලැබුනේ අඩු සැලකිල්ලකි. මෙ ගැන නොසතුටුවූ කපුරාල දිනක් බුලත් ඔලගුවද කරේ දමාගෙන ගොස් වලව්වට ගොඩ වැදුනේය. පුස්සැල්ලේ කපුරාලගෙ අමුතු විලාසය දුරකියාම දුනගත් වලව්වෙ දිසා මැතිතුමා ඉක්මනින් වලව්ව ඇතුලට රිංගා ගත්තේය.

පුස්සැල්ලේ කපුරාල එඩිතර කමින් යුක්තව ආලින්දයේ ඇතිරිලි එළා තිබුන හෘන්සි පුටුවක දිග ඇදුනේය. බුලත් ඔලොගුවද ඉදිරිපිට තබා ගත්තේය. මොහොතක් මෙසේ කල්ගත කොට බුලත් විටක් සකස් කරගෙන බුලත් වංගෙඩියේ ලා එය පුටුව මතම තබාගෙන කොටන්නට පටන් ගත්තේය. කපුරාලගේ මෙම ක්‍රියාව දුටු දිසා මැතිතුමා ඔහුට නොපෙනෙන්නට තවත් ඈතට ගියේය. බුලත් විට කොටා කටට විසි කරගෙන කෙළ පඩික්කම පුරවා උගුර රැල් බූරුල් හැර ශබ්ද නගා මෙසේ කීය.

"අනේ . . . . . මෙ නම තියාපු එකාගෙ කටෙ මසුරන් දමන්නට වටී." යනුයි. ඒ වෙලාවෙ වලව්ව ඇතුළේ සිටි දිසා මැතිණිය එළියට ඇවිත් මොකද කපුරාල කීවේ? යි ප්‍රශ්න කළාය.

කපුරාලද ඇයි දන්නෙ නැද්ද? රටෙ මහත්මයෙකු මිස අපේ මහත්මයෙකු නම මෙසේ කරාවිද්දයි පිළිතුරු දුන්නේය. එවක් පටන් මොහුට වලව්වට ගිය සෑම අවස්ථාවකදීම දිසා මැතිතුමාගෙන් හොඳින් ගරු නම්බු ලැබුණේය.

මෙබඳු තවත් ප්‍රවාදයක් මෙසේය. දිනක් කුරුවිට කෝරළයේ පිරිසක් විවාහ යෝජනාවක් සම්බන්ධයෙන් තුන්කෝරළයේ දරණියගල ප්‍රදේශයට ගියෝය. කුරුවිට කෝරළයෙන් ගියේ මනාලයාගේ පිරිසය. කුරුවිට කෝරළයෙන් කතා බහට ගෙන ගියේ පුස්සැල්ලේ කපුරාලය. එවකට මැදියම් වයසේ සිටි පුස්සැල්ලේ කපුරාල මනාලයාගේ පිරිස සමඟ එදින සන්ධ්‍යා කාලයේදී දරණියගලට ගියෝය.

දරණියගලදී මනාලියගේ පාර්ශවයේ අය මෙ අය හොඳින් පිළිගෙන ප්‍රණීත සංග්‍රහයක්ද පැවැත්වූහ. සංග්‍රහයෙන් පසු දෙපක්‍ෂය අතර සුහද කතා වලට මං පෑදිනි.

මෙසේ කතා බහේ යෙදී සිටියදී මනාලියගේ පාර්ශවයේ කථිකයා ඇනුම් පදයක් කීවේය. ඒ කතාව මෙසේය.

"මෙබඳු ගමන් යනකල අපේ පළාත්වල නම් වැදගත් තලතුනා අය සමඟ යාම් සිරිතකි. මේ සමූහයා එසේ නොපැමිණියේ එබඳු අය නැති නිසා වෙන්ට ඇති" යනුයි.

පුස්සැල්ලේ කපුරාල මීට පිළිතුරු දීමට පසුබට නොවීය. හේ වහා නැඟිට මෙසේ කීය.

"මේ ගමිත වැදගත් අය සමඟ එන්ට නොලැබුණ බව ඇත්තකි. එය වැදගත් අය නැති නිසාවත් අපේ වරදින්වත් සිදු වූවක් නොවේ. මනාල මහතාගේ පියා ඒ ගැන බොහෝ වෙහෙසුනේය. පළමුකොට එක්නැලිගොඩ දිසාපතිතුමින් වෙත ගොස් මේ ගමනට එන්ට ආරාධනා කළේය. එවිට එතුමා කතා කොට "අනේ ළමයෝ උඹලාගේ ගෙදරට නම් වලව්වේ මහත්මයෑත් සමඟම මට එන්ට පුළුවන. නමුත් දූරණියගල මිනිසුන්ගෙ ගෙදරට නම් අපට එන්ට බැරියයි" කීය. ඊට පසු එල්ලාවල දිසාපති තුමින්ට කතා කළේය. එතුමාද එසේ කීවෙය. මඩුවන්වෙල මහවල තැන්නේ දිසාපතිවරුන් වෙත ගියකළ එතුමෝද එසේම කීහ. මීට වඩා වැදගත් අය අපේ පළාතේ නැත. කලින් නම්කළ ගමතක් නිසා අපි ඇවිත් යන්නට ආවෙමු" යනුවෙනි.

මේ කතාව ඇසූ මනාලියගේ පාර්ශවයේ අය දුර්මුඛ වූවෝය. මනාලයාණේ පාර්ශවයේ අයට හොඳට සැලකුම්ද කළෝය.

එල්ලාවල විහාරය සාදවා ගැනීම ගැන මොහු විසින් එල්ලාවල කෝරළේ මහත්මයාට කියන ලද කවි දෙකක් මෙසේය.

කුළු පොතු පෙර දිනක එක් සහ නමක් දක
නොම යුතු දිඹුල් දණ්ඩෙන් කරදුනි ගෙය ක
බලගතු සදෙව් ලොව සැප විඳ මිදී කමෙ ක
තව මතු එයින් රජසිරි වින්ද උතුමෙ ක

එනිසා මැතිතුමණී එල්ලාවල දිමු ත
මුනි ශාසනය පවතින දහම බොරු නැත
සතොසා පිළිම ගෙය සැදූවොත් නොම දෙසි ත
නොලසා එමොක් සිරි සැප ලබනුය නිය ත

පුස්සැල්ලේ කපුරාල දවුලක් ගැන ඇලගාවා වත්තේ මුහන්දිරම් මහත්මයා වෙත යවන ලද තේරවිලි කවි කීපයක්:-

මවුන් වදලා පියන් නැසීලා බැලූ හැටියේ මව නැසුනා ළූ
එයින් තැනීලා තද දුක් විඳලා බිම පස් කාලා ලොකු වෙ ළූ
නැතින් සොයාලා බලන් දැනීලා කලින් කලට උපකාරය ළූ
ගහින් වැටීලා අත පය කැඩිලා පසු කරකැවිලා නුඹ වෙත ළූ

කොහෙද මුගේ යන එන සැටි තොරතුරු මදක් කියම් සිහි ගනිතෝ තින්
නිබඳ කරණ කළ එළි සෙල්ලම් වල ගොඩින් අඩයි ඉද බැටත් කමින්
ඇවිද කොහේවත් ගෙදරට ආ කල බෙල්ලේ වැල්ලා ඉද රෝසින්
මෙවෙනි මෙසතුරා මවෙත එවාපන් උඹට කමක් නැත සිටියා ගින්

බාහිර ඇතිවලු කටහඬ ඇතිවලු ආහාරත් තුඩනෙට කාලූ
මෙවර බන්දිලු අවුල් හැරේ කලු ඇහලාගෙන පෙර තිබුණාලූ
දූහැම ඇතිදලු අපහසු වැඩිමලු හුස්ම ගොසින් දත් බොක්කේලූ
මේ හැම ඇතිවලු සිටින්ට බැරිවලු මවෙත එවාපන් ඒ යාලූ

පුස්සැල්ලේ කපු මහත්මයා විසින් සපරගමුවේ ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක්ව විසූ මඩගම්මන ලොකු මහත්මයාගේ මරණය සිදුවූ අවස්ථාවේ ඒ වෙනුවෙන් ලියන ලද කවි දෙකක් මෙසේය.

සක වසින් එක් දහස් අටසිය සතකි කුජරවි භාග අටකින
වක නවන් පුර පණුර ගුරුදින උදුසන තුන්පද සමා රින
රික භුජන් ගම රතහ හෝරා මීන දෙරකුන මෙහැම සපි රැන
ලක උතුන් හිෂ තුමා මඩගම්මන ලසින් යම පුරට පැමි ණුන

ලකට පරසිදු නිරිදුගෙන් පෙර ලැබූනම්ගොත් ඇතුව ගරු කර
සතට මව්පිය ලෙසට පිහිටම කිම්දිමින් සිප් සතර සාගර
පවට විලිබිය ඇතුව දන්පින් කළේ බෝසත් කෙනෙකු මින් පෙර
පිණට වත් නැරි යයි මරුවා මොහුට කරුණා දයා මෙත් කර

පුස්සැල්ලේ කපුරාළ කොපමණ සමතෙක් වුවත් දිනක් විරිදු කියන්නට ගොස් කිරි අංසා නැමති රජක කුලයේ අයෙකුට පැරදුනේය. කිරි අංසාද මුඛරි පුද්ගලයෙකි. එමෙන්ම දක්‍ෂ විරිදු කාරයෙකි. මෙ දෙදෙනා කිසියම් තැනකදී හමුවී මෙසේ වාදයක් ඇතිවිය.

කිරි අංසා :— නළුවට වුණ වැරදී — දිළිඳුව
පිරුවට ණයට අදී
ඒවට මිලය නොදී — දවසක
ඔලුවට ඇණපි රිදී

කපුරාළ ;— ගමින් මෙමට ආතෙක් මුර
ඉන්නේ නම් මූගේ ගෙදර

කිරි අංසා :— එද හිටන් අපේ ගෙදර
හිඟ නැත වෙල්ලාවට දර

මෙසේ කියා ඇතික් දෙපදය සම්පූර්ණ කළේය. මෙයින් කපුරාල පැරදුනේය.

# කළුගොඩ රාල සහ කැකිරිගොඩ රාල.

අතීතයේ සපරගමුවේ විසූ විරිඳු ගායනයේ දක්ෂ වූ දෙදෙනෙකි, කළුගොඩ රාල හා කැකිරිගොඩ රාල යන දෙදෙනා, එකල රජ - සිටු - දිසාපති - අදිකාරම් ආදී ප්‍රභූන්ගේ නිවාසවල වන්දිභට්ට ගායනයේ යෙදුන විරිඳු කරුවන් ගැන අසන්නට ලැබේ.

මේ විරිතට අනුව මහනුවර පල්ලේගම පහේ මහ අදිකාරම තුමාගේ වලව්වට එතුමා එක් දිනක් ලංකාවේ සිටි විරිඳු ගායකයෝ කැඳෙව්වේය. මේ විරිඳු ගායන වැඩ සටහනට සම්බන්ධ වූ දෙදෙනෙකි කලුගොඩ රාල සහ කැකිරිගොඩ රාල.

අදිකාරම් තුමාගේ ගායන තරඟයට සහභාගී වී කැකිරිගොඩ රාල කළුගොඩ රාල දෙසට අත දිගුකොට මෙසේ කීය.

<u>කැකිරිගොඩ රාලː-</u>

මුසුන් මීටෙ කෙටුවා වැනි කට    ටෙ
අසුන් පිටට දමුවා වැනි හැට    ටෙ
මුහුන් දමා බැඳි වැනි කිරි පට    ටෙ
වසුන් ඇරල බලනුව මුගෙ කට    ටෙ

<u>කළුගොඩ රාලː-</u>

මූට මූගේ මව් බඩ දරුවෝ සිටිනා කල එදි නේ
රැට කැකිරි ගොඩක් උයා කුසගින්නට කාපු තැ නේ
ඊට බංඩි රුජා පැහැර මේකා උප්පාද උ නේ
මූට කැකිරි ගොඩයා නම එනිසයි හාමුදුරු ව නේ

# නැකැත්කාර තෙරනමක්.

රත්නපුර ප්‍රදේශයේ විසූ තෙර නමක් මාතර විසූ සුප්‍රසිද්ධ බරණ ගණිතාචාර්ය වරයා සමග මිත්‍රව සිටියේය. බරණ ගණිතාචාර්ය පඩිවරයා සමඟ මිත්‍රව සිටි මෙම ස්වාමීන් වහන්සේගේ නම අස්ථානගතව ඇත. එහෙත් මූලික සඳහන් වලට අනුව රත්නපුර ප්‍රදේශයේ වාසය කරණ ලද බවට අනුමාන කළ හැක.

එක් දිනක් මෙම ස්වාමීන් වහන්සේ බරණ ගණිතාචාර්ය වරයාට මෙම කවිය ලියා යැව්වේය.

සතවරුස එක් දහස් සත්සිය සුසාලිස්වන වරුසයේ දී
මකර රවි තුන් භාග පැමිණුන තුදුස්වක රිවටාව ලඟ දී
නැකත උත්‍රාපලේ ගවරස යෙදුන කිවි හෝරාව අග දී
මොකද ගණිතයො මහ පොලව කම්පා උනේ හඩ රැව දිදී

මෙම කවිය ලැබීමෙන් පසු බරණ ගණිතාචාර්ය වරයා ද එම ස්වාමීන් වහන්සේට පිළිතුරු කවියක් ලියා එවා ඇත. එම කවිය මෙසේය.

උතුම් මුනිඳුගෙ ශාසනෝදී සඟුන් පිළිවෙත් දුරැර දමලා
රවුන් රවටා ණය පොලී කර නොයෙක් වස්තුව සඹබ කරලා
කතුන් තනතුරෙ නිදි සොයා ගොස් කරණ අතදර සිවරු දරලා
මෙතුන් කාරණ නිසා මිහිකත පැන නැගුණි කම්පා වෙලා

# එපිටවල දසනායක අප්පුහාමි විදානෙ මහත්මයා

වෛද්‍යවරයෙක් වශයෙන් ද ප්‍රසිද්ධව සිටි දසනායක අප්පුහාමි විදානෙ මහත්මයා රත්නපුර එපිටවෙල ප්‍රදේශයේ උපන් අයෙකි. කාව්‍ය කරණයෙහි ද මනා දක්ෂතා දක්වූ අයෙකි.

වරක් මොහු තම මිත්‍ර හෙලේනිස් අප්පුහාමි නැමැත්තාට පහත සඳහන් කවිය ලියා යවා ඇත.

කත් වරුස එක්වා දහ හත්සිය තුනට පැමිණි මෙම බිනර මසේ
උතුන් දිසා මැති තුමන්ගෙ පරසිඳු හකුරු අටුව යන ගම පියසේ
මෙවන් පුදුමයක් අපි ඇසුවෙව් නැත සබඳිහි බොරු නැත සොඳ වලසේ
පෙලින් පෙලට මුතු ඇමුණූ විලසට සැදුනි කරල් තුන ගොයම් ගසේ

මෙයට තෙලේනිස් අප්පුහාමි මහතාද දසනායක අප්පුහාමි විදානෙට කවියක් ලියා යවන ලදී. එය මෙසේය.

ඉසුරු දරුව සොඳ ඉතිරි නොවන ලෙස දුසිරිත් නවතා සතර විසේ
නහිනි කැටුව ඇලවල් දවටුව සොඳ තෙරළු තුනකි දනමන විලසේ
සිරි දවටුව නම හකුරු අටුව යන තුර තුර හඬනා කොවුල් රැසේ
සබඳ තුටුව යුග නෙතිණි දුටුව කොල තුනට කරල් තුන ගොයම් ගසේ

වරක් බෙහෙතක් ඉල්ලා දසනායක අප්පුහාමි තම මිතුරෙකුට ලියා යවන ලද කවියක් මෙසේය.

වනන්තරේ කඳ රතලිය කොළ නිල් ල
අතු පතරේ එයි කුසතුළ දවටිල් ල
ගති කඳුරේ ඔයහැටි නැත නුඹ පල් ල
එම මිතුරේ ලෙඩ මුල මුක සිඳ හෙල් ල

දසනායක අප්පුහාමි ලියූ තවත් කවියක්

පැලා ගිමන් ඇරලා ඇවිද කඳු වි ට
නාලා රුසිරු ගිම්ගත සැනසෙන ලෙස ට
වෙලා එනතුරා බැරි මට සිටින්න ට
බාලා දියත් රා ටික දුන්ම බොන්න ට

# දොඩම්පෙ ලොකු බණ්ඩා සහ උක්කු බණ්ඩා දෙපොල

රත්නපුර දෙඩම්පෙ විසූ මොවුන් දෙදෙනා උපතින් අන්ධයෝ වූහ. සහෝදරයෝ දෙදෙනෙක් වූ මොවුන් කවිකීමෙහිද දක්‍ෂයෝ වූ බව සඳහන් වෙයි.

ලොකු බණ්ඩා වැඩිමහල් අයයි. ඔහු රජයෙන් අනාථාධාර ලැබූවෙකි. පිං පඩිය ලබා ගැනීමට රත්නපුර නගරයට යාමට සූදානම් වූ ලොකු බණ්ඩා තම භාර්‍යාව අමතමින් මෙසේ ඇසීය.

| | | | | |
|---|---|---|---|---|
| ලොකු බණ්ඩා | — | එනකොට උඹට මම මොනවද | ගෙනෙන් | නේ |
| බිරිඳ | — | සුදුරෙදි හරියනක් අරගෙන | වරෙන් | නේ |
| ලොකු බණ්ඩා | — | ඒ හැටි කාසි කාටද බොල | තියෙන් | නේ |
| බිරිඳ | — | මෝර කරෝලෙක්වත් මට | ගෙනෙන් | නේ |

කුරු ගඟේ පාලම ගැන ලොකු බණ්ඩා කියන ලද කවි දෙකක් මෙසේය.

දස්ස කමින් ඔහු කරපු වැවක්වද කුරු ගඟ අන්තිමටම සැදූ නේ
විස්ම වැඩක් මද බැලුවොත් සතහට මෙහෙම පාලමක් ගැන සොඳිනේ
ලස්ස ගණන් වටිනා මේ පාලම තැනෙව් මහත්වරු කොයිද අනේ
විස්ව කර්ම දිව පුරයක් විලසට තැනුවයි පාළම විගස කිනේ

දේසේ සිට මහතුන් ඇවිදිල්ලා කරපු වැඩක්දෝ ලොව බැබලේ
බාසේ ඉංග්‍රීසි දන්න මහත්වරු තැනුවයි පාළම මුදල් බලේ
රහසේ කීවත් ඇසෙනා තරමට කම්බි දෙකක් ඇදලා දූලේ
මහසෙන් ඇවිදින් තැනෙව් මෙපාලම රටින් රටට දූන් ලොව පත ලේ

ලොකු බණ්ඩාගේ සහෝදර උක්කු බණ්ඩා වෙදකම ගැනීම පිණිස නල්ලූරුවට ගොස් සිටින අවස්ථාවක හොරු ඔහු සිටි ගේ කඩා බඩු සියල්ල පැහැර ගන්නා ලදී. මේ ගැන ශෝකයට පත් උක්කු බණ්ඩා පහත සඳහන් වස් කවිය කියා ඇත.

ගම ඇරල ආවේ වෙදකම ගන්ට
මා සිටිනා ගේ කැඩුවේ පන්නන් ට
රට නැති වුණා බැරි නල්ලෝරුවෙ ඉන්ට
සමන් දෙවි බලෙන් හෙණ ගහපන් උන්ට

දෙඩම්පෙ අධිකාරිය ගමේ පන්සලේ සිට සිවුරු හැරිය තලන්ගම (තෙරුන් වහන්සේට) කියන ලද කවිය

පැවිදි සසුන රැක යතිඳුනි තලන් ගම
ඇවිදිලි බැරිය මගෙ සිරුරට ගිලන් කම
පැහැදි සිතින් මෙත් කරුණා පෙරටු වම
මෙවිදි පිළි හස්න දක්වමි ඔබට මම

උක්කු බණ්ඩාගේ නැවතිහාමි නැමති තරුණ මිතුරෙක් දෙඩම්පෙ ප්‍රදේශයේ සිටියේය. මෙම නැවතිහාමි නැමැති තරුණයා රාත්‍රී කාලයේ ගහබඩවත්ත නැමති ප්‍රදේශයට යන බවත්, රාත්‍රියෙහි එහි ගෙදරක නවතින බවත්, දැනගත් උක්කුබණ්ඩා ඔහුට අවවාදයක් වශයෙන් පහත සඳහන් කවිය කියා ඇත.

උ  ලියමට ගඟබඩ වතු යන්ට  එපා
ඊ  යන ගමන් ගෙදරක නවතින්න  එපා
පැඟනු නිසා තව දවසක් යන්ට  එපා
රෝදුක් එහෙම බෝකරගෙන එන්ට  එපා

හිතවත් වැලිවත්තේ උන්නාන්සේ නැමැති හිමියන් සිවුරු හැර යාම ගැන උක්කුබණ්ඩා විසින් කියන ලද කවියක් මෙසේය.

පළමුවෙන් උපන් ගම රට වැලි  වත්  තේ
මහණයෙන් සිවුරු හැරලා හිර  ගත්  තේ
උපායෙන් කාසි ටික ලන් කර  ගත්  තේ
කළ පවෙන් තමයි ගොඩ යැමක්  නැත්  තේ

කුරුගඟමෝදර පාළම තැනූ කාලයේදී ඒ සම්බන්ධයෙන් උක්කුබණ්ඩා විසින් ලියන ලද කවි කීපයක් මෙසේය.

කල්පෙට පවතින වැඩක් කරපු සැටි මෙලෙසට මාගෙන් අහපන්  තේ
මුල්කර මම දූන් කියන මෙකවි පද තිබුනත් වරදක් නොගනින්  තේ
අල්කර පියවර සමගින් මෙ ලෙස ඇවිදින් උදයට රැස් වන්  තේ
පින්කර ගැනුමට සොඳ ලෙස කුසලකි තැනෙව් මෙ පාළම දූන ගන්  තේ

උතුම් සමන් දෙවි බලෙන් පිහිට ලැබ තොසින් මෙපද දූනකර  කියනා
මෙවන් දහස් අවුරුදු පවතින්නට බැම්ම සොඳට කණු සවි  කරනා
පැතුම් බලෙන් තුන්සිය හැට දහසක් මුදල් ගණන් වියදම්  කරනා
සතුන්ට අනදර නැති ලෙස ගමනට යසින් බෙදුනු පාලම  සැදුනා

එතෙර සිටන් මෙතෙරට ගොඩ බැස ඉංගිරිස් මහත්තැන් සොඳ ලෙසිනා
මෙතෙරට සිංහල සෙනගට ඇතුළුව දෙවියන්ගෙන් වරමක්  ලැබුණා
අකුරට ඇදනැති හැටියට පදකර කියන්න ලස්සන රුව  දිලෙනා
සපරගමුවෙ කුරුගඟ ජල පාලම සරියට මුල්තැන් ලොව  වටිනා

යුදෙන් සෙනග වටකර රැක සිටියත් කියන්න මේ පද සැක  නැත්තේ
යොදුන් ජෙකල්පය පවතින තරමට උසින් බැම්ම බැදලා  ඇත්තේ
සොඳින් පොළාව කම්පා වුණු විලසට කියම් වරද ඇර එක  සත්තේ
නමින් මෙකුරු ගඟ දෙගඟ එකය උණු තෙනමයි පාලම  ඇත්තේ

උක්කුබණ්ඩා නැමැති මෙම ගැමි කවියා වරක් අනුරාධපුරයේ වන්දනාවේ ගියේය. එහිදී එක් තැනක පරගල මැණිකේ නමැති කාන්තාවක් යතුරක් නැති කිරීම ගැන ඔහු හිටිවනම කී කවි දෙකක් මෙසේය.

වැසා උනිම් අධිකාරිය ගමේ  මම
අසා සොර කමක් කළ සැටි වී  පුදුම
දීසා බොරු නොවෙයි මකියන්නේ  ඔහුම
මුසා බස් නොවෙයි අසනුය සැම  දෙනම

හතර කෝරළේ පරගල  වලව්  වේ
නපුරු ලියක් සිටියයි එම  අලව්  වේ
හතුරුකම නිසයි එතනින්  එළෙව්  වේ
යතුර නැති කළැයි මලහත්  ඉලව්  වේ

උක්කුබණ්ඩා විසින් රචනා කරණ ලද තවත් කවි පන්තියකට සම්බන්ධ රසවත් කතාවක් ඇත. එය මෙසේය.

මාපිටිගම සභාපති තුමා අලි පැටියෙක් මිලදී ගෙන හීලෑ අලියෙකු සමඟ හීලෑ කර ගන්නට කටයුතු කළේය. එහෙත් මේ අලියා මිනී මරන්නට පටන් ගත්තේය. ඒ නිසා අලියා වෙන කෙනෙකුට විකුණන ලදී. මේ අලියා මිනී මැරීම අත් නොහල හෙයින් එම අයිතිකාරයා ද නැවත ඌ පුරන්අප්පු නැමති කෙනෙකුට විකුණන ලදී. පුරන්අප්පු ද මෙම අලියා නැවතත් අප්පුසිංඤෝ නැමති කෙනෙකුට පවුන් සියයකට විකුණන ලදී.

අප්පු සිංඤෝ නැමති අය අලියා ගස් බැඳගෙන සිටින විට ඌ බැලීමට කෙනෙකු නොමැති විය. අලි බලන්නෙකු අවශ්‍ය බව මුදලාලි ප්‍රදේශයේ පතල කර හැරියේය. ඒ අනුව මණ්ඩදෙණියේ හරමානිස් නැමැත්තා පොරොන්දු ඇතිව අලියා බැලීමට භාර ගත්තේය. කෙසේ වුවද ඉන් ටික දවසකින් එම හරමානිස් නැමැති අය සහ අලියා ද මරණයට පත්වී ඇත. මේ සිද්ධිය සම්බන්ධයෙන් උක්කුබණ්ඩා ප්‍රබන්ධ කල කවි පන්තිය මෙසේය.

වරුස දහස එක අටසියවක් ලත් අනුනවය උණු විපත ඥානා
සරොස නොවීමට කියන්ට නිසිලෙස මරණ දෙකක් ආරංචි වූණා
මෙරස සිටිය අලියෙක් මැරුවය කිව් පෙබරවාරි විසි දෙවෙනි දිනා
පරුෂ වචන වැඩියෙන් නැත සුදනෙනි අසන් මෙපද සිත සන් තොසිනා

වරන් ගතිමි මම කියන්න පදකර මුනිඳුන් පළමුව සිහි කරලා
නරන් රකින සැම දෙවියන් එකතුව සිටියැයි තුන්ලොව දිවැස් බලා
අරන් ගොසින් මාපිටිගම උන්නැහෙ වල් අලියෙක් බැඳ හීලෑ කලා
දරන්න බැරි ලෙස මිනී මරණ කොට යාලේ ගම යයි නම් තබලා

මසින් මසට සඳ මෝරන විලසට වැඩෙන අලිය සිත සන් තොසි නේ
යසින් අපට පෙර ජාති ණයට නම් ලැබුණු වැඩක් කරමුව ඉති නේ
රොසින් උරණ වී මිනී මරණ කොට සභාපතිට මොහු එපා වුණේ
ගොඩින් දීල වෙන තැනකට අලියා මුදල් අරන් සිත සතුටු වුණේ

නික්ම ගොසින් මහ සෙනගක් එකතුව පුරන් බාස් හට කතා කළා
දුක්ම නිසා දන් වෙච්ච විපත දැන යමු අපි කව්රුත් රට හැරලා
රක්ම තමයි පණ අලිය විකුණුනොත් කියා කෙනෙක් හට බාර කළා
අප්පු සිංඤෝ මෙම මුදලාලිට දුනි පවුම වලින් සියයක් ගැනලා

යන්ඩ තැනින් තැන නැර මුදල අලි යාලෙ ගමය බව දැන ගත්තේ
කන්ඩ කෑම දීමට ලී ඇදුමට කෙනෙක් නැතිව සිත ගිනි ගත්තේ
ඉන්ඩ මෙලොව හේතුව මදිවා නම් පන යනවා විතරකි ඇත්තේ
මණ්ඩදෙණිය මෙම කරාගෙ මරු වයි අලි බැලුමට ඉල්ලා ගත්තේ

කණා ඉතින් සිට උඩහු කමට බැන ලී ඇඳුමට වෙලකට බැහැලා
දරා සිතින් මෙම වැඩ කරවන කොට උමතු ගතිය අලියට සැදිලා
සොරා සිතින් සිට පල්ලට හෙළමින් හෙන්ඩුව අරගෙන පොඩි කරලා
මරා දමා අනිමින් එමද රැ ශතප්පනාවේ වතු පාළු කලා

මුලා දූකට පත්වෙලා මෙගමවල සියලු දෙනට සිත බිය වැදුනෝ
බලා නොයිද අපි මුලාදූනි වරු උසාවියට කීවයි ගොසිනෝ
ලොලා සිතින් නඩුකාර දිසාපති අලි මැරුමට ඇවිදින් මෙදිනෝ
වීලා නික්ම ගල් දොළොල් ඇවිද ගෙන තල්ගහ කන්දට ගොඩ වැදුනෝ

වැඩි කරමින් මහ සෙනගත් ඇතුවම නඩු කාරය වනයට ඇදුනෝ
කඩ නැතුවම මෙම අලිය මරන්නට රටේ මහත්මය එකතු වුණේ
වැඩ නැති අයෙකුට දීල තුවක්කුව වෙඩි තිබුවයි මරු බලා ගෙනෝ
ඉඩ නැතුවම බඹ පනහක් දුවමින් අලිය එතැන වැටෙමින් මැරුණේ

ඇත තව කරුණක් දෙපාර වෙඩිහඩ ඇසෙන කොටම වට කර ගත්තේ
සිත බිය නැතුවම පණගිය බව දූන සමහරු පිට උඩ ඉද ගත්තේ
ගත සුදු සොද නඩුකාර මහත් තැන් කිවු ලෙස අවි ආයුධ ගත්තෙත්
අතපය කන් කපමින් ගෙන්නා ගෙන ගියයි ඉවර කර එම වැත්තේ

රැස්කර ගත් පව කියන්න නිසි ලෙස විස්තර වශයෙන් ඇසුවෙ මමයි
දුෂ්කර පැමිණෙයි එන සංසාරෙදී තව කිව්වොත් පරතෙර තැන බොහො මයි
කොච්චර සිත බිය නැතුවම සිටියත් සංජීවය මොහුටම උරු මයි
මෙච්චර ආයුෂ ඇති අලි මැරුවේ මුදුන් කොටුවෙ හොර හාමි තමයි

# නෑදුරණ හෙන්ද්‍රික් රාමචන්ද්‍ර අප්පුහාමි.

රත්නපුර නෑදුරණ ගතේ ලන්ද නැමැති ගම් ප්‍රදේශයේ විසූ මොහු ප්‍රසිද්ධ කවියෙක් විය. අවස්ථාවට ගැලපෙන පරිදි කවි ලිවීමෙ හා ගායනයෙහි දක්‍ෂ මොහු බොහෝ අවස්ථාවලදී කියන ලද කවි වලට අමතරව පද්‍ය පොත් ද ලියා ඇති බව කිව යුතුය.

ශරීරයේ ජරා ලකුණු සලකා බලා රාමචන්ද්‍ර අප්පුහාමි කවියා කියන ලද කවි දෙකක් මෙසේය.

සිරස කෙස දලි සුදු පැහැ ය සහ කටදත් වැගිර දෙකොපොල ඇකිලී
දෙඇස පෙනුමක් නැත දෙකන බිහිරිව ගොස් සිරුරු කළු තල කැලලී
වයස අට සැට තුල ජරා යකිනිය ලේ බිබී කා මස් වැදලී
මෙලෙස කල පසු මරු සමඟ යුධයට තුන් සරණ යම් බැද ඇදලී

ජරා යකිනිය හෙමි හෙමින් ඇවිදින් කලින් සල මුකුළු කර කර
උරා ලේ ටික මිදින් මද බී දුබල කර දමී හොරෙන් මා වෙර
හොරා රොද මරු වද කලන්නේ අනෙක මිස බැන තදින් යුද කර
මරා ගන්නට තැත් කරයි දූන් අදට ගෙන යමි කියා යම පුර

රාමචන්ද්‍ර අප්පුහාමි කවියා තමාගේ දතක් බුරුල් වී වේදනා ගෙන දුන් අවස්ථාවක කියන ලද කවියක් මෙසේය.

අදත් සත්වට වසක් මට උපකාර කරලා ගියේ වෙන් කර
එදත් අත්හැර දමූ දුක නොදනුනේ වැළඳූ නිසයි රස හර
මෙදන් ලත් දුක දන් දනෙන්නා මොහොතකුත් නොසිටින්ට වෙඩි සර
ඔබත් හක්කේ අනේ පලයන් මෙන්න වැන්ද නොකර හිරි හැර

අන්තිමට දත ගැලවී වැටුණ අවස්ථාවේ දී ඊට සතුටුව කියන ලද කවියක් මෙසේය.

උපන්ද සිට තනිව ගෙවූ මුත් මෙමට සතුරන් රැස් වුණා
කොහෙන්දෝ ඇවිදින් දෙතිස් දෙන දෙපිල සැදිලා වට වුණා
ඔවුන්ගෙන් එකිනෙකා යම පුර ගොසින් අද නිදහස් වුණා
ඉතින් දූන් මට සතුරු බිය නැත කියාලා දීව සැන සුණා

රාමචන්ද්‍ර අප්පුහාමි කවියා දිනක් ගමනක් යද්දී අතර මගදී හදිසියේම ක්ලාන්ත ගතියක් ඇතිවී ඇද වැටුණේය. මද වේලාවක් එතැනම හිද පියවි තත්වයට පත් වූ පසු මෙ කවි කියා ඇත.

අතපය දූන් නැත වලංගු
සිත නිතරම කඩී කලංගු
බත හිහකම නිසා කොංගු
වෙලා ගොසින් උනි තලංගු

නාකි කමට වෙව්ල නවා
තිබූ හයිය හැකිලෙ නවා
තරුණ වයස සිහි වෙන වා
මීට හොදයි මීය යනවා

මිය යාමට සතුටු උණොත්
මරණ දුකේ රඟ දුණු නොත්
නොමැරී තව මොහොතක් වත්
ජීවත් වන්නටම සිතත්

සසර සයුර පිනන වා
එහි පරතෙර නොපෙනෙන වා
අතර මඟදී මිය යන වා
නැවත එහිම උපදින වා

බැරිනම් තද දුක් විඳින්න
නැවත සසර නූප දින්න
ලද පමණින් දනක් දෙන්න
ඕනෑ හොඳ සිල් රකින්න

දේශනාව රස මිහිරකි
වාසනාව පුරුදු දෙයකි
ඒ මනාව සිහි කෙරුමකි
භාවනාව උතුම පිනකි

මොහු මාහිංගොඩ ගෙදරක් සමීපයෙහි මිත්‍රයෙකු එනතුරු නැවතී සිටින අතර ඒ ගෙදර හොඳ රතුවන් තරුණියක් මොහු ළඟට විත් ඇය ගැන කවියක් ලියා දෙන ලෙස කීවා ලු. ඇයගේ ඇඳුම මොහුට මහා විහිළුවක් සෙයින් මෙහි පහත දැක්වෙන කවිය ලියා දී වහා ඉන් නික්ම ගියේලු.

ගනරන් සිරුර තන රණ හස පැටවු වගේ
සොබමන් උවන පෘයන පුන් සඳක් වගේ
සිරුරෙන් සිතා බැලුවම දෙව් ලියක් වගේ
ඇඳුමෙන් පෙනෙන්නේ පල් මෝඩියක් වගේ

අවුරුදු 15 ක් පමණ වයසැති ගැහැණු ළමයෙකු පාසැල් යන අතර මඟදී ඇය නවත්වා පහත දැක්වෙන කවි දෙක ඇයට ලියා දුන්නාලු.

විලිබිය දෙක මුළු ලොව පාලන කෙරුම
විලිබිය දෙක උතුමන්ගේ දෙව් දනම
විලිබිය දෙක අතුරුදන් වූ හැටි පුදුම
විලිබිය දෙක නැති ගවුමකි කොට ගවුම

නැතැයි කියා බොහො දෙනෙකුගෙ ගැරහීම
හොඳයි කියා ටික දෙනෙකුගෙ පිළි ගැනුම
රසයි කියා මල මූ ගෙන වැළඳීම
වගෙයි සොයා බැලුවෝතින් කොට ගවුම

රාමචන්ද්‍ර අප්පුහාමි කවියා දිනක් කිසියම් ගමනක් යන විට කඩයක් ඉදිරිපිට මැස්සක ඉඳ හිස පීරණ තරුණියක් දැක්කේය. ඒ වනම ඔහුට ආ කවි සිතුවිල්ල මෙසේය.

පීරණ නිල් වරලා සිකි පිල් සේමයි බබලන් නේ
මෝරණ තන මඩලා හස පැටිදෝ ළැමපිට ඉන් නේ
දරණ සුසැට කලා රති කෙළි මායම් අහවන් නේ
කාරණ කිම නොබලා අප දෙස ළඳෙ පිටුපා ඉන්නේ

එමෙන්ම දිනක් මොහු මුත්තෙට්ටුවේගම රටේ මහත්මා බැහැ දකිමට ගිය අවස්ථාවක රටෙ මහත්මයා

" උපාසක කමට නෝබිය රා බීම "

යන කවි පදය කියා එය සම්පූර්ණ කර කවියක් කියන ලෙස දැන්විය. එවිට රාමචන්ද්‍ර අප්පුහාමි කවියා මෙසේ කියා ඇත.

අපායට යන්ට මා වත සැදිම
එපාකර අපට මුනිඳුන් කී කිම
විපාකය විඳිති දවසක තුඹ ලාම
උපාසක කමට නෝ බිය රා බීම

රාමචන්ද්‍ර අප්පුහාමි තවත් දවසක පාර අද්දර ගසක් මුල ඉඳගෙන සිටි අවස්ථාවක පාසැල් ගොස් ගෙදර යන දැරියක් ඔහු හමුවට පැමිණ අවවාදයක් සහිත කවියක් ලියා දෙන ලෙස ඉල්ලා සිටියාය. එවිට ඔහු මෙ කවි ටික ලියා දී ඇත.

01. මග බැස යන කල ට
හැරි නොබලන් වට පිට
සමණළයා ලෙස ට
නොයන්, පලයන් ගමන හෙමිහිට

02. සදිසාවෙහි නිත ර
හැරී ගොස් විපරම් ක ර
කරණා පියා ස ර
සතෙක් නොමදුටු වෙහිද මින්පෙර

03. ඒ ගමන ඔහුට ම
නියම කර ඇත ලොදහ ම
අපට ඒ ගුරු ක ම
සිතා ගත්තොත් වේ විනාසෙ ම

04. සමණළයා නමි න
සතෙකි වේගෙන් දුගිංල න
උඩයට වම දකු ණ
නොහැර බලමින් ඉදිරියට ය න

05. ගමනේ විලස එම
පැමිණේ නිතර ඔහුට ම
වෙන සතෙකු ට එහෙ ම
බැරිය අල්ලා ගැනුම සිත පෙම

06. මෙත් සිතින් තුඹට ම
ලියා දෙන ඔවදන් මෙම
බලා දැන තතු සැම
සතුටු වෙනු දුවණියනි දෙලො වම

රාමචන්ද්‍ර අප්පුහාමි කවියා කලක් අතපය කොරවී රෝගාතුරව සිටි බව සඳහන් වෙයි. එකල ඔහු ලියන ලද කවි පොතකින් උපුටා ගත් කවියක් මෙසේය.

දැත දෙපය කටිය කොන්ද දිඅගහිම කොට අතුරු සිදුරු
වාත රදය කින් පෙළනා බව සැළවී ගුණ නැති මරු
ඇත සිටන් මොර හඩ දී ගනිමින් තඩි පොලුද මුගුරු
බීත වනසෙ වෙස් පාමින් නටයි ඇවිත් සිටම නුදුරු

# දෙඩම්පෙ බාලහාමි වෙද මහත්මයා.

රත්නපුර දොඩම්පෙ ප්‍රදේශයේ විසූ ගැමි කවියෙකි. සාමාන්‍ය අවස්ථාවලදී හිතූ යමක් හිතූ හැටියේ කීමෙහි හැකියාවක් ඇති කවියෙකු ලෙස ප්‍රසිද්ධව සිටියේය.

දිනක් බාලහාමි වෙද මහත්මයාගේ භාර්‍යාව ඔහු හා අමනාපයක් වී ගෙදරින් යන්නට ගොස් ඇත. ඇය රත්නපුරට ආසන්න තිරිවාන කැටිය ප්‍රදේශයේ ඥාතියෙකුගේ ගෙදරක නවාතැන්ගෙන සිටියාය. තම භාර්‍යාව ගෙදර නොමැති වීමෙන් කනස්සල්ලට පත් බාලහාමි වෙද මහත්මයා පහත සඳහන් කවි දෙක ලියා ඇයවෙත යවන ලදී.

පැපත නගන දිගු වරල සිහි යුක්තය
බෝනෙත දිලුන රැඳූ හඩ වදන් ඇත්තිය
ඒ කත වීයෝ දුක්මැද මහද චිත්තය
මා වෙත දයා නැති බව මෙමට සත්තය

පෙර කාලේ විඳපූ සැප මතක් වෙන කොට
දර මැලේ සේම දනවා මහද යට
ගිරි කුලේ නැගී ගියද දඹුල්ල ට
තිර කළේ නැද්ද මතු වෙන් නොවෙන් නට

# උක්කැත්තෙ කන්දෙ ලේකම්.

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කුකුළු කෝරළයේ අයගම විසූ උක්කැත්තෙ කන්දෙ ලේකම් නැමැති අයද කවි කීමෙහි හා ලිවීමෙහි ද දක්ෂයෙකු විය.

රත්නපුර ප්‍රදේශයේ ගම් සමූහයක නම් ඇතුලත් කොට රචිත කවි කීපයක් මෙසේය.

එල්ලාවල ද අකුරණ මාටුවා ගල
ඉඩංගොඩ හාන්දු කන්ද ද කිරි ඇල්ල
කොට පිටි ගෙදර ගලතුර ගම් මැද්ද ගල
අරඹේ ගමට උඩුගල සරි ද පර ගල

හාන්දු කන්ද කලු කරපුව ගඟු ලැල්ල
ඉඩන්ගොඩ තොටෙ දෙගොඩම සුදු වැල්ල
රාජ පිරිස සිටලා ගීය පව නැල් ල
ගම් දෙළහට නායක ගම කිරි ඇල්ල

එක් දිනක් කන්දෙ ලේකම්ගේ ඉඩමෙහි තිබූ හබරල ගසක් හොරු ගලවා-ගෙන ගොස් තිබුණි. මේ ගැන ඒ අවස්ථාවේ ඔහු කියූ කවියක් මෙසේය.

නාමේ උක්කැක්තෙ කන්දෙ මැද වත් තේ
රෑ මේ හොරා ගොස් හබරල බිඳ ගත් තේ
මූ මේ කළදේට දෙවියෝ නොකැමැත් තේ
නාමේ සොරා සිටීද දූන් ඔය පැත් තේ

තවත් අවස්ථාවක කිසියම් කාන්තාවක් ගැන කියන ලද කවියක් මෙසේය.

සල්ලා ලය කත කියනා කවිපද ගුගුරණ මහ මෙර සේම ඇසේ
සොල්ලා පියයුරු බලලා මාවත කියනා කවි පදයකි මෙලෙ සේ
දුල්ලා වත ඇඟෙ මූණ බලනකොට මා සිත සැනසුම් බැරිය කෙ සේ
එල්ලා ගල ගෙල මුදුනේ සිටගෙන කවි කිව්කත සුරහන විල සේ

තවත් අවස්ථාවක කුකුළු ගඟේ තොටුපල දී කියන ලද කවියක් මෙසේය.

කුකුළු ගඟේ තොටුපලේ සැටිය මට කියන්ට යන්තම් සිහිවෙන වා
ගඟේ පළල වේවැලේ දිගටමයි හැටපස් බඹයකි මැන බැලු වා
සලා දිදී හෝසාවකි ජලකඳ ගල් අස්සෙන් පෙණ මතු වෙන වා
අවුරුද්දට තුන්දෙනා කනත්තුවෙ කුකුළු ගඟට බිලි කැප වෙන වා

# කුට්ටිකන්දෙ මල්හාමි කවියා.

රත්නපුරේ කුට්ටිකන්දේ විසූ මල්හාමි හිටිවනම කවි කීමෙහි දක්ෂයෙකු විය. මල්හාමි කවියා වඩාත් දක්ෂයෙක්ව ඇත්තේ වස්කවි කීමටය

දිනක් තමා ඉතා ආදරයෙන් ළඟ තබා ගෙන සිටි පිහියක් කෙනෙකු සොරා ගෙන ගොස් තිබුණ අවස්ථාවේ මල්හාමි කවියා හොරාට විරුද්ධව කියා ඇති වස්කවි දෙකක් මෙසේය.

සුරුවින් හැටියට විස්තර වඩුමිට ගලතුරෙ නැන්දළමා දුන් නේ
පුලුවන් හපනෙකි යසගම පිටියේ රිදී විල්ල තනලා දුන් නේ
සුරුවන් හැටියට පිහියේ තනලා ලත් පඳුරෙදි නිමකර දුන් නේ
දරුවන් අතකින් වැටිලා තිබුණත් හොරාට යවහත් වැද ගන් නේ

කොපුව තියෙද්දී පිහියේ අරගෙන කවුද සොරෙක් සඟවා ඉන්නේ
පපුව පැලෙනවද අනුන්ගෙ බඩුවට දුටු දුටුවන් සිතු ලොබ වන්නේ
ඉඳුරු දිගින් මහසෝනා ඇවිදින් සිය බොටුවට අත දී පන්නේ
වඳුරු කුරුම්බර ඉසට නැගීලා පිහිය ගෙනල්ලා මට දෙන්නේ

කුට්ටිකන්ද ප්‍රදේශයේ කෙනෙක් දුක් මහන්සියෙන් වගා කරගත් කුරහන් හේනක් දින කීපයක්ම වල් අලියෙකු පැමිණ විනාශකර දමා ඇත. මෙ ගැන කුට්ටිකන්දෙ මල්හාමි කවියාට දන්වන ලදුව ඔහු වස් කවියක් සකස් කරදී ඇත. එය මෙසේය.

උස මහතින් වන්ස ඇතුව හිමයට අධිපති වූ කෙණෙ ක
දස ධර්මෙට ඇතුළත් වූ රජ කුලයට පිට දෙන හෙක
වස් නැත මම කියන මෙකවි කස්සප මුණිඳුන් අණ සක
ඇස් දෙක වන වෙයි වෙඩී වැද කෑවට කුරහන් රොනෙ ටික

# කිරිඇල්ල ඒදණ්ඩමුල වත්තේ ලොකුහාමි විදානෙ මහත්මයා.

මෙයට අවුරුදු එකසිය පනහකට පමණ පෙර ජීවත් වූ බව සඳහන් වන මොහු සපරගමුවේ පැරණි කවි පරපුරෙහි ජනප්‍රිය කවියෙක්ව සිටි බව පෙනේ. අපේ පැරණි කන්නලව් යාදිනි සම්ප්‍රදයට අයත් කවි ලිවීමට ඔහු වඩාත් දක්‍ෂ විය. වරක් පැල පොල් සොරකමක් ගැන ලොකු හාමි කවියා රචනා කරන ලද කවි පත්තියක් මෙසේය.

සරණින් සරණය ගත්තෙමි මාවට නාග දරණ සත් ගෙට සරණේ
සරණින් සරණය ගත්තෙමි කකුසඳ කෝනාගම ගෞතම සරණේ
සරණින් සරණය ගත්තෙමි මක්කම සමනල සිරිපාදේ සරණේ
සරණින් සරණය ගත්තෙමි සයානු කෙල ලක්‍ෂය රහතුන් සරණේ

සැරේ සමන් දෙවියෝ දෙතනිය ගල මුදුනේ වැඩ ඉඳ ඇරපු සැරේ
සැරේ වැඳුනි පරුවත සිදුරුව ගොස් බිබිලේවෙල මැද අකුණු සැරේ
සැරේ මෙතුන් ලොව අණසක විහිද රාම රජුට ඇද විදපු සැරේ
අනේ මෙපැල පොල් කාපු සොරාටත් ඇරියොත් දෙවියනි රාම සැරේ

මලුත් පඩුරු පුද කරමින් දෙවිඳුට දොහොත් මුදුන්දී පවසන්නේ
ගලක් කැපූ ඒ බලය පෙනෙන්නට ලොව සතහට දෙවිඳුගෙ වරුනේ
මුලුත් මෙසක්වළ සත විදිනා දූක බලා මෙසිරිලක වැඩි ගමනේ
අලුත් නුවර දඩි මුණ්ඩ දෙවිඳු තව මන්දැයි සොරු නොමරා ඉන්නේ

සතර මෙතොට මුණු පසුකර යන්නට සතර අතට තද වෙඩිල්ල නේ
සතර මහත් ගල් පහුරත් පැදගෙන සීනිගමට වැඩියා කිය නේ
අතර මගදී නැවගිලී තැනින් තැන පීනා ගල් පහුරට වඩී නේ
එතෙර දෙවල් රට සිට ආ දෙවියනි සොරා දූස කන කරන් මෙනේ

රුවල් අදිති නැව් උතුරු දිසාවය බලා එන්ට සිංහල දේසේ
දවල් කොම්බු හොරණෑද වෙඩිලි හා කරති පංචතූරිය ගෝසේ
යහල් පුලුන් රැල් ලෙසට පලා ගිනි කඳු හතරක් මැව් පතිනි මෙසේ
දෙවොල් එගින්දර සුන්කර දමු ලෙස සොරා මරන් දෙවියනි විගසේ

බලෙන් එයස තෙද එගිනි කුරුම්බර දෙවොල් සමහ වඩිනා ගමනේ
පෙළින් පෙළට නැව් හතක් පැදන්වීත් සීනි ගමට ගොඩ බසිමින් නේ
බැලින් මැවී යත් සිංහාසන රත පිට දෙවියෝ මේ ලෙස වැඩ ඉන්නේ
පෙළින් පෙළට උගෙ අඹු දරුවන් සහ සොරාගෙ ගේ දෙර වැන සෙන්නේ.

අටවිසි මුනිඳුන් වැඳගෙන බැතියෙන් තිසරණ මුදුනේ දරමින් නේ
තුට කරමින් සිව් වරම් දෙවිඳු වැඳ අවසර ලැබ පද පවසන් නේ
රට හැමතැන නරයා රැකගෙන මතු බුදු බව පතමින් වැඩ ඉන් නේ
මට වස් නැත දෙවියනි නඩු ඇත්නම් යටහත් සොරු දෙසටම යන් නේ

ලොකු විදානෙ මහත්මයාගේ පියාණන් ද අභාවප්‍රාප්ත වූ අවස්ථාවේ ඒ ගැන සංවේගයෙන් කියන ලද කවියක් මෙසේය.

අනේ මෙදුන් ළය පැළෙන තරම් දුක ඉවසා ගන්නට බැරි ඉතිනේ
පෙනේ ඇසට මා එනකොට පිළිපිට රත්රන් රූපය තිබු ලෙසිනේ
මෙතේ සිතක් නොව අප රැකි පියරජ දකිනේ කොයි කාලෙද ඉතිනේ
බණේ ලෙසින් ඔබ සිත පහදගෙන නිවන්ම දැකපන් පිය රජු නේ

කලවානේ කබරගල කඳු මුදුනෙන් පහලට ඇද හැලෙන ක්ෂීර වර්ණ ජල ප්‍රවාහය කිරි ඇල්ලක් සේ කඩා වැටෙන නිසා මෙම ප්‍රදේශයට කිරිඇල්ල යන නම යෙදුන බව කෙනෙකුගේ අදහස වෙයි. මෙ ගැන ලොකු හාමි විදානෙ මහත්මයා ලියන ලද කවියක් මෙසේය.

සෝම සදිසි සුදු පාටින් බබලන කබර ගලෙහි සොඳ කිරි ඇල්ලේ
සෝම රිදී කඳ ගල මුදුනෙන් බැස ගෝසා තදින් ගහු ලැල්ලේ
නාම පසිඳු සොඳ හාන්දු කන්දේ තලගහ හේනකි ගල පල්ලේ
ප්‍රේම සිතින් අපි හේන කෙටෙව්වා නෙළු මෙන් අතපසු උණුගොල්ලේ

# ඒදණ්ඩමුල වත්තේ මුදලිහාමි ලේකම් මහත්මයා.

කිරිඇල්ල ඒදණ්ඩමුල වත්තේ මුදලිහාමි ලේකම් මහත්මයා ලොකුහාමි විදානෙ කවියාගේ සහෝදරයෙකි. මේ පවුලේ සිප දෙනෙක්ම කවි කීමෙහි හා කවි ලිවීමෙහි දක්ෂයෝ වූ බව සඳහන් වෙයි. අදත් මේ පරම්පරාවෙන් පැවත එන අය කාව්‍ය කරණයේ දක්ෂයන් වූ බව සඳහන් වෙයි.

තමාගේ වත්තේ ගසක රඳවා තිබූ පැණි පිරුණු මීවද සහිත මීයක් ඇති මුට්ටිය දිනක් කිසියම් කෙනෙක් සොරෙන් ගෙන ගොස් තිබුණි. මේ ගැන දැන ගන්නට ලැබුණු අවස්ථාවේ මුදලිහාමි ලේකම් මහත්මයා මේ කවිය කියා ඇත.

මුට්ටි නමා තබමින් සොඳ බඩ වෙ ටිය
ඉෂ්ට වෙලා වැසිකඳ ඇවිදින් සි ටිය
දුෂ්ට සොරෙක් දැක නෙළමින් වද කැ ටිය
අෂ්ට ගණේ මුලකුරු උගෙ බඩට විය

තම සහෝදර ලොකුහාමි මෙන්ම වස්කවි කීමෙහි දක්ෂ මොහු ද වස්කවි ලියා ඇත. පැලක් තුළ තිබූ බඩු සොරු ගෙන ගියෙන් කියන ලද වස්කවි කීපයක් මෙසේය.

ලොල්ලේ වඩන අනසක සිරිලක පැතිර
ඇල්ලේ රබලියට බල පෑ පතිනි තිර
එල්ලේ බලා පැලෙ බඩු අරගත් පැහැර
බෙල්ලේ උරිරු ගත් උගෙ මල් කුරුම බර

බෝ කල සිටන් දුදනා මට උන වයිර
මේ කල අනඩු දිවසින් බලමින් නැර
පෑ බල සිරි ලකට පරසිඳු අණ දීර
වාහල දෙවි අණින් සොරු මරු හට බාර

ඝෝර යකුන් හට තෙද පෑ සුමන සුර
නැර සපරගමු මන්දිරයට බාර
වාර ගණන් දුදනා මට කළ නපුර
රිරි සොහොනාට හොරු දුන මැන බාර

ඉඩමෙහි පැල පොල් සොරකමක් ගැන කියන ලද වස් කවියක් මෙසේය.

වීරිය කර මම වවමි සිතාලා අරන් සිටෙව්වෙමි පොල් දහයක්
කාරිය මෙහෙමයි අපට කරණ දේ එයින් කාපු සොරු පොල් නවයක්
නෑරිය දුදනා මේ සැටියෙන් මම වවා ගන්ට එක පොල් පැලයක්
සූරිය දෙවියනි නඩුව බලාලා සොරා මැරෙව්වොත් වේය සෙතක්

තවත් දිනක තමාගේ ඉඩමෙහි පොල් ගස්වල පොල් වලු කීපයක් සොරා ගත් සොරෙකුට කියන ලද වස් කවියක් මෙසේය.

වැට ගාවා මගෙ සුරතල් පොල් ගස් කටුලා තිබුනයි දෙතුන් පලේ
වට පිට බලමින් කටු අතු කඩමින් කඹේ ගෙනත් වලු එල්ල කලේ
සොඳ විපුලා සඳ රහස් හෙළා දැක යන ගමනයි මොහු පුරුදු කළේ
ඇද්ද ඉතින් මා පොල් මෙරෙව්වා කාපන් අම්මගෙ තණ මඩලේ

තම පුත්‍රයා අජුත කෙළියට ගිය බව ආරංචි වී මොහු පහත සඳහන් කවි දෙක පුස්කොළයක ලියා ඔහුගේ පෙට්ටියේ දමා තබා ඇත.

අඩිය වඩ වඩා සවසට එක් වෙන වා
වටපිට බල බලා ගෙරි ඇට පෙරළන වා
සූදුවෙන් ලබන පල හෙලුවෙන් යන වා
ගෙදර ගොසින් උගෙ අඹුවට බැට දෙන වා

තවත් සූදු කෙළිනා උදවියට ඇත
කොසුත් පොලුත් වත්තේ සොරු කඩා යත
කළත් ගොවි පලක් ඌරො හරක් කත
ගෙදර සිටින අඹුවත් සොරු අරන් යත

ඔහුගේ පුත්‍රයා මෙය කියවා බලා "මගේ පියා මට පාර හත අටක් තැලුවේය" කියා එදා පටන් අජූත කෙළිය නවත්වා දමා ඇත.

කරදන යටිපව් කන්දේ ඇතු පෙරලීමේ සිද්ධිය අලලා මොහු විසින් රචනා කරණ ලද කවි කීපයක් මෙසේය.

පෙර සිට පැවත එන කුරුවිටි කෝරළෙ මැද පත්තුවෙ යටිපුවව යනා
දුරු රට සිට ඇතු ඇවිදින් මේ රට වතු වනසන්නට පුරුදු උණා
කරුමෙට ඒ ඇතු දිවි වැනසෙන්නට සැවන් ගලේ මුදුනට පැමිණා
නිරයට යන්නට කරපු පවෙන් ඇතු සැවන් ගලේ පල්ලෙදි නැසුණා

උතුමන් සමඟින් ඇවිදින් මැතිවරු සතොසින් ගාලට සමඟි වෙලා
කුමරුන් දකිනට ඇතු ගෙන්වා ගෙන බැඳ දෙන්නට අවසර ලැබිලා
එ අඬින් ඒ ඇතු නගිමින් ගිය කළ බියපත් වී වල් ඇතු දකලා
සිතමින් ඒ ඇතු වැට සුන් කරගෙන යන්ට පටන් ගති වල් වැදිලා

ඊට ගමින් ගම රට ගොසින් ඇතු කොස් පොල් පුවකුත් වන සාලා
ඌට දනෙන්නට කාට නුමුත් බැරිවෙයි උණ්ඩයකින් සැර පාලා
ජාති පැතුම් වල ඊට පෙළින් පෙළ සැවන් ගලේ සිට පෙර ලීලා
ගාත බිදීගන මැත වැටීලා නැසුනයි ඇතු ඉරණම දකලා

# කිරිඇල්ලේ හාමි ආරච්චි මහත්මයා.

රත්නපුර කිරිඇල්ල ප්‍රදේශයේ උපන් හාමී ආරච්චි මහත්මා ප්‍රවීන සබරගමු නැටුම් ශිල්පියෙකි.

දේව ස්තෝත්‍ර ගායනයේ මනා හැකියාවක් තිබූ ශාන්ති කර්ම කෙරෙහි ද දක්ෂතාවයක් දැක්විය.

දිනක් තමාගේ එදිරිකාරයෙකු විසින් තම ගවයාගේ කකුලක් කපා දමා තිබෙනු දක්නට ලැබූ හාමි ආරච්චි මහතා පහත සඳහන් කරන වස්කවි කියා ඇත.

සුරතල් කාලෙදී මුදලට අරගෙන අතල් කිරි ගා මම ඇති කරලා
පෙරකල් ජාතියෙ කරපු පවක් දූන් ගොනාගෙ කකුලක් හොරු කපලා
කරවල් මාපිල් හබර පොලොංගුද කාපන් ඔකගෙ අතේ වෙලා
කිරිඇල්ලේ ගම් මුලාදෑනියගෙ ගොනා කැපූ උගෙ අත කැඩිලා

වත්තේ ඉඳලා ගෙදරට එනකොට හේනේ රන්තණ කන වාලූ
පැත්තට හැරිලා කැත්තෙන් ගැසුවම එතැනම වැටිලා තිබූ ණාලූ
ඇත්ත නැත්ත සත් පත්තිනි දෙවියෝ නඩුව විචාරා සොයා බැලූ
සත්ත තමයි උගෙ හැත්ත පිටින් අඹු දරුවන් වනසා ගෙන යාලූ

සුමෙර සුදු නළල අඩසඳ පාට ගොනා
ඉවර කොට වයස මද්දිම කරට උනා
දෙවුර බරව කැති පාරක් දූනි දුදනා
මයුර වාහනෙන් බැස මෙනඩු තෝරනා

කන්ඩ දෙයක් නැත වත්තේ ඇවිද්ද ට
කන්ඩ සිතා කැපුවේ මස් අරන් ගෙට
මුණ්ඩ දඩිය දෙවතා සුරිඳුගෙ අණට
බොන්ඩ රිරි බාරයි මරු යකා හට

# එපිටවෙල දසනායක මුදලිහාමි විදනෙ මහතා.

කිරිඇල්ල එපිටවල පදිංචිව සිටි මුදලිහාමි විදනෙ මහතා දක්‍ෂ කවියෙකි. ඔහු අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූ සෝචනීය පුවතක් ඇත.

මුදලිහාමි විදනෙ මහතා ගෙදර නැති අවස්ථාවක තමාගේම සහෝදරයෙකු විසින් ඔහුගේ භාර්යාවට වෙඩි තබා මරා දමා ඇත. කෙසේ වුවද පසුව භාර්යාව ගේ මරණය සම්බන්ධයෙන් චෝදනාව එල්ල වූයේ මුදලිහාමි විදනෙ මහතාට මරණ දඬුවම හිමිවිය.

වරදකරු වශයෙන් වූදිත මුදලිහාමි විදනෙ මහතා එල්ලා මැරීමට නියමවිය. එවකට රත්නපුර ප්‍රදේශයේ මරණීය දණ්ඩනයට ලක්වූවන් එල්ලා මරණ ලද්දේ රත්නපුරයේමය. මරණයට නියමව සිර ගෙදර සිටින අවස්ථාවේ විදනෙ මහතා රචනා කරණ ලද කවි කීපයක් මෙසේය.

කරුණාවෙන් සැළ කරන්ඩ කුරුවිට හාමුදුරුවන් ඩ
ගරු නායක ජය සුන්දර මැති නිළමෙත් සිතට ගත් ඩ
පිරුණා මට වයස ඉතින් දහනමයක් විතර වෙන් ඩ
මැරුණායින් හොඳයි කියා මලයා කී පැරද යන් ඩ

සීතාවක මහ වාසල පටන් පැවති දසනාය ක
ආතා මගෙ නැතුවායින් දෙහෙම උනේ මේ විපතෙ ක
ගාතා තුන සිරි මුඛයෙන් වැදූරුවේ මරණය දූක
ආතා වරු සිටින සඳෙන ඉතින් මෙමට වෙන පිහිටෙ ක

අන්ද කාර නැතුවද මා සිටලා ආ ගම්මින් ඩිය
නින්ද නොයයි රෑ තුන්යම දූසේ කඳුළුත් එනෙ කිය
කින්ද ඉතින් සැනසෙන්නේ ඇතුවා නම් අම්මණ් ඩිය
මන්ද පියාණෝ තුන්දෙන බලා ඉන්නෙ මැරෙණ සැටිය

# දූම්බර නෝනන්චි කංකානම.

රත්නපුර කුකුළු කෝරළයේ කළු ගඟ බඩ පිහිටි දූම්බර ගමට අයත් උඩ පස්ගම විසූ දූම්බර නෝනන්චි කංකානම නැමැති අය දිළිඳු ගොවියෙකු බව සඳහන් වෙයි. පාණ්ඩිත්‍යයෙන් රචනය වන කවිවල දක්නට නොලැබෙන අව්‍යාජත්වය බොහෝ විට සාමාන්‍ය කවියන්ගේ රචනාවල දක්නට ලැබේ. විශේෂයෙන් සරල වූද - ස්වාභාවිකවූද කවි කියවුණේ හා ලියැවුණේ පාණ්ඩිත්‍යයෙන් තොර සාමාන්‍ය කවියන් වෙතින් බව පැහැදිලිව විමසා බලනවිට පෙනේ. දූම්බර නෝනන්චි කංකානම කවියාද මේ ගණයේ සැළකිය හැකි කවියෙකි. තමාට විහිළුවක් කරණ ලද ළමයින් පිරිසකට දිනක් නෝනන්චි කංකානම ලියූ කවි කීපයක් මෙසේය:

හවස් වෙලා මම යන කළ හක්තිනෝක්ගෙ කුඹුරෙ පැලට
දවස් එකක දෙකක පමන කතාකරණ එකතුව සිට
වයස් බාල ළමයි ඇවිත් අතු සිටුවපු පැලේ අවට
නමස්කාර කර වැන්දෙමි පැලට කොහොලු නොක රන්නට

යහළු මිතුරු නෙනෙක් වගේ ගොඩ වැදිලා බංගල වට
විහිළු වැඩක් කරල තිබුණි අතු සිටුවා දොරටු වටට
කනාලු කැපිල ඇඟ හැම තැන බටකොළ ගෑවිල වට පිට
විහිළු කවට කෙළේ මන්ද බංගලයෙහි මෙම විල සට

තමාගේ කුඹුරෙහි ගොයම් කන හාවෙකු ගැන ලියූ වස් කවියක් මෙසේය.

කොන්ද තර ඔලුගෙඩිය කන්දෙක උඩින් බොකටුව පෙනෙන්නේ
ලන්ද පඳුරක දවල් රැක සිට හවස් අඳුරට එළි බසින්නේ
අන්ද කලුවර රැයේ පැනගොස් කුඹුරෙ තැන තැන බෙටිගහන්නේ
මන්ද පෙර කළ ජාති වෛරද හාවො තෝ මගෙ ගොයම කන්නේ

එන්ඩ වෙලා හොර හාවා කුඹුරක ට
කන්ඩ ගොයම සිට කපතී ඉපල් වැට
මුන්ඩ දූඩිය අණ ඇත්නම් මේ ලොව ට
දෙන්ඩ බැරිද හාවා බක මූණා ට

# රත්නපුරේ මෝසෙස් තිලකරත්න මුදලි තුමා.

මොහු පිළිබඳ වැඩි විස්තර සඳහන් නොවේ. එහෙත් හිටිවනම කවි කීමෙහි දක්ෂයෙක් බව සඳහන් වෙයි. ව්‍යංගයෙන් අදහස ඉදිරිපත් කිරීමට හැකියාවක් ඔහුට තිබූ බව කවි රචනාවලින් පෙනේ.

රත්නපුරේ බුළුතොට නැමැති ප්‍රදේශයෙන් පැමිණි කාන්තාවක් වරකතොටෙ පාලම යට කලු ගඟේ දිය නාමින් සිටිනු දැක තිලකරත්න මුදලි තුමා කියන ලද කවියක් මෙසේය.

ඉපලින් එකක් මැදවත් පියසෙහි　　　වසන
පස පස තුනක් හැර රිවි අඳුරු දුර　　　ලන
අහනෙක් සිටිති පිරිවර සමඟ යන　　　එන
රස එල වැල බුදින තොටුපල බැස　　　නාන

මෙහි "තිපල්" නම් අරළු – බුලු – නෙල්ලි වෙයි.
තිපලින් එකක් මැදවත් දේශයයි කීවේ බුලුතොටටය.
රසඑල වැලබුදින තොට නම්; වරකා තොටය.

# නවදූන් කෝරළේ කර්තේලිස් අප්පුහාමි ගම ආරච්චි මහතා.

පැරණි සබරගමු කවි පරපුරේ කවියෙකු ලෙස හඳුන්වා දියහැකි කර්තේලිස් අප්පුහාමි මහතා ලියන ලද කවි ද රසවත්ය. ඔහුගේ රචනා බොහෝ වශයෙන් හමු වී නොමැති වුවද එම කවි අර්ථවත් බවකින් යුක්තය.

ඔහු තරුණ වියේදී කොටාමුල්ල ප්‍රදේශයේ තරුණියක් සමඟ මිතුරුව සිටියේය. එහෙත් ඇයගේ දෙමාපියෝ ඇයව වෙන පළාතක කෙනෙකුට විවාහ කර දී පිටත් කර හැරියේය.

මෙම සිද්ධියෙන් කම්පාවට පත්වූ කර්තේලිස් අප්පුහාමි පහත සඳහන් කවිය ලියා ඇය වෙත යවා ඇත.

බටා සුරපුරෙන් සුර අහනක් ලෙසිනි
නටා ගී කියා ගිය ලෙස මට දූණුනි
සිටා මෙම පෙදෙස අත්හැර ගිය බැවිනි
කොටා මුළු පෙදෙස අද අඳුරු යි ළඳුනි

# මාරපන අංගප්පුලියා.

මාරපන විසූ අංගප්පුලියා නැමති අය වඩාත් ප්‍රසිද්ධව සිටියේ විරිඳු ගායනයටය. අංගප්පුලියාගේ පරම්පරාවේ බොහෝ දෙනා විරිඳු ගායනයට සහයෝගය දුන් බව දැන ගන්නට ඇත. වරක් උත්සව සභාවක දී තවත් විරිඳු ගායිකාවක් සමඟ ඔහු කියූ විරිඳු ගායනයක් පහත දැක්වෙයි.

පුරුෂයා:—
පැල දෙරට ලූ අගුල් පොල්ල ම ට
අසුවුනි නම් දෙමි මේකිට තද බැ ට

ස්ත්‍රී:—
මැහැළි වෙලා මට වෙච්ච වැරැද් ද ට
ඔහොම කරන්නට එපා වාගෙ ම ට

පුරුෂයා:—
බෝකුන්දර සිට ගෙනා රිදියෙ ති ට
බැ අන්දමකට කවිය කියන් න ට

ස්ත්‍රී:—
මේ මිනිහා මට නින්ද කරණ ව ට
මා ගෙනිහිල්ලා දපන් ගෙද ර ට

පුරුෂයා:—
මට්ටමකට තී නොතැකු වර ද ට
පට්ට රිදීයේ දූන් පල ගෙද ර ට

ස්ත්‍රී:—
කටට මෙමිනිහා එක්කම ආ ව ට
මොට්ට කමට මම යන්නද ගෙද ර ට

පුරුෂයා:—
ඇයී බොල රිදියේ ගමට නොයන් නේ
දයි ගලයන් තිගෙ වාගෙ කියන් නේ

ස්ත්‍රී:—
අයියෝ මේවා කවද කියන් නේ
දෙයියෝ ඇත්නම් උඹ මරවන් නේ

පුරුෂයා:—
වෙල්ලා හැලියත් බිඳල දමන වා
බොල්ලෑ මේකී මරල දමන වා

ස්ත්‍රී:—
සිල්ලර ගෑණුන් පස්සෙ දුවන වා
කල්ල මෙමිනිහට එල්ලෙ කරණ වා

පුරුෂයා:—
එක්ක එන්ට ගිය දවසේ තී මන්
ඔක්කොම නෑයෝ අහක් කළා මන්

ස්ත්‍රී:—
මක්කද වරදක් දුටුවේ නෑ යන්
එක්ක නොකැවේ උඹේම වර දින්

අනේ බොලන් වාගෙ උඹට මට කියන්ට මෙ සබ යේ
කනේ දමන පවලම් විකුණා කා ගෙන් ගෙට ඇවිද ගි යේ
පනේ උඹට නම් මට දූන් කවි කියන්ට නෑ පිරි යේ
උනේ වරද මට හරියට නරියට සිදුවුණ සැටි යේ

පුරුෂයා:—
හොඳ හොඳ රිදීයේ ඇපුල්ලුම දෙකට බෙද ගන්නා
මෙද යලේ දිවෙලුත් සරියට දෙකට බෙද ගන්නා
වද පු දරු බිළිඳුන් සරියට දෙකට බෙද ගන්නා
රද කමෙ අකුසල් සරියට දෙකට බෙද ගන්නා

ස්ත්‍රී:— එහෙනම් මිනිහෝ මෙහෙම කියාපන්
කොටහළු ගත්තේ නැතැයි කියාපන්
වියන් බඳින්නේ නැතැයි කියාපන්
ඇපුල්ලුමත් මට බැරිය කියාපන්

මෙලෙස දිනක් උත්සව සභාවකදී අංගප්පුලියා සමඟ විරිඳු ගායන තරඟයකට සිවුරු හැරගිය පුද්ගලයෙක් ඉදිරිපත් විය. එදින ඇතිවූ විරිඳු ගායනය මෙසේය

අංගප්පුලි:— සබයට බැසලා කරණා තද රළු
සිවරු හැරිය මුන්නැහෙ හීරළු වළු

හීරළු:— සබයට බැසලා කරණා නිත් ද
සිවරු හැරියෙ රෙදි නැන්ද හිත් ද

අංගප්පුලි:— හීරළු තමුසේ ආවේ කී මට
බෝ රළු කම් කට පැවේ මොන වට

හීරළු:— ඇත් වෙලා තෝ කීම කියා පිය
.................................

අංගප්පුලි:— .................................
හිත් ඇති අඹුවට දූන් නම නර කද

හීරළු:— සබයට නින්ද නොවෙනා විල සට
අඹුවට රිදී නැන්දම තමයි මට

අංගප්පුලි:— ඉල්ලා කෑවම නම්බුව යන වා
වෙල්ලා හැලියේ තමුසෙ ඔබන වා

හීරළු:— එබුවත් වෙල්ලා හැලියෙ මරණ් නට
අඹුවත් රෙදි නැන්දම තමයි මට

අංගප්පුලි:— රෙදි ගෙනියන්නට තමුසෙත් එනවා
දිවෙල් ගෙනෙන්නට තමුසෙම එනවා

හීරළු:— රෙදි ගෙනියන්නේ රෙදි නැන්ද වද
දිවෙල් ගෙනෙන්නේ රෙදි නැන්ද වද

මේ අන්දමින්ම දිනක් කරඳන විහාරස්ථානයක දී අංගප්පුලියා සමඟ කිරිඇල්ලේ හරමානිස් අප්පුහාමි නැමැති අය අතර, විරිඳු වාදයක් ඇතිවිය, විරිඳු වාදය යන අතරේ විහාරස්ථානයේ උත්සවයට පැමිණ සිටි දෙන් පේද්‍රික් අප්පුහාමි නැමැති අයට කියන ලද විරිඳු මෙසේය.

අංගප්පුලි:— සාක්කුවෙන් මට ලැබෙන් ඩ
සබුක්කුවෙන් මොහුට දෙන් ඩ

හරමානිස්:— ඔඩොක්කුවෙන් මට ලැබෙන් ඩ
සෙරෙප්පුවෙන් මූට දෙන් ඩ

යනුවෙන් කියා අංගප්පුලියා පරදවා ඇත. මේ කාලයේ අංගප්පුලියා සමඟ විරිඳු ගායනයට සම්බන්ධ වූ තවත් කීප දෙනෙක්ම සිටි බව පෙනේ. ඔවුන් අතරෙන් ''කොස්ගොල්ලේ'', ''කිරිඅංසා'', ''බිම්බා'', ''මුංවත්ත'' ප්‍රධාන තැනක් ගත් බව ප්‍රකටය.

දිනක් ඉද්දමල්ගොඩ වලව්වේ දී කිරිඅංසා සහ අංගප්පුලියා එක් පක්ෂයකටද කොස්ගොල්ලේ, බිම්බා සහ මුංවත්තා අනෙක් පක්ෂයට ද වෙන්ව විරිඳු කියන්නට පටන් ගත්හ. එක් එක් අය කියන ලද විරිඳු වලින් සමහරක් මෙසේය.

කොස්ගොල්ලේට කිරිඅංසා:-

සොලව සොලව මින් ඇඟ හෙම එන වා
ලෙලව ලෙලව මින් දත් විහි දෙන වා
එලොව මෙලොව යන දෙලොවම නැහු වා
දෙලොවම නැසූ ඒ තෝ හීරළු වා

ඊට කොස්ගොල්ලේ ගේ පිළිතුරු:—

කීම ඉලව්වේ නළුවගෙ හප නී
ඒ වග කිව්වේ මුගෙ නැණ නුව නී
මේක කෙරෙව්වේ ඇඟෙ හොර බසි නී
සිව්රු හැරෙව්වේ මා තගෙ ගැ නී

කොස්ගොල්ලේ අංගප්පුලියාට කිව ගණන් අඩි කවියක්

1 2 3 4 5 6 7 8 9 10 දසවෙනි දවසක සිට අපි එන්නේ
11 12 13 14 15 16 17 18 19 20 විසිවෙනි මුනිඳුගෙ නම පව සන්නේ
21 22 23 24 25 26 27 28 29 30 තිස් වෙනි දවසට නම කිය පන්නේ
31 32 33 34 35 36 37 38 39 40 හතලිහේදි නළුවා පර දින්නේ

මෙයට අංගප්පුලියා දුන් පිළිතුර:—

40 39 38 37 36 35 34 33 32 31 30 තිස් වෙනි දවසට මාසේ එන්නේ
29 28 27 26 25 24 23 22 21 20 විසිවෙනි තිස්සය මුනි දුන ගන්නේ
19 18 17 16 15 14 13 12 11 10 දසබල මුනිඳුගෙ සරණය ගන්නේ
9 8 7 6 5 4 3 2 1 දෙකින් එකක් තට කරලයි යන්නේ

බිම්බා කිරිඅංසාට කී අටකුරු වන්නම් කවියක්

මුව මුව මුව මුව රණල කෙසෙල් මුව
මුව මුව මුහුදේ අග මුල බල මුව
මුව මුව අපි අද කියලා බල මුව
මුව මුව අද නළුවට ටොකු අනි මුව

මෙයට කිරිඅංසා ගේ පිළිතුරු:—

මුව මුව මුවගම ළඟ හක මුව
මුව මුව මුසිලයට ලෙස කර මුව
මුව මුව නළුවගෙ අද රිහි අරි මුව
මුව මුව මලෙ මුගෙ . . . . අරගනි මුව

# පුස්සල කන්ද.

කලවාන ප්‍රදේශයේ විසූ ජනප්‍රිය ගැමි කවියෙකි. අකුරු ලියන්න හෝ කියවන්න නොදත් නමුත් හිටිවනම කවි කීමෙහි බෙහෙවින් දක්ෂයෙකු විය. දිනක් පුස්සල කන්දා පරගල මුදියන්සෙ නිළමෙගෙ වලව්වට ගියේය. පුස්සල කන්දාට "පුස්සලයා" යනුවෙන්ද නම්කර ඇත. වලව්වට ගිය අවස්ථාවේ කිසියම් පුද්ගලයෙකු ගෝන ගාතයක් වලව්වට ගෙන එනු දක්කේය. මස් කෑමට ආශා කළ පුස්සල කන්දා කෙසේ හෝ ගෝන මස් බුදින ආසාවෙන් එදින වලව්වේ නැවතීමට ඉටා ගත්තේය. එහෙත් ඔහුගේ අදහස ඉටු නොවීය. ඔහුට කෑමට ලැබුණේ දෙල් මාළුවත් ලුණු මිරිස් ටිකකුත් පමණි. මේ ගැන කළකිරීමට පත් වූ පුස්සල කන්ද මතු කියන කවිය එවේලේම ගොතා නිළමේට කීවේලු.

එපිට වලව්වේ මුදියන්සේ නිළමේ
කවට කමක් කළ සැටි ඇසුවොත් පුදුමේ
අපට දෙල් කන්ට ලුණු මිරිසුත් කදිමේ
නිවට අයත් දඩමස් කනවා නිළමේ

පුස්සල කන්ද දුක් මහන්සියෙන් වගා කරගත් පොල් පැල කීපයක් දිනපතාම ඉත්තෑවෙකු විසින් කා දමන බව දැන ගතතේය. මේ කරදරයෙන් ඉවත් වීමට ඔහු මෙහි පහත දක්වෙන වස් කවිය කියා ඇත.

කැලේ අල මුල් හාරමින් කා පළමු ඉත්තෑයො රැකෙන් නේ
වලේ පැල පොල් තියාලා සිට කවදද ඉත්තෑයන්ට දෙන් නේ
බලේ දැඩි මුඩ සමන් පත්තිනි තෙදැති දෙවි අනුහස් මෙතුන් නේ
බලේ ඇත්නම් මෙ ඉත්තෑයා සත් දිනෙන් මරවා ලැබෙන් නේ

මෙම වස් කවිය කියා දින හතකින් එම ඉඩමෙ සිටි ඉත්තෑවා මැරී සිටියේලු. එමෙන්ම බල්ලෙකුට කියා ඇති වස්කවියක් මෙසේය.

වැත්තක් මා යන්ට යනකොට ගෙදර කට
රන්වන් තඹුරුවන් බල්ලෙක් ආවයි ළඟට
පැත්තක් කකුල කාලා ඌ කළ දේට
අත්තක සිටල පැනපන් පොළඟ බොටු වට

එක්තරා නිළමේ කෙනෙකුගේ මෙහෙය වීමෙන් පුස්සල කන්ද කොබෝ නීල මලකට කී කවියක් මෙසේය.

සබාවට ඇවිත් අඹරුක යට සෙවනේ
සැබෑවද බොරුද නොදනෙයි මට ඉතිනේ
සුබාවට පිපුණු මල් තුන එක ලෙසිනේ
කොබෝ නීල මලදෝ හාමුදුරුවනේ

දිනක් පුස්සල කන්ද කටුවල හාරන්නට ගොස් යකඩ ඉන්න මතක නැතිව ගෙදර ආවේය. ඒ ආවාට පසු මේ කවිය කීවේය.

කැලේ ගොසින් අල හාරා ගෙන ආවා
එතනම දෙළෙන් අල නාවා ගෙන ආවා
දෙළෙන් එගොඩ උණු තැන කැකුණේ ගාවා
යකඩ ඉන්න ගහමුල තියලා ආවා

# කරවිල කන්දෙ හාමුදුරුවෝ.

නම ගම පැහැදිලිව සඳහන් නොවන එහෙත් කරවිල කන්දෙ වැඩසිටි ස්වාමීන් වහන්සේ නමක් කවි කීමෙහි දක්‍ෂයෙක්ව සිටියේය. මෙම ස්වාමීන් වහන්සේ හා කියන ලද කවි පිළිබඳව අසා දැන මතකයෙන් ගෙන ආ කෙනෙක් පැවසූ තොරතුරු අනුව මිස වැඩි යමක් ඒ ස්වාමීන් වහන්සේ ගැන පැවසීමට නොහැක.

දීපේ මහන උනා වීනා අවගුණා මොකකුත් නොදන්නා ගොනා
රූපේ මහ අව ලක්‍ෂණා ඇහැ කනා අලියා වගේ මොර දෙනා
කීපේ කුත් පොදි එල්ලෙනා වන වනා නා නා තැනා ඇවි දිනා
ඊයේ රෑ මෙතැනින් අනේ දුරු උනා ඒකත් අපේ වා යනා

ඇන්නෑවේ මම පන්සලේ ඉඳ නිකන් කන්නෝ කෙසේදැයි සිතා
කල්වේලා බලමින් ගොඩේ පිඩු සිඟා කන්නේ ගෙනැල්ලා අනේ
එක්වූ වත්තක බැල්ලියක් ඉඳ හොරෙන් පස්සෙන් ඇවිත්ලා කමින්
අල්ලලා සිවුරෙන් කොණක් ඇද ඉරා දැම්මා අනේ දෙයියනේ

වංගෙඩියට කියන ලද කවි දෙකක්:—

පල නමිනා ජල ගිනි සෙයිනා මුල උපත යනා බට දුන ගන්නේ
තඹල යෙනා කඳ රුව ලෙසිනා බඳ රුව ලෙසිනා ඉහෙ බැබලෙන්නේ
මහළු දනා වෙත කල් බඳිනා කල කුළු රසමයි නිබඳව දෙන්නේ
අසිරියෙනා වදකර කවනා කල කුසගිනි මයි නිතරම ඉන්නේ

නිතරම කනවා වමනෙ කරනවා කුසගින්නෙයි නිතරම ඉන්නේ
ගුටි බැට දෙනවා වද කරවනවා උරණ නොවී ලඟමයි ඉන්නේ
අත වට ලෙලවා රස වළඳනවා කුළු රසමයි නිතරම දෙන්නේ
සිත කර කරලා විපරන් කරලා තෝරණවයි මේ පද සන්නේ

## නවදුන් කෝරළේ සිටි කවියෙක්.

නවදුන් කෝරළේ සිටි තවත් කවියෙක් කවි ලිවීමෙහි දක්‍ෂව සිටියේය. ඔහුගේ නම සඳහන්ව නැතත් ඔහු විසින් වන්දන නැමැති වෛද්‍ය වරයෙකුට ලියන ලද කවි දෙකක් එම වෙද පරපුරේ අය ළඟ තිබී සොයා ගන්න ලැබී ඇත. එම කවි දෙක මෙසේය.

නන්දන හට යෙදෙන රෝ දුක් බිඳර ළන
තැන් තැන් ගොස ගොසය මුව මුවෙහි පවති න
වන්දන මෙඅප වෙද මැතිඳුන් වෙත ගොසි න
දෙන් මහ පිනා නමකර සකි මෙලිය මන

කලක් සිටම විසූ සයනා සන බිඳ ලා
ලෙඩක් ඉන් සැදුණි මගෙ සියො ගත තැලිලා
ඈදක් තනා දුන්නොත් මැතිඳුට නොව ලා
රියක් මතු ලැබෙයි සුර තුරඟුන් යොදලා

## නවදුන් කෝරළේ වේරගම ආරච්චි මහතා.

යුද්ධ කාලයේ කොළඹින් පැන ආ ජේදුරු අප්පු සහ දරුවන් නොමැති ඇල්පිනා හාමිනේ වේරගමට පැමිණ ඇත. ඒ ගැන නවදුන් කෝරළේ වේරගම ආරච්චි කියා ඇති කවියක් මෙසේය.

ජේදුරු නම් දරණ මම්තුරු සඳ කල න
මෙ දුරු රට පිවිස ලකඹර හැර බියෙ න
රුසිරි මෙළඳ වෙත විසුවත් දිවි හිමි න
දූ දරුවන් නොලදින් පෙර කළ පව් න

# යටිපව්වේ අතුකෝරළ අප්පුහාමි.

රත්නපුර යටිපවවේ ඉඩම හිමියෙක්ව දහැමි ජීවිතයක් ගතකල අතුකෝරළ අප්පුහාමි ජ්‍යොතිර් විද්‍යාව කෙරෙහි මනා දක්‍ෂතාවයක් දක්වූවෙකි. හොරණ රජමහා විහාරාධිපතිව වැඩ විසූ කුඹුකේ ශ්‍රී මේධංකර මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ශිෂ්‍යයෙක් වූ මෙතුමා එවකට ජනප්‍රිය කවියෙක් වශයෙන්ද ප්‍රචලිතව සිටියේය වස්කවි කීමෙහි දක්‍ෂතාවයක් දක්වූ ඔහුගේ එම වස්කවි වලින් විපුල ප්‍රයෝජන ලැබූ බව ප්‍රදේශවාසී හු පවසති. ප්‍රදේශයේ කවියෙක් වශයෙන් ප්‍රසිද්ධියව සිටි දෛවඥ වයි. ඒ. හරමානිස් අප්පුහාමි මහතා ගේ පියාණන් වූ අතුකෝරළ අප්පුහාමි විසින් කියන ලද කවි බොහෝය.

වත්තේ කුරුම්බා හොරෙන් කඩා කා පාරේ කැත කර ගිය හොර මූලක් ගැන කියන ලද කවි කීපයක් මෙසේය.

සාකා වරුය එක අටපස පැමිණි තුරේ
ඒකා බිනර මයි පූරලත් සනි වාරේ
නාකා තුදුස්වක ලැබූ දවස ආ වරේ
මේකා මෙතන කවුදයි පැහැරුවෙ පාරේ

මාසේ බිනර පූරලත් සනි දින දවසේ
දේසේ සිටන් සොරු ආවද මේ දේසේ
වාසේ නැතිව ඉන්නා ජඩ කොල්ල කුසේ
රාසේ නෙරළු කැඩුවයි එක්වෙලා මෙසේ

පායා උදේ එන්නේ ඉර මුදුන් වෙලා
දයාදයෙන් වැන්දේ ඉරුට මන කලා
වායා සේම තැගිනි අව්ව ඇඟ හෙලා
දයා නැතුව පැලියන් බඩ පුපුරා ලා

පොලොව කම්පාවීමක් ගැන ලියා තිබූ කවියක්

සකට සිනා එක් දහසකිනා අටසිය ගණනා දස නවයකි නේ
වස සොදිනා ඉල් අටවකිනා අව එබුද දිනා අස්ලිස යෙදූ නේ
උදය උනා දස පැය පමණා පියකර කැවුනා මෙරයට දෙර නේ
නද ඇසුනා සෙනෙහස ලෙසිනා තද පුදුම උනා අපි මොකද අනේ

පුහුල් හොරකමක් ගැන වරක් ලියූ කවියක් මෙසේය.

විසල් පුර උපන් අසූ පාළිගෙ වරකා
කැබෙල් ගස යටට දමූ මළ මිනිය කකා
දුහුල් කර බසින් බැස ආ සන්නි යකා
පුහුල් කැපූ සොරා සුන්කර දමන් විකා

වරක් සුදු කපුටෙක් ගැන කියන ලද කවි දෙකක් මෙසේය.

වගේ අසනු කලි යුගේ වරුසෙ සිදු සගේ මේක බොරු නොවෙයි තමා
උගේ පාට මුතු වගේ දිලෙයි නිති ඇගේ වරුණ නම තනි සුදු මා
අගේ දුටද කපුටගේ මහිම තොපි උගේ සැටිය නම මහ පුදුමා
මගේ මෙ බැදි කවි අගේ මිදිද සොඳ රගේ ඇතිව කීවොත් කදිමා

විනේ වසන කපුටනේ තොපට මොන පිනේ මෙරුව ලැබුණද පවසන්
රොනේ එකතු කර වනේ සුවඳ කර දෙනේ ගමන් යනවද අහසින්
පිනේ මහිම මහතුනේ මෙහෙම කොයි දිනේ වෙන්ඩ බැරි පුදුමෙකි දූන්
අනේ මෙහෙම කොයි තැනේ දුටිද තොපි බනේ පොතක / වන් සුදුකපුටන්

හාවෙකුට කියන ලද වස් කවියක් මෙසේය.

දූල් කෙසර යුර හාවෙක් ඉඳ නිතර
ඊල්වනා ගොයම් කෙත් කා පාලු කර
වේල් කදිර නම් ලත් තෙඳ කඳ කුමර
වේල් තුන් දිනෙන් ඒ හාවා ඉවර

ඌරෙකුට කියන ලද වස් කවියක් මෙසේය.

තාන තෘන වල ඇවිදින හොට බරියා
මාන මාන බලමින් එන කවු බරියා
ජේන ජේන තැන් නොසිටින බඩ බෙරියා
හේන හේන කැවයි මේ දත් කැටියා

# නවදූන් කෝරලේ රන්මල්හාමි කිවිඳිය.

නවදූන් කෝරලේ විසූ කිවිඳියකි මෙ කිවිඳිය විසින් තම පුත්‍රයාට අවවාද වශයෙන් කියන ලද කවි දෙකක්.

අලස කම නම් ලොවැති සැමදුක් කැඳවනා අත්සනක් වැන්නේ
අලස නොව යම් දෙයක් ගැන වීරිය කළොත් ඒ බැරි නොවන්නේ
අලස කම්මැලිව දවල් කුමටදෝ නුඹ නිද ඉන්නේ
අලස වන යම් කෙනෙක් කොහොමද මෙලොව පරලොව සැප ලබන්නේ

අතේ සවිබල ඇතුව වැඩ පල නොකර ඉන්නේ ඇයි පුතේ
පුතේ දවල් සැතපීම නම් මිනිස් ගතියට හොඳ නැතේ
නැතේ කියනා බසක් එලෙසට ඇසෙන විට පිළිකුල්. සිතේ
සිතේ මැළිකම කියා දින දින පිරිහීම ඇතිවෙයි බඅත්

# කරදන ශ්‍රී සෝභිත මහා ස්ථවිර පාදයන් වහන්සේ.

මුන්.. වහන්සේ වීදියගොඩ මහ සඟ පරපුරේ පළමුවන පරම්පරාවේ සම්භාවනීය මහා තෙර නමක් වූ මඩපාත සෝනුත්තර මහා ස්ථවිරයන් වහන්සේ ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යවරයාණන් වහන්සේය. පිළියන්දල මාම්පේ ශ්‍රී විජයවර්ධනාරාමයේ ආරම්භක විහාරාධිපතීන් වහන්සේද මුන් වහන්සේම විය. තිඹිරිගස්යායේ අශෝකාරාම විහාරස්ථානයේ ආරම්භකයාණන් වහන්සේද මුන්වහන්සේම විය. සුප්‍රසිද්ධ පඬිවර කරදන ශ්‍රී ජිනරතන ස්වාමීන් වහන්සේ ගේ ආචාර්‍යවරයාණන් වහන්සේ වූයේ ද මුන් වහන්සේ මය. කරදන සෝභිත ස්වාමීන් වහන්සේ ගේ ශිෂ්‍යයෝ කීපදෙනෙක්ම වූහ.

1) බොරලැස්ගමුවේ වනරතනහිමි
2) ඇමටියගොඩ විමලතිස්ස හිමි
3) කරදන සිරි ජිනරතන හිමි
4) වැල්මිල්ලේ රතනජෝති හිමි
5) කහතුඩුවේ සරණතිස්ස හිමි
6) කරදන සිරි පඤ්ඤාලංකාර හිමි
7) කරදන ධම්මාලංකාර හිමි
8) පිටිපන සිරි මේධානන්ද හිමි
9) මාම්පේ වජිරඤාණ හිමි

ඒ අතරින් කීපදෙනෙකු වෙති.

පසු කාලයේ මුන්වහන්සේ ගේ ඥාති පුත්‍රයෙක් වූ ප්‍රසිද්ධ කවි කේ. එන්. ටී. ගුණදස මහතා රචිත හිරළු සංදේශයේ මෙසේ සඳහන් කර ඇත.

සඟ පරපුරෙහි වීදියගොඩ නම් පැවති
පුවතර මාම්පේ වෙහෙරෙහි විසූ ගුණැති
ගරුතර යතිඳු කරදන සෝභිත නැමැති
වැඩකර දුන්න උතුමෙකි මෙගමට හිතැති

නාවා දම් රසින් බොදුදන අමා බිඳු
ගාවා යස සඳුන් දිගැතුන් සුපිරි සිඳු
දේවානන්ද කරදන නායක ස මිඳු
බෝවා කලක් සියගම නමට සෙත සැඳු

# කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ.

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළයේ කරදන ගම් ප්‍රදේශයෙහි ක්‍රි. ව. 1875 උපන් පින්වත් කුමරුවෙකුට නම දී තිබුණේ ගුණවර්ධන යනුවෙනි. ඔහුගේ පියා කරදන නැදුරණ ආරච්චිලාගේ ආගිරිස් වෙද මහතා වූ අතර ඒව මාමිපේ දේවගේ රතෝහාමි උපාසිකා හාමිනේ නම් වූවාය. දරු දැරියන් 12 දෙනෙකුගෙන් යුත් පවුලක කණිෂ්ඨ පුත්‍ර රත්නය වශයෙන් උපන ලද මොහු කුඩා අවදියේ සිටම ඉගෙනීමෙහි දක්ෂයෙකු වූ බව සඳහන් වේ. සුප්‍රකට වියත් කවියෙකු වන පාඨශාලාචාර්ය කේ. එන්. ටී. ගුණදාස මහතා මොහුගේ බාල සොහොයුරෙකි.

වයස අවුරුදු 13 දී පැවිදි බිමට ඇතුළත් වූ මුන් වහන්සේගේ ආචාර්ය වරයාණන් වූයේ ඥාති සම්බන්ධ කමක් ඇති පූජ්‍ය කරදන ශ්‍රී සෝභිතාභිධාන මහා ස්ථවිරයන් වහන්සේය. මේ පැවිදිවීම සිදුවූයේ ක්‍රි· ව. 1889 වර්ෂයේදීය. පැවිදි නාමය වූයේ කරදන ජිනරතන යන්නය.

ක්‍රි. ව. 1890 දී කොළඹ විද්‍යෝදය පිරිවෙනට ඇතුළත්ව අති පූජනීය හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන් වහන්සේ වෙතින් ශිල්ප ශාස්ත්‍ර හැදෑරුවේය. ක්‍රි. ව. 1896 වර්ෂයේ දී උපසම්පද භූමියට ඇතුළත්විය.

උපසම්පදාවෙන් කලකට පසු කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමයට වැඩම කරණ ලදී. ක්‍රි. ව. 1916 අගෝස්තු මස 11 වෙනි දින කර්මාචාර්ය ශ්‍රී සද්ධම්ම කීර්ති යන කීර්ති නාමය මුන් වහන්සේට මල්වතු මහා විහාරය විසින් ප්‍රදානය කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ශ්‍රී සුමංගල මාහිමියන් ප්‍රමුඛ මහනුවර මල්වතු සංඝ සභාව විසින් 1935 ජුලි 6 වෙනි දින රයිගම් සල්පිටි දෙකෝරළයේ ප්‍රධාන සංඝ නායක පදවියටද මුන් වහන්සේ පත් කරණ ලදී.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති රාජකීය පණ්ඩිත ගරු කරදන පඤ්ඤාලංකාර සහ ගරු කරදන ධම්මාලංකාර ස්වාමීන් වහන්සේලා දෙනම මුන් වහන්සේගේ ශිෂ්‍යයන් වහන්සේලා වූහ.

තිඹිරිගස්යායේ අශෝකාරාමය වැඩි දියුණු කරමින් ප්‍රදේශයේ සම්භාවනීය පූජ්‍ය ස්ථානයක් බවට පත් කළේ මුන් වහන්සේය. අශෝකාරාම විහාරස්ථානයේ වැඩ වෙසෙමින් ධර්ම ශාස්ත්‍රීය සේවය සිදු කිරීම ආරම්භ කළේ පසු කාලයේය. කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ ගද්‍ය රචනයට වඩා ප්‍රියකළ බව පෙනේ. ලියන ලද ගද්‍ය රචනාවලට – පොත් වලට අමතරව පද්‍ය රචනයේ ද උන් වහන්සේ දක්ෂ කම් දක්වා ඇත.

හොඳ ළමෝ නිර තුරු
තෙරුවන් වඳිති අති ගරු
මව්පියනට මහ රු
උදය හවසද වඳිති පිය කරු

ශිල්ප දෙන ගුරු වරූ
දෙගුරුන් ලෙසින් හිත කරූ
දැක තුටු සිතින් ගරූ
වඳිති බුහුමන් කෙරෙහි සිතයුරූ

වයසින්ද ගුණ යෙ න්
නුවණින් සපිරි රිසි යෙ න්
උතුමන්ට පිරි යෙ න්
කරව් බුහුමන් තුටිනි වැඩියෙ න්

දහම් පොත් පත් ගෙ න
ඉරිද පාසලට යන
ළමයින්ට සැලසෙ න
යහපත ඉතා සරූ වන.

සිප් සැලට යන් නෝ
සන්සුන් ලෙසින් යන් නෝ
කලහ නොකරන් නෝ
ඔවුහුමය හොඳ ළමෝ වන් නෝ

නොසිරිත් දුරූ කර ව
වැරදි හැසුරුම් විපත සලක ව
මුසා බස් නොකිය ව
සස් බස්ම නිතර පවස ව

පින් පව් දැන ගනි ව
ගුණ දම් ඔලින් සැරසෙ ව
යුතුකම් දැන ගනි ව
අබිමන් සිතින් නොගනි ව

මුන් වහන්සේ ක්‍රි. ව. 1910 වර්ෂයේ දී කොළඹ කුරුඳු වත්තේ ශ්‍රී සුගත සමයානු රක්‍ෂක සමිතිය යනුවෙන් වටිනා සමිතියක් පිහිටුවාලූයේය. මෙම සමිතිය මඟින් වර්ෂයක් පාසා ඇසළ උත්සවය නිමිති කොට ගෙන " ආෂාඨ ධර්ම ප්‍රස්තක පන්තිය " යනුවෙන් දහම් පොත් පෙළක් සකස් කොට ධර්ම දනය සඳහා නොමිළයේ බෙද හරිනු ලැබීය.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපතිව වැඩ විසූ අති පූජනීය කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1963 දී අපවත් විය. ඒ අවස්ථාවෙ දී ඒ වෙනුවෙන් ලියා ඇති කවියක් මෙසේය.

කරදන කියන්නට බිය සැක නැතිව .. තිර
කරදන අයට මග සැලසූ නිරන් තර
කරදන ජිනරතන නාහිමි සඳ පවර
කරදන නම පැතිරවිය ලොව පෙර අපර

# කොස්ගොඩ රාල සහ උඩුගහපිටියෙ රාල.

සබරගමුවේ වාසය කළේ යයි විශ්වාස කරණ කොස්ගොඩ රාල සහ උඩුගහපිටියේ රාල නිතර තරහකවි, වාදකවි කීමෙහි දක්‍ෂයෝ වූ බව සඳහන් වෙයි.

සීතාවක රජ වාසලේදී මෙම දෙදෙනා තරහයට කියන ලද කවි කීපයක් මෙසේය.

උ. ග. පි. රාල:— යෙදී ගණන (මග) රජුගෙන් සොඳ සැටියා
සැදී පෙළින් පෙළ දෙපසේ සිටියා

කො. රාල:— කදිම කවියක් කියන්න සිටියා
නොදී වහපි කට කොස්ගොඩ පිටියා

උ. ග පි. රාල:— කොස්ගොඩ රාලේ මගෙ කට වැහු වට
දස්කම් බාලේ හිට පුළුවනි මට
ඉස්සර කාලේ කවි කිව් මත කෙට
පස්සට රාලේ නොයමුව අද සිට

කො. රාල.:— උඩුගහ පිටියේ රාල තමුසෙ මට
වැඩිකර කට මැත නොදෙඩන් අද සිට
අඩුවැඩි නැතිවම කිරුවා විල සට
දෙඩුවොත් වැඩියෙන් තේරෙයි නමු සෙට

උ. ග. පි. රාල:— සබයෙන් අවසර අපට ලැබෙනවා
දෙබසින් අදකවි මෙතන කියනවා
මෙර මෙන් තදකර කවි පවසනවා
උඹ දූන් රාලේ පස්සට යනවා

කො. රාල:— පස්සට යනකොට වැටුනොත් කෝලේ
නිස්සට ගමනක් නොවේය රාලේ
පිස්සට සරිමය ඇසුවොත් ලීලේ
බැස්සම සබයට අපටයි ආලේ

උ. ග. පි. රාල:— ආල බදින්නේ නොදන්න අයට ද
පස්සට යන්නේ පස්සට යන්ට ද
පසුකර වන්නේ පරාජයට ව ද
මේව නොදන්නේ තමුසෙ හපනව ද

කො රාල:— එහෙනම් රාලේ අහපන් හරි යට
තහනම් කල සබයක් නැත කී මට
මහතුන් ගාවා දෙබස් කියන් නට
වැඩියෙන් ජය ගන්නේ මම එන කොට

උ. ග. පි. රාල:— කොස්ගොඩ රාලට මොකවත් බැරුව ට
නිස්ඵල වෙනවට බොහොම දුකයි ම ට
විස්තර සබයට ඇවිදින් පැන්න ට
අස්වෙන තරමට වටිය තමුසෙ ට

කො. රාල:— බොහොම අයට නම් අපි බය වෙනව ද
මෙහෙම සබාවෙන් අපි අස් වෙනව ද
දහම නොදන්නා අයගේ ගතිය ද
එහෙම වුනොත් අපි දෙන්නම යමු අ ද

උ. ග. පි. රාල:— බැස්ස ගමන මම මුලදී සභාව ට
ඉස්ස රෝම මම පද දෙක කිව්වට
කොස්ගොඩයා මගෙ කට වැහු පලියට
විස්තර පද දෙක පෙනුනද සබයට

ගරුතර නරදෙව් උතුමා සහ සභාවෙ සියල්ල ගෙන්
අවසර පස්වා දහසක් මේ උතුමා නිති රැක දෙන්
ගුරුවර අපෙ දෙමව්පියන් හිත මිතුරන් හා නෑයන්
පෑසර වැඳ වැඳ බැතියෙන් සැමසත රැකදෙනු දෙවියන්

අවසර ලැබුණා විලසට මේ පස කරනෙමි බැතියෙන්
හැමවර සබකෝල හෙයින් බැරිවී ඇත නැතුව ගණන්
මනහර තෙරුවන් හිස පිට දරා ගනිමි නැත ඉවසුන්
සියවර අවසරයි මෙමට සබයෙන් අස්වෙන්ට වරන්

කො. රාල:– සෙත් වේවා රජ මැදුරට සහ සබයට සෙත් වේවා
අත්වේවා නරපති හා සැමටම ජය අත් වේවා
නිත්තෙන් ආසිරි ලබමින් දිවිය සැපත අත් වේවා
මෙත් මුනිඳුන් දැක්මද අප සියල්ලන්ට අත් වේවා

මෙම වාදය අසා රජතුමා දෙදෙනාටම ගම්වර සහ බොහෝ තෑගි බෝග දුන් බව සඳහන් වෙයි.

# කේ. ඇන්. පී. ගුණදාස මහතා

සබරගමුවේ විසූ සුප්‍රකට පඬිවරයෙක් ලෙස හැඳින්විය හැකි මොහු වියත් කවියෙකු විය. වෘත්තියෙන් ගුරුවරයෙකු විය. විනෝදාත්මක හා උපහාසාත්මක කවි ලිවීමෙහි මහත්දක්ෂතාවයක් දැක්වූ මොහුගේ පද්‍ය රචනා ජනතාව අතර එකල බෙහෙවින් ජනප්‍රියව තිබූ බව කිව යුතුය. ඔහුගේ පද්‍ය රචනා ජනප්‍රිය වීමට එක් හේතුවක් වූ උපහාසාත්මක හාස්‍ය රසය සෑම රචනයකින්ම හොඳින් පැහැදිලි විය. ඔහු රචනා කරන ලද හීරළු සන්දේශය හොඳ නිදර්ශනයකි.

කරදන රජයේ පිරිමි පාසලේ විදුහල්පති වශයෙන් නොකඩවා තිස් තුන් අවුරුද්දක් සේවය කළ ගුණදාස මහතා උගත් ග්‍රන්ථ කර්තෘ වරයෙකු ද විය. එමෙන්ම ඔහු ප්‍රවෘත්ති පත්‍ර ලේඛකයෙක් මෙන්ම අවංක සමාජ සේවකයෙක්ද විය.

ක්‍රි; ව; 1888 නොවැම්බර් මස 4 වන දින කරදන දී ජන්ම ලාභය ලැබූ ගුණදාස මහතාගේ පියා වූයේ කේ. ඇන්. ආගිරිස් වෛද්‍යාචාර්ය තුමා විය.

ක්‍රි: ව: 1897 මැයි මස 7 වෙනිදා කරදන පාසලට ඇතුළත්වූ මොහු ඉතා දක්ෂ අන්දමින් ඉගෙනීමේ කටයුතුවල නිරතවිය. 1903 වර්ෂයේදී 6 වැනි පන්තිය සමත්වූ ඔහු එම පාසලේම ශිෂ්‍ය ගුරුවරයෙක් වශයෙන් (මොනිටර්) පත්වීමක් ලැබුවේය.

මෙයින් පස්අවුරුද්දකට පසු එනම් ක්‍රි: ව: 1908 දි එවකට ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පවත්වාගෙන ගිය "නෝමන් ස්කෝලයේ" පුහුණුව (කොළඹ අභ්‍යාස විද්‍යාලයට) යාමට ගුණදාස මහතාට ද වරම් ලැබුණේය. එවකට මෙම අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලබාගැනීම ගුරුභවතෙකුට විශේෂ දෙයක් විය. වරකට පුහුණුව සඳහා එම ආයතනයට බඳවා ගන්නේ ගුරුභවතුන් විස්සක් පමණි.

මෙම අභ්‍යාස විද්‍යාලයේ දෑවුරුදු පුහුණුව අවසන් කළ ඔහුට 1910 මැයි පළවෙනිදින පුහුණු ගුරු පත්වීමක් ලැබුණේ උඩුගම්පොල රජයේ පාසලටය. මෙම පාසලේ අවුරුදු දෙකක් සේවය කිරීමෙන් අනතුරුව ක්‍රි: ව: 1912 ජුලි පළවෙනිද සිට කරදන රජයේ පිරිමි පාඨශාලාවේ ප්‍රධාන ගුරුවරයා වශයෙන් පත්වීමක් ලැබුණේය.

1918 ජනවාරි මස 22 දින හඳපාන්ගොඩ සීලවතී ජයසිංහ නමැති කුල කාන්තාව සමඟ අතිනත් ගෙන විවාහ ජීවිතයට ඇතුළත්වූ ඔහු පුරා තිස්තුන් අවුරුද්දක්ම කරදන පාසලේ සේවය කිරීම ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුය. ක්‍රි: ව: 1944 ජුලි මස 3 වෙනිදින මුල්ගුරු තනතුරෙන් විශ්‍රාම ලැබූ ගුණදාස මහතා 1954 අප්‍රියෙල් 7 වෙනිදා අභාවප්‍රාප්තවිය.

ගුණදාස මැතිතුමා කලාතුරකින් සමාජයකට පහළවන විශිෂ්ට ගණයේ පුද්-ගලයෙක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ඔහුට සැබැවින්ම උරුමවූයේ ඔහුගේ පියා

ඇතුළු පිය පරපුරේ අයගේ ගතිගුණ බව පැවසේ. ඔහුගේ පියා දක්ෂ වෛද්‍ය වරයෙක් වූ ආගිරිස් ගුණවර්ධන මහත්මයා විය. එවකට අධ්‍යාපනය බෙදූ ගුරු ගෙදරක ප්‍රමුඛ පෙලේ ගුරුන්නාන්සේ මහත්මයෙක් වූ මොහුගේ කණිටු සහෝදරයා පූජ්‍ය කරඳන ශ්‍රී සෝභිත ස්වාමීන් වහන්සේ විය. පිළියන්දල මාම්පෙ විජයවර්ධනා රාමාධිපතිව වැඩවිසූ මුන් වහන්සේ ගුණදස මහත්මාගේ පියාගේ සහෝදරයාද වෙයි. ආගිරිස් ගුණවර්ධන මහත්මාද ප්‍රධාන පෙලේ සමාජ සේවකයෙක් විය. කරඳන පිරිමි පාසලේ සහ ගැහැණු පාසලේ ආදි කර්තෘ වරයාණන් වූ මොහු ගැන පලවී ඇති කවියක් මෙසේය.

බොරළුව සහ මැද්දේගොඩ කනත්ත යන ඉඩම තුළින
බස්තියන්ගෙ අරඹවත්ත තෝරාගෙන සිතැඟි ලෙසින
පාසලකට කැලෑකපා ඉඩම්කපා මෙත් කුළුණින
කේ. ඇන්. ආගිරිස් මැතිඳු සමරමු මේ සියවස් දින

ක්‍රි: ව: 1948 වර්ෂයේදී පළකර ඇති පුණ්‍ය කර්ම ශතකය නමැති පොතේ ඇතුළත් කවි මෙසේය.

අරමක් තැනිමට කරඳන නිළමෙ හට
ඉඩමක් ජුවානිස් කේ. එන්. මහත කුට
මුදලත් ඉතා සුළු ගෙනදුන් නොව ගැහැට
රැකුලක් නොවෙද එය මෙම පින්දෙමු ඔහුට

ඒ දුන් ඉඩමෙ මැද්දේගොඩ නම කනත්ත
සාදන්නට අරම කෙටු මුල් වල් අත්ත
කේ. එන්. ආගිරිස් වෙදමැති ගුණ යුත් ත
මේ පින් දෙමුය සිහිකරමින් බැති චිත් ත

ආගිරිස් ගුණවර්ධන වෛද්‍යාචාර්ය තුමාගේ සහෝදර කේ. ඇන්. ටී. ගුණදස මහතාගේ ආතාගේ සහෝදර කරඳන ශ්‍රී සෝභිත මහා ස්ථවිරයන් වහන්සේ ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුය. උන්වහන්සේ සබරගමුවේ උපන් ශ්‍රේෂ්ඨ පඬිවර-යෙකි. මුන්වහන්සේ පිළිබඳව වෙනම ලිපියක් මේ ග්‍රන්ථයේ ඇතුලත් වෙයි.

ගුණදස මහතාගේ භාර්‍යාව වූ කරඳන "සීලවතී ජයසිංහ" උපාසිකා මාතාවද ප්‍රදේශයේ ශ්‍රේෂ්ඨ පරපුරකට අයත්වූ තැනැත්තියක් වූවාය. කරඳන පාසල්වලට උපකාර කළ ඇය කරඳන ළදරු පාසලට දර්ශණීය බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් පරිත්‍යාග කර ඇත. කරඳන මහා විහාරස්ථානයේ බෝධි ප්‍රාකාරය නවතාවයකින් සකස් කරදීමද කළ එතුමිය ලංකා මහා බෝධි සමාගමේ යාවජීව සාමාජිකත්වය ලබා තිබුණි. ක්‍රි: ව: 1896 මැයි මස 16 වෙනි දින උපත ලැබූ මෙතුමිය ක්‍රි: ව: 1979 ජනවාරි මස පළවෙනි දින අභාවප්‍රාප්තවී ඇත. මෙතුමිය ගැන පලවී ඇති කවි කීපයක් මෙසේය.

හොඳ හිත දිනා ගමවැසියන් අතර පොදු
යහපත් වැඩ වලට මුළු ජීවිතය යෙදූ
ගම හැම දෙනට නංවා දුක් කඳුළු බිඳු
මරුගේ සරණයට ඔබ පත් වූණිය රැඳූ

උණුලේ කදුළු බිම දමමින් සියලු විට
වැළපෙන ඔබෙ නැදැයින් අතර සිට
මුළුගම අඳුරුකොට අසරණ කමින් සිට
ඔබ අදගියේ ඇයි අන්තිම ගමන කට

කේ. එන්. ටී. ගුණදස මහතාගේ වැඩිමහල් සොහොයුරු ද සඳහන් කළයුතු සබරගමුවට ශාස්ත්‍රීය ආලෝකයක් ලබාදුන් ශ්‍රේෂ්ඨ පඬිවරයාණන් වහන්සේ නමක් විය. ඒ කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේය. මේ ස්වාමීන් වහන්සේ ගැනද වෙනම ලිපියක් ඇති හෙයින් මෙහිදී වැඩිදුර විස්තර නොකරමි. ගුණදස මහත්මාගේ බාල සොහොයුරිය එනම් කේ. එන්. ඒ. නන්දවතී මහත්මිය. කරදන ගැහැණු පාසලේ ප්‍රධානාචාර්‍ය තුමිය ලෙසින් දීර්ඝ කාලයක් සේවය කර ඇත. කේ. එන්. ටී. චන්ද්‍රසේන මහත්මා රචනා කරණ ලද “ කරදන ළදරු විද්‍යාලීය ඉතිහාසය ,. නමැති ග්‍රන්ථයේ මෙතුමිය ගැන සඳහන්වන්නේ මෙසේය.

“ගැහැණු පාඨශාලාවේ දීප්තිමත් කාලය ළඟාවූයේ නන්දවතී මහත්මියගේ පැමිණීමෙන් පසුවයි. එතුමිය පාඨශාලාවේ අභිවෘද්ධිය සඳහා බොහෝ වෙහෙසවී කටයුතු කළාය. ක්‍රමයෙන් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවන්නට විය. එතුමිය ගේ බලවත් ඉල්ලීම පරිදි අභිනව පාඨශාලා ගොඩනැගිල්ලක් 1925 දී රජයෙන් තනවා දෙන ලදී. ” මෙතුමිය ගැන පළවී තිබූ කවියක් මෙසේය.

ඉගෙනුම ලබා කරදන පාසල භාර
මුල් ගුරු පදවි හෙබවූ නිරහන් කාර
නන්දවතී ගුරු තුමි ගුණ නැණ ධීර
සිහිකර සඳ දක්වමු අපි උප හාර

කේ. එන්. ටී. ගුණදස මහත්මා දක්ෂ කවියෙකු විය. ඔහු විසින් රචිත හීරලු සංදේශය ඔහුගේ කවිත්වය පැහැදිළිව පෙන්වා දෙයි. හීරලුවෙකු (සිවුරු හැර ගිය අයෙකු) දූත ක්‍රියාවෙහි යොදවා රචනා කරන ලද මෙම කාව්‍ය වනාහී හීරලු සංදේශය නමින් හැඳින්වෙයි. හීරලු සංදේශයේ ආරම්භක කවිය ඇතුළු කවි කීපයක් මෙසේය.

සැරද හීරලු සඳ — හසල හොඳටම සහ මෙත්
ගිහි පැවිදි දෙකටම නැති - දර දඩු ගුණැති අපමණ
පන්සල් තුලට වැද - කාලා රසැති දන් බත්

තෙල වැටිලා සපුනත් ගුරුණුත් රව ටා
ගලවා දමා සිවුරත් රෙද්දත් දව ටා

පිරිකර විකුණ ලත් - මුදල් සහ අන් සහ සතු

මුදල් හදල් ඇඳ ඇතිරිලි තුවා රෙදී
අවුල් පවුල් කොට අරගෙන බැඳල පොදී

පැන්නේ පන්සලෙන් මහ රෑ අඳුතු ලෙස
වන්නේ යහළු තැනකට අදහස් විලස
බින්නේ නොවෙයි මෙවදන් ගැන නොවෙයි රොස
දන්නේ නැත්ද කවුරුත් මෙතොප ගුණ රැස

පින අඩුවූ කලට ගිහිගෙයි රසය පෙනී
පැන සස්නෙන් ඇයි විදිනෙහි මෙදුක් ගිනී
දන ගතහොත් මැන වැරදුන බව සො දිනී
ගුණ මකුවෙක් නැත මිහිපිට මෙතොප වැනී

එනමුත් සකි සදේ හීරලු නම දරණ
වැදගත් අයත් ඇත තොප තුළ රට වටින
එමහත් පඩිවරුන් නම කළ හොත් මෙදින
තොපටත් සැපකි සතුටකි මටද අපමණ

කේ. එන්. ටී. ගුණදස මහත්මා අභාවප්‍රාප්ත වූ අවස්ථාවේ එතුමා ගැන ලියවී තිබුණු කවි කීපයක් මෙසේය.

කරදන පාසලේ මුල්ගුරු පදවි දිනූ
මහ සෙනෙවියාණනි සිසු බල ඇණිය තැනූ
සලකා ඔබේ සේවය අප ගමට වුණූ
වැළපෙමු අපි මෙසේ වගුරා කඳුලු උණූ

දරු පරපුරක් වෙත සිප්සත කිරි පෙව්වේ
කරුණා ගුණය රඳමිනි හදවත පව්වේ
ගුරු දේවයා කරදන සහ යටි පව්වේ
මරුවගෙ පහස ලබමිනි සුර සැප සෙව්වේ

තවත් තැනක මෙසේ ලියවී තිබුණි.

එළිකළ ගුරු - තරුවක් ලෙස - බැබළෙව් දස අතින්
ගුරු පෙළපත අතරෙහි නම - ගිය තුති ලැබ නිතිනේ
ඇති කළ කරදන - ගරු නම - සිහිවන එම තනිනේ
සවි බල ඇති - රන්කොත ඇද වැටුණා කෝ ඉතිනේ
සබයක මුලසුන පිදුමට - ගම ගැන පෙර මුනටා
පැනයක නිමි දුම හිමිවුණ - කවදත් මුල් තැනටා
පඩි දෙක උතුමෙක සුරතුර - විය අප සැම දෙනටා
නොම හැක වාවනු මෙම - පාඩුව කරදන දනටා

එවකට තිබූ ප්‍රසිද්ධ සහරාවක් වූ සමගිය සහරාවේ, ගුණදස මහත්මා ගැන පළවී තිබූ කවි දෙකක් මෙසේය.

මුදලිඳු ඇලපාත හල් කඳලියෙ ලේකම්
සාගර කිවිඳු වැනියන් සේ පා දස්කම්
රස කවි සයුරෙ ගැසු හොඳ හැටියට කරනම්
ගුණදස් නමට පුදදෙති කිවිනගෙ බැති පෙම්

හෙළගුරු මඩල හොබවා මුලසුන දරුව
එදවස සපර ගමුවෙහි බැබලුනු තරුව
රැකදුන් කවි කමෙ හා පෙදෙසෙහි ගරුව
ලියලයි දිනෙන් දින ඔබ කිත් ලිය සරුව

කේ. එන්. ටී. ගුණදස මහත්මා ගේ ශ්‍රේෂ්ට චරිතයේ සන්ධිස්ථානයක් සඳහන් කළ යුතුව ඇත්තේ වෙනත් කාරණයක් සම්බන්ධයෙනි. එනම් කෙසේ හෝ තමන් වෙතට ලැබුණු ශ්‍රී ලංකාවේ සිංහල රජතුමා ගේ අග බිසව ගේ

රාජකීය සැට්ටය 1941 පෙබරවාරි මස 01 වෙනි දින කොළඹ ජාතික කෞතුකාගාරයට පරිත්‍යාග කිරීමේ කතාවයි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අග මෙහෙසිය වන වෙන්කත රංගම්මාල් දේවිය ගේ යැයි සැළකෙන සැට්ටයක් කොළඹ ජාතික කෞතුකාගාරයෙහි ප්‍රධාන ශාලාවේ රාජකීය භාණ්ඩ ප්‍රදර්ශණයට තනවා ඇති වීදුරු අල්මාරියේ තැන්පත් කර ඇත. මෙම රාජකීය සැට්ටය කෞතුකාගාරයට පරිත්‍යාග කරනු ලැබුවේ කේ. එන්. ටී. ගුණදාස මහත්මාය.

කෞතුක භාණ්ඩ එකතු කිරීමෙහි යෙදී සිටි ගුණදාස මහත්මාට මෙම රාජකීය සැට්ටය ලැබුණේ කිරි පෝරුවේ හේරත් මුදලිගේ පුංචි බණ්ඩාර මහතා ගෙනි.

ගුණදාස මහත්මාට මෙම සැට්ටය මෙසේ කෞතුකාගාරයට පරිත්‍යාග කිරීමට උපදෙස් ලබාදී ඇත්තේ අති පූජ්‍ය කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ, අතිපූජ්‍ය රඹුක්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ නායක ස්වාමීන් වහන්සේ . පූජ්‍යපාද නාපාවල සෝරත මහා ස්ථවිරයන් වහන්සේ කෞතුකාගාර අධ්‍යක්‍ෂ පී. ඊ. පී. දැරණියගල මහතා හා අධ්‍යාපන අධ්‍යක්‍ෂ ඇල්. මැක් ඩී. රොබිසන් මහතාගෙන්ය.

කාව්‍ය රසය හෙවත් සපරගමුවේ පැරණි ප්‍රබන්ධ ග්‍රාමීය ඉතිහාසය - කමත් හැල්ල - පුණ්‍ය කර්ම ශතකය - පෙරුම් වැණුම - වැනි පොත් ගුණදාස මහත්මා විසින් රචනා කරණ ලදුව මුද්‍රණද්වාරයෙන් පිටවූ වටිනා කෘතීන් වෙති. කාව්‍ය රසය 11 භාගය - ස්ත්‍රී රත්නය , සබරගමුවේ ජනකතා - කුරුවිට කෝරළයේ ආදී ප්‍රවෘත්ති වැනි ග්‍රන්ථ මුද්‍රණය කිරීමට ඇති පොත්ය.

පානදුරේ ප්‍රසිද්ධ කොස් ඇට මාමා හෙවත් ආතර් පී. දියෙස් මහතා සමඟ එකතුව “ බත් නැතිද කොස් ” නැමැති සංකල්පයේ සිට ගෙනයන ලද ක්‍රියා කලාපය ද අගය කළයුතුය.

<u>ගුණදාස මහතා විසින් රචිත ළමා පද්‍ය කිපයක්.</u>

කෝදුරුවා පුංචි සතා
ලෙඩ බෝකරනට සමතා
නුඹෙ ගේ තුළ ඌට කැතා
ඉන්ට නොදෙන් මගේ පුතා

කෝදුරුවා පුංචි කමට
බලනු අපට කරණ ගැහැට
මගයි තැන තැන වැල්බැඳ සිට
කරයි හතුරුකම් හැම විට

ගේ දොර හා ඒ අවටත්
බිත්ති වලට සොල් දොරයත්
සැම තැන පිරිසිදු කළහොත්
විසුමට කෝදුරුවෝ නොඑත්

කැර පොත්තා වැසිකිළියේ
විසුමටමයි සිතූ ඇලියේ
රට නොවී කම්මැලියේ
කුස්සියටත් එයි ලොලියේ

ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට
පැදුරුද පාවහන් තුළට
රථවාහන අසුන් වලට
අරක් ගනිති මකුණො කපට

මේ කැරපොත්තාට නපුරු
අපගේ දොරවලට සොඳුරු
ඇතුල් වෙන්ට නොදී සිදුරු
පිරිසිදුකම රකිනු මිහිරු

බොරලැස්ගමුවේ ජී. එච්. පෙරේරා කවියා සහ ගුණදස කවියා අතර හුවමාරු වූ පද්‍ය කීපයක්.

ජී. එච්. පෙරේරා කවියා :-

නෙකවන තුරේ ඇති මුත් මහ තැති නෙතුරු
එමවන තුරේ දුලබය මේ සඳුන් තුරු
අපමණ සබඳ දම් බැඳ උන්නත් මිතුරු
දන මන පිනන සබඳෙක් ඔබ වැනි කවුරු

ගුණගත මිතු සඳේ සිහිවෙන වෙන කලට
දෙනයන දිය කඳේ වාඩි ලැමද පිට
පතමෙන පෙර ලෙදේ ආදර කොත් මෙමට
එනු මැන මිතු සඳේ මා සිටිනා තැනට

ගුණදස කවියාගෙන්:-

එව් ඔබගේ හසුන් සඳ වදන රස් වද
තැව් ලව ගෙවී හැර නොසවිය මසින් කොඳ
පව් සැමගේ දුරලන පින් කමට සොඳ
දිවි මෙමගේ තිබුණොත් එන්නම් සබඳ

නද කළ මපෙම් ගුණයුත් බඳු සිසිර කර
දුරහල තම සිතින් පව්කම් එපා කර
මන කළ මිතු සදිනි බැඳි පණ ලෙස අදර
නෙතු දළ වගුරමින් ඔබ සිතමි හැම වර

ගුණදස මහතා විසින් මලවැන්නේ කවිධජ හිමියන්ට ලියා යවන ලද පද්‍ය කීපයක් මෙසේය.

සුබ කවි ගොත ගොතා පතුරා යස කැල්ම
පොබකර වෙතට ඇදගත් වියතුන් බැල්ම
නුඹ මිණ තෙදින් දුදනන් සිත් කළ තැල්ම
ලැබ යති සදුනි ඔබ එව් කවි සඳ කැල්ම

කවි අමරස බොමින් කියවා එකින් එක
කවි නැණ මැන ගතිමි යතිඳුගෙ නොවි සැක
කවි දද නමට යුතු ඔබටයි මෙසිරි ලක
කවි සිඳ කැල්ම සන්නෙන් කවි සිළු පිළෙණක

අපට පොතක් එවමින් කළ සත් කාර
සිතට ගතිමි බැහැ නොකරම උප කාර
පවට අපගෙ නැත රන් රුවනුත් සාර
ඔබට අයත් වේවා සව් සිරි සාර

කරදන ජිනරතන ස්වාමීන් වහන්සේට යවන ලද ලිපියක අඩංගු වූ කවි කීපයක්.

පිවිතුරු යස රුවින් තුති ලද හැම දිනම
සිතයුරු එසිව් පසයෙන් අඩු නැති කිසිම
පියකරු පැවිදි සුව ඉන් විඳින හිමිනම
සෙනසුරු අපලෙ ගැන වදහල කරුණ කිම

විසකුරු සපුන් වැනි දුදනන් රුසක් මැද
උවදුරු වලින් උන්ගෙන් පැමිණෙන නො මද
නිරතුරු දුකින් පසුවෙමි සිතට බිය වැද
සෙනසුරු ඉතින් කෙළියේ මට වද සමිද

දිවංගත ගරු අග්‍රාමාත්‍ය ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ශරණ මංගල්‍ය දින ගුණදස මහතා විසින් ඉදිරිපත් කළ ස්තුති පත්‍රයක සඳහන් පද්‍ය කීපයක් මෙසේය.

සැරද ගරු බණ්ඩර — නායක ඇමති සුරතුර
සිරිමාවෝ කුමරි නම් — රත්ලිය වැළඳී මනරම

පුවතර මෙලක් දිව දන සුරකින බැතිණී
ගරුතර බණ්ඩාර නායක මැති තුමණී
සිරිබර සිරිමාවො මෙම කුමරි සමගිනී
තිරසර සිරින් සුදිලේ සුරතුර ලෙසිනී

සියදන සෙතම සලසන බැතිනි නිර තුර
රුපුදන ගජන් දප දමු එකසර කෙසර
සසොබන බණ්ඩාර නායක මැති සමර
සමගින මැතිණි බැබලේ සිරි සදෙක යුර

සිරිලක මැදුරේ දුල් වී කැලුම යුත් නිමල් වූ
සසොබන මිණි පහනක් වන් උතුම් ඒ වියත් වූ
ගරු ඇමතිඳු දෙස් පල්නා දනන් විත් රැගත් හිත්
කුමරිය සිරිමාවෝ හා දිලේ රන් රසක් සේ

ගුණදස මහතා විසින් කරඳන විහාරාධිපති වාගීශ්වර නායක හිමියන් වෙත ලියා යැවූ කවියක්.

දනමන පුබුදු කරවන දූන දහම් සත
වෙසෙමින් සසුන් වැඩ වසනට කරණ තැත
කරඳන වෙහෙර වාගීශ්වර සමිඳු වෙත
විගසින ගොසින් වැඳ පිළිගන්වනු මෙපත

විනෝදයට ලියන ලද විකට තුති පතකින් ගත් කොටසක්.

මේ පත්තරේ ලොකුම දෙස් ගණනින් කියත් හොත්
එක් විස්සකුත් තව එකක් ඇති බැව් පෙනී යයි
ඒවා කියන්නට ගියොත් කලකුත් කොයින් දෑ
නෙක් රොස් පරොස් සහ තවත් බැණුමුත් ලැබෙ වයි

ඒ මුත් එයින් සමහරක් නොකියා කොහෝ මත්
සිත්හී දරා ඉවසුමත් මට නම් අමා රුයි
කව්රුන් කෙසේ කිව් නමුත් එනිසා ඉතින් මම
පෙන්නුම් කරන්නෙමි එකක් බැලුවන් විනා සයි

කරඳන්හි ගම්හී — බිමහි වැව්ලි කරමු
යනමේ යෙදුම සත්තෙත් — සිංහල නොවේ වියතුණි

කරඳන්හි යනුවෙන් — නොයෙදේ සිහල බසෙහි
වැව්ලි නම් බිමහිමයි — අහසෙහි වැවීමක් නැතේ

ඉතින් අර යෙදුමෙන් – බලමු කිවිඳුට උණදේ
නොදන්නා දෙමළට ගොස් - වරිගෙත් නහා ගත්තේ

නන්දන රැසින් කරවා පුබුදු දන මන
යන්නෙන් කියූ ඒ කවි පදයේ අමන
පෙන්නුම් කර දුනොත් තේරුම සත්ත කින
දෙන්නෙමි තෑග්ගක් කිවිඳුන් හට වටින

"සුහුරු බඩු" වචනයෙහි තේරුම මස්සිනා බව නොම දූනේ
නුහුරු ලෙස යෙදුවේ කිවින්ද සහෝදර යයි සිත මිනේ
මිතුරු දම අපෙ ලොදන සැමගේ මස්සිනා යයි කිය මිනේ
නිසරු ලෙස ඇයි කවටකම කලෙ උතුම් සුමගුල් මේ දිනේ

1945 ජූනි මස 1 වෙනි දින යටිපව්වේ කුඩාරමේ ආරම්භ කරණ ලද නොතාරිස් විභාගය පිළිබඳව මොහු විසින් රචිත කවි පන්තියක් මෙසේය.

අද හිටලා කවට බසක්
පල කෙරුවට මොකද දෙසක්
කිවේ පෙර කවට රජෙක්
ඒක අපට නිදහස යක්

සිත කයද වෙහෙ සී
දුකට පැමිණුන විග සී
මෙකව ගෙන සතො සී
කීවොත් යයි දුක වෙහෙස වැන සී

සිංහලයන් ශම තේ
නොකළ කරුණා නිය තේ
මැතිදෙක් සිතු ම තේ
තැනූ මුඩු බිම් පනත යට තේ

පසිඳු කරදන ගම
තිබෙන මුඩුබිම් නොක රම
කරන්නට බෙ රුම
සමත් කොමසාරිස් මැතිඳු නම

උගතු මුදලිඳු හා
පැමිණ තව මැතිදෙක් හා
එකට යුතු සඳ හා
ශෙවල් කුඩාරම් ද සඳ හා

පොත් පත් ද සිති යම්
තවත් ලියවිලි පෙත් සම්
කරල සූද නම්
නැතුව අඩු පාඩුවක් කිසි යම්

ඉඩම් හිමියන් හට
යැව් නොතීසි වල හැටි යට
විභාගය කෙරු වට
පටන් ගති කදිමයි බැලී මට

සුදම් දෙව් සබ යට
සිරකළ නොහැකි කිසි විට
ඒ මිනිස් සබ යට
බැරිය උපමාවක් කියත් නට

තෙදණින් දිනින් දු
තියුණැන යෙන් ගතින් දු
මුල සුනෙහි නත් දු
දිනේ කොමසාරිස් මැතින් දු

ගුණෙන් පුන්සඳ වූ
විකුමෙන් විශාරද වූ
දකුණු පස පැන වූ
අසුනැ මුදලිඳු දිලෙයි පැනවූ

සත් සුත් ගුණ සුමු ඳු
අඩු නැතිව තවුසෙක් බඳු
ඇහැළියගොඩ මැති ඳු
දිල් පුටුවේ වම පසෙහි සැඳු

ගම්මුන්ගෙ පැව    තා
උරුම කරුමය කිය    තා
කීමට ගොත    ගොතා
සිටියි ළඟ ආරච්චි    මහතා

තමන්ගේ අයිති    ය
කීමට ලෙසින්    රීතිය
නොවී කිසි    බීතිය
ඉඩම් හිමියෝ ඉදිරි සිටී    තිය

මුදලි මැති කදි    මට
නම් අඩ ගැසූ විගස    ට
සාක්කිය කී    මට
ඉදිරියට එයි එකිනෙකා    තුට

ඇත්තක් මිසක්    මම
නොකියමී මුසාවක්    හෙම
දිව්රා මෙලෙස    හැම
කියති මහ බොරු බියක් නැති    වම

මගේ පිය උරු    මය
සහෝදරයගෙ උරු    මය
මෙක මට උරු    මය
වෙන අයට නැත කියති උරු    මය

ඔය කියන්නේ    බොරු
අපටත් උරුම ඇත    සරු
දෙන්නෙක්ය මට    වරු
එක පියා යයි කියති    සමහරු

උරුමය සහෝ    දර
ඉල්ලති කෙනෙක්    සමහර
එක හිරේ දව    සැර
උන් නිසා එය නොදමු    කිසිවර

කියා දන සම    හර
ඔවුනොවුන් හට මෙරත    ර
නැකම් ද කඩ    කර
අවුල් වියවුල් ගනිති දික්    කර

වීකුණලා    ඇත්තේ
පියාමයි ඒ සත්    තේ
අපෙ කොටස ඇත්    තේ
ලැබෙනු මැන ඉත්ට තැන්    නැත්තේ

වික්ක මුත් මා    හට
තවත් ඇත මහ ලොකු    වට
අයිතිය කියන    කොට
සිනාවක් ඒ අසන්නන්    හට

අප ඉඩම් වික් කේ
නැත එය හිතිනි රැක් කේ
කොටස නොවි ලැක් කේ
කියති සමහරු ලබත හැක් කේ

වැවෙවි ඒ ඉඩම
මමයි කරමින් විය දම
ඒ නිසා ඒ මටම
කෙනෙක් පවසති අයිති බව ට ම

ඔහු යකඩයෙන් ඇණ
පැල සිටෙව් කඩිමුඩි යෙන
මමත් ඒ ඉඩ මෙ න
වැවීම් කොටසක් කියති අය වෙන

ළඟ කැලෑ කැප් පූ
දල ලොබ සිතින් පිප් පූ
කෙනෙක් වී බප් පූ
විදහ පෙන්වති ඔප්පු තප්පූ

සිය ගණන් අක් කර
වනසා කැලේ ලොප් කර
තේ රබර් සිත් සර
වැවූ මුදලාලි වරු ගම් බිර

දූප්පතුන් මර වා
ගත් ඉඩම් ටික අර වා
ගන්ට බැග් පූර වා
එකී උන්හට දුකක් කර වා

ගල් පැලෙන තර මට
මහ බොරු දෙසා බා සිට
වියළි උගුර කට
පැමිණ ළඟ සිටි කෝපි කඩ යට

ආප්ප සහ පිට වුත්
බිබික්කන් වැළි තල පත්
කෙසෙල් ගෙඩි කැවූ මුත්
සමහ කාබී තේද කෝ පිත්

කාලා බුලත් වීට
කළ සමත් කම් පල කොට
තව උගුල් අදින ට
සිදුරු සොයමින් යෙතිය ගෙව ලට

ගුරු සංගම් රැස්වීමකදී කියන ලද තවත් කවියක් මෙසේය. රැස්වීමේ සිටි වීරකෝන් — අබයවික්‍රම — විජේවර්ධන යන පරීක්‍ෂකවරු තුන්දෙනා ගැන මෙහි සඳහන් වෙයි.

වීර නමුත් දත් වැටිලා දුබල ගතියමයි පෙනෙන්නේ
දීර අබේ සිල් රැක්කත් සැරගති නැහැ අඩු කරන්නේ
සූර වීජේ මිටි සින්ද කොහොමද විස්සහ කරන්නේ
සාර ගතිය පැන රුවනෙහි අළුත් සින්ද තව තිබෙන්නේ

මොහු විසින් රචනා කරණ ලද කෝච්චි සවුදම,

බෙරකඳ විලසට යකඩය තළලා
ඇතුලේ ගිනි දමතෙයි.
වෙලාව ඇවිදින් ලැහැස්ති වෙනකොට
හූයි කියා ගණිතෙයි.
ඇණ කිපයකුත් මිරිකා හරිමින්
පීල්ල උඩ දුවතෙයි
රේල්ල සවුදම කොහොමද ඇසුවොත්
පැයට කොළඹ දුවතෙයි.

ඔහු විසින්ම රචිත ඌරු සව්දම

අන්දර ගසයට මහ වන මැද්දේ
ඌරු මොටෙක් ලඟිතෙයි
දිරච්ච අන්දර අත්තක් කැඩිලා
උගේ ඇඟ උඩ වැටෙතෙයි

කෝපෙන් ඉල්පුන ඒ තඩි ඌරා
පළි ගැනුමට සිතුවයි
නෑදැයින්හට එක්වෙන විලසට
පණිවිඩ පිට කෙරුවයි

නෑදෑයෝ හැම ඒ අණ ලැබිලා
වහාම එහි රැස්වෙයි
අන්දර ගස කළ වරදට අපි දැන්
පළි ගනිමුව කියතෙයි

ඌරෝ සැමදෙන ගසවට සැදිලා
ගසට දතින් අනිතෙයි
හැමදෙන දඩිය මුගුරු දමාගෙන
දත් ගලවා ගනිතෙයි

තවත් වරක් වැර වැයම කරලා
අන්තිම පහරත් දෙයි
ඔක්කොම රැවටී දත් හොඹු බිඳගෙන
සීසී කඩ දුවතෙයි

අන්දර ගස මෙ වනයට ඕනෑ
බවම කියා සිටිතෙයි
උතුම් ගුණය රැක තම තම නිවසට
සතුටින් යහපත් වෙයි

කෝච්චි තේ දලු සවදම උඩරට
සිහලෙක් පෙර තැනුවයි
ඌරගෙ සවදම කරදන ගුණදය්
පාලි නොදන තැනුවයි

මෙම කවියා ලියූ තවත් රසවත් පද්‍ය පන්තියක්.

**සමනළ වැණුම්;-**

සසොබන මුණි පා පහසින්    තෙමුණා
ඵසුමන සුර රද නිරතුරු    වසනා
ලකහන හිස මිණි කිරුළෙම    දිලෙනා
පිනවන සමනළ ගිර අර    පෙනෙනා

පැසුණු දොඩම් නාරන් අඹ    දඹිනා
ඉදුනු කදලි වැල වරකා    ගසිනා
දිළුණු පටුනු ගම් අවටින්    තිබෙනා
බළණු මැතිව් එහි කඩිසර    තොමිනා

සපුනා කොබොලීල දඹ අං කෙන්    දය
ඵපනා වතුලද නුග ළුර    හැන්දය
වලිනා යුතු නෙක තුරු මත    තන්දය
දිළෙනා රහ බල සමනල    කන්දය

පැන ඍැන යන නිති සාමුව    රැසිනා
තැන තැන මොනරුන් ගීරවුන්    නාදිනා
සුරගන පවසන තියූ ගී    රැවිනා
සැමදින බැබලුණි එම වන    සොබනා

තැන තැන සිහිළඹ කඳුරැළි ඇල    දොල
පියුමින සැදි විල් සියයෙන් මන    කල
බිඳලන රඹ වන සරණා ගජ    රැල
අපණැන මදවිය වන්නට    සමනල

ලකහන හිසෙහි බැදි වරලස ලෙස    රමණී
සැමදින දිලේ සමනළ ගිර සිර    සරණී
සසොබන ඵසිළු ගැසූ රන් කුරක්    ලෙසිනී
බබලන සිරිපතුල නමදිමු නුටු    සිතිණී

දෙවා පතුල දෙවරද සැදුමෙවන් පැහැද
නවා තැන රැගත් දහවල් මුනිඳු සඳ
මවා ලූ නිමල පිළිමය යුතු පබඳ
දිවා ගුහා ලෙස සමනළ පසෙක වද

සමන් සුර රද පළමු සිරි පද වදියි වඩිමින් බැති සිතා
එයින් ඉක්බිති වදිති සුරකැල නොයෙක් වන දෙව මොක් පතා
මොවුන් ගෙන් පසු වදින්නට යෙයි සමන් සුරිඳුගෙ ඇලි ඇතා
නවත් මස සිට නොයෙක් දන යෙති වදිනු වස් එහි දින පතා

# බඹරබොටුවේ සුධර්ම සෙනෙවිරත්න මහතා.

රත්නපුර දිස්ත්‍රික්කයේ බඹරබොටුව නැමති ගමෙහි 1918 අගෝස්තු මස 16 දින උපත ලද මොහු එවකට ලැබිය හැකි උසස් අධ්‍යාපනය ලබා රජයේ ගුරුවරයෙකු බවට පත්විය.

ලංකාවේ නොයෙකුත් ප්‍රදේශවල ගුරු භවතෙකු ලෙසින් සේවය කළ ඔහු අවසාන වරට සේවය කළේ බඹරබොටුව විජයබා මහා විද්‍යාලයේය. පැවිදිව ආගමික සාමාජික, අධ්‍යාපනික මෙහෙවරක් ඉටුකල ඔහු ගුරු වෘත්තියේ නියැලුණේද භික්ෂූන් වහන්සේ නමක් වශයෙනි පසුව උපැවිදිව බඹරබොටුව ප්‍රදේශයේම ගිහි ජීවිතය ගත කළේය.

සබරගමු කවි පරපුරේ දීප්තිමත් සාමාජිකයෙක් ලෙස හඳුන්වාදිය හැකි ඔහු කවි රචනයේ මෙන්ම කවි කීමෙහි ද මනා ප්‍රවීණතාවයක් දැක්විය. නිතර සරළ වචන යොදාගෙන කවි රචනයේ යෙදුන සෙනෙවිරත්න මහතා වස්තු බීජ තෝරා ගත්තේද ගැමි පරිසරයෙනි.

එළවළු ගණන මේ පැත්තේ නැහැ පුංචි
ගෝවා සත හැටයි රුපියල විය බොංචි
ගෙඩියක් සත හතට දෙහි දෙනු ඇත නොංචි
පත්තිනි දෙයියනේ කිච්චා කිරි අංචි

සාමාන්‍යයෙන් එදිනෙදා සිද්ධියක් කවියට නගා ඇත්තේ මෙසේය. මේ කවිය බලන්න.

සෙල්ලම් මිසක් අඩගහ ගෙන සිටටා වත්
මල්ලි නොවෙයි නැකතට තෙල් ගෑවේ වත්
අම්මා කට කැඩෙන තරමට කෑගෑ වත්
ඔහු නම් හැදෙන පාටක් නැහැ කවද වත්

නොබියව සමාජ ධර්මතා විවේචනයේ යෙදුන සෙනෙවිරත්න මහතා ඇතැම් අදහස් ඉදිරිපත් කර ඇත්තේ උපහාසාත්මක අන්දමිනි.

ඔක්කොම හාමුදුරුවරු ලක අදහන් නේ
බුද්ධාගමෙද ආ – හරි පැනයකි පැන් නේ
ඔව් නෑ දෙකෙන් එකකුයි කිවයුතු වන් නේ
මම ගල් උනෙමි කොහොමද පිළිතුරු දෙන් නේ

කවි ලෝලයන් අතර "බඹරා" යනුවෙන් ප්‍රචලිතවූ සෙනෙවිරත්න කොළඹ යුගයේ කැපී පෙණුන කවියෙක් විය. පාළි – සංස්කෘත භාෂා මෙන්ම ඉංග්‍රීසි භාෂාව ගැනද ඔහුට හොඳ පුහුණුවක් තිබුණි.

## බඹරබොටුවෙ සුධර්ම සෙනෙවිරත්න මහතා විසින් රචිත කවි.

ගුවන් තලේ තරු නලියන සඳරැස් අම දහර ඞැස්සෙ
සුළං රොදේ පුලින තලා මිටියාවත් ඉවුරු ඔස්සෙ
සවන් ඔබා පතල් කඳෙට පැල් ගීයේ පැලලි මැස්සෙ
රුවන් පුරේ කවියනි රස වගුරන ජීවිතය තිස්සෙ

සමන් කුළේ බුදුරැස් සුළි නළ රැළි සමඟින් එතේය
කුසුම් වෙසක් ඇහැළ පෙතන් රුක් නා නිල් වන පෙතේය
පියුම් රාග රතු නිල්මිණි වෙරළු ඇගේ හද වතේය
රුවන් පුරේ උපන් නිසා නිතැතින් රසකවි ගෙතේය

බෝපත්පිටිරජනා අලු පොල කිරිදීය ඇලි ගලාය
ලා රන් සඳ පෙල නිහඬව රහසින් ඇඟෙ රූව බලාය
රැඩිත් දහවලටත් ඔ මිණි බරණින් සැරසිලා ය
රූමත් මිණිපුර මාතා අපිසැම කවියන් කලාය

තුන් සරණේ ගී සමඟින් මොන ගිරි සිරසින් ඇසේද
සුන්දර තර වෙසක් පඳුරු ඇත්තේ කොයි වන හිසේද
ලංකාවේ කවර දෙසක ඉර සේවය ඇස ගැසේද
පෙම්බර මව රුවන්පුරය වන නැති කවියෙක් වෙසේද

සංකපාල බුදුලෙන පොත්ගුල අද බුදු ගුණට යාව
සුන්දර තර වෙහෙර කියයි රුවන් පුරේ යට ගියාව
සංගීතෙන් ඉහ සොළවා නටමින් කළු ගං පියාව
සැංගී ඇති කවි සිත් කුල්මත් කොට දෙයි මිහිරි යාව

දම්සක් පල පිරුණෙ පලාබත්ගල මී අඹ ගසේ ය
ඉන්මතු වුණු සිදත් සහර හෙළ බස මිණි කිරුළ සේය
පන්ඩිතයන් වේරගමින් කළ සේවය සඳ රැසේ ය
සංසායන රාවය පැල්මඩුලු පුරෙන් තව ඇසේ ය

සිල්වත් වෛදේහ - දහම් කිත් - ඇ හිස නැමීය යුත්තො
හල්කඳලියෙ ලේකම් ඇලපාත මුදලි ආදී මුත්තො
හොල්ලා රුපු නොද කටුවන මාතර කොටු විජයගත්තො
සෙල්ලම්බඩු නොවෙති මොවුහු කොයි කවරුත් අපේඇත්තො

පැල්මඩුල්ල මාදම්පේ මුද්දුව මූවගම කළුගල
මල්වල සහ බලංගොඩත් පිරුවන් වෙති තැනූ සිසු කැල
මිල්ලවිටිය කරඳන යටිපව්වේ තැන්නේ ඕහ වල
සිල්වත් හිමිවරු දරුවෝ වෙති ඇඟෙ සිරිලක හෙළි කල

බූරුම රටෙ අග පඩු සක්විති වූ හිමි බලංගොඩ ය
දහම් විජම පෙළ කැරුවෝ කිරි ඇල්ලේ රුවන් පිඩය
එකම පුතා නිකුළස් හෙළ මහ සරසවි ගුවන් උඩය
හොඳම මැණික් නොවෙතිද මිණිපුර මවලද පුතුන් තමය

පොල් දෙල් කොස් පුවක් රබර් තේවතු ඇය සරු කළේය
තෙල්ලි අරළු බුළු රසකිඳ හැම ඔසු සඳගිරි කැලේය
නිල් වනයෙන් කුඹුරු සදා වසන්තයක් මැද ගිලේය
කල්‍යාණිය මිණිපුර මව සමන් දෙව්දු රැක වලේය

ලැබ ඇති දිය දහමං මවගෙ හැම දයාදය ක රැක්ම
ඉම නැති කර ඇති සේවය ඉර හඳ පවතිනා තෙක්ම
වැදගති මේ කිය යුතුවේ පෙන්වනුවට අයගෙ සිත්ම
අගමැති විය ලොවේ පළමු රුවන් පුරේ දියණියක් ම

දිය දහමේ අසිරි සිරිය හැඳිද හැමතැනම දක්ක
ඇය සතු හැම රහස් හැඟුම් වෙනුවෙන් ජීවිතය වික්ක
පියදර කවියෙනි මිණිපුර මව සුරතල් බලා රැක්ක
වැය කොට දිවි සාහිත රස බෙදමු සියලු කවින් එක්ක

# අත්තරගම බණ්ඩාර රාජගුරුතුමාගේ ශිෂ්‍යයෙකු විසින්කරණ ලද සිරි දළදා වැදීමක්.

සාරාසංඛය කප් සහස් මතු සුමේද නම තවුස් කල් උතුම
අත්පත් මොක් හැර මේ බවේ වැද ගොසින් දන් ඇ පෙරුම් දම් පුරා
මෝරා පින් විදුරස් තරු මරු බිඳා සවුනේ ගෙවා දත් උතුම
ඒ තුන් ලෝගුරු දම් රජුන් මෙදළද සාමි වඳින්නෙමි තොසින්

අත් පත් නත් අවි යුත් සහස් හිමි තොසින් ලත් සෙත් පිරිස්ගෙන් මහත්
පත්නම් යුත් ගිරිමේකලා ගොරබිරම් ඇත්ගෙන් සමුත් දප් සමත්
පත්වූ ඒ වසවත් මරුත් බිඳ රැගත් කිත්යුත් සුගත් වන් උතුම්
ඒ තුන් තිලෝගුරු දම් රදුන් මේ දළද සාමි වඳින්නෙමි තොසින්

මන්ගත් උස් මහතින් තමා සරි කෙනෙක් නැත්මයි සිතා ඒ මහත්
දික්ගොත් රා අසුරන් තමන් පද යුගින් මත්තෙන් නොදැක්වූ මුවන්
ඒ වික්මත් ඉඳුමත් ගුණෙන් යුතු නොමින් ලෝසෙත් පුරුදු උතුම්
ඒ තුන්ලෝ ගුරු දම් රජුන් මේ දළද සාමි වඳින්නෙමි තොසින්

වක්මින් සංජය කේලි සච්චක නමින් යුත් මිසදිටුන්ගෙන් මහත්
දප්සුන් එක් බසකින් මෙවන් බසිනුතුම තුන්ලෝ දහම් කොත් නැගූ
වාදී නැත් කුටුබුන් එසීරද සිරිත් යුත්තෙක් වියත් වූ උතුම්
ඒ තුන්ලෝ ගුරු දම් රදුන් මේ දළද සාමි වඳින්නෙමි තොසින්

හිස්බස් කිස් මනෙවින් දරින් බැඳ කුසේ පෙන්වූ සගප් වූ විලස්
පත්වීමෙන් සවනා බියෙන් දුටු විසින් මෙත් සිත් වැඩූ ඇ කෙරෙන්
සව්නේ දත් පැහැපත් සුපුන් සඳ සිරින් යුත් වත් විලස් නෙත් උතුම්
ඒ තුන්ලෝගුරු දම් රදුන් වේ දළද සාමි වඳින්නෙමි තොසින්

දෙව්දත් නම් පව්ටුන් වදන් ලද දනන් පෙවියෙන් සුරායෙන් එමත්
ගත්තාවූ යගදා මහත් දනපලුන් සක්කෝ දිමුත් ගිම නිවූ
මෙත් සිත් යුත් අබිසෙව්දියෙන් යුතු සමත් කිත්ගොත් තිලෝපත් උතුම
ඒ තුන්ලෝ ගුරු දම් රදුන් මෙදළදා සාමි වඳින්නෙමි තොසින්

# කේ. එන්. බී. චන්ද්‍රසේන මහතා.

කරඳන වීසූ සුප්‍රසිද්ධ ලේඛක පාඨශාලාචාර්ය කේ. එන්. ටී. ගුණදාස මහතාගේ පුත්‍රයන් තිදෙනා අතරෙන් කෙනෙකු වූ කේ. එන්. බී. චන්ද්‍රසේන මහතා ආදර්ශවත් බැවින් සම්මානයට පාත්‍ර වූ ගුරුභවතෙක් ලෙස හඳුන්වා දිය හැකිය.

ක්‍රි: ව: 1938 අගෝස්තු මස 16 වෙනි දින කරඳන දී උපත ලැබූ කරඳන ඈරව්විලාගේ දයාපාල චන්ද්‍රසේන මහතා මූලික අධ්‍යාපනය කරඳන රජයේ පිරිමි පාඨශාලාවෙන් ලබාගත් අතර උසස් අධ්‍යාපනය හොරණ ශ්‍රීපාලි විද්‍යාරත්න විද්‍යා පීඨයෙන්ද ලබා ගත්තේය. ක්‍රි: ව: 1957—1958 දෙවර්ෂය තුළ බලපිටියේ ගුරු අභ්‍යාස විද්‍යාලයේදී පුහුණුව ලැබූ ඔහු විදුහල්පතිවරයෙකු ලෙසින් මේ දක්වා සේවයේ යෙදී සිටී.

උතුරු කරඳන විද්‍යාලය— කරඳන ශ්‍රී ජිනරතන මහා විද්‍යාලය— ර/ කරඳන මහා විද්‍යාලය – නුගදණ්ඩ ඉහලගම විද්‍යාලය – කිරිඇල්ල ළදරු විද්‍යාලය – කිරිඇල්ල ශ්‍රී දේව රක්ෂිත ප්‍රාථමික විද්‍යාලය වැනි විද්‍යාලයන්හි උප ගුරුවරයෙකු— මුල්ගුරුවරයෙකු පරිෂද විද්‍යාල විදුහල්පතිවරයෙකු වශයෙන් විශාල සේවයක් කළ ඔහු මේ දක්වා එම කාර්යයේ නිරතව සිටී.

චන්ද්‍රසේන මහත්මා ප්‍රසිද්ධ ලේඛකයෙක් වෙයි. ඔහුගේ ලේඛන කලාව පිළිබඳව වඩාත් වැදගත් වන්නේ තම පියාගේ අප්‍රකට රචනා එකතු කොට එළි දැක්වීමයි. කරඳන ඉතිහාස ග්‍රන්ථය (1989) කරඳන මහා විහාර ඉතිහාසය (1979) යටිපව්වේ මීනී මැරුම් නඩුව අංක 1-2 (1988) කරඳන ශ්‍රී ජිනරතන නාහිමියන්ගේ ශාසනික සේවය (1962) වැනි ග්‍රන්ථ සම්පාදනය කිරීම සඳහන් කළ යුතුය.

කේ. එන්. ටී. ගුණදාස මහතාගේ නිබන්ධන වූ කෙළිකම් 1 – 2 – 3 (1988) බඹර සංදේශය අංක 1 — 2 (1987) කම්ත් හැල්ල (1948) යන පොත්ද පළ කරවිය. චූල්ල හත්ථි පදෝපම සූත්‍රයේ භාව සන්නය (1980) මාපිය දරු සමාජය (1981) ග්‍රන්ථද දහම් පොත්ද මුද්‍රණය කරවා නොමිලේ බෙද හැරීමද සඳහන් කළ යුතුය. සේවය කළ විද්‍යාලයන්හි පුස්තකාල ආරම්භ කර දියුණු කිරීමට ඔහු මහත් වෙහෙසක් ගෙන ඇත. එමෙන්ම විද්‍යාලීය සඟරා ප්‍රකාශන සම්පාදනය කිරීමට බලවත් උනන්දුවක් ගෙන ඇත. මේ නිසාම ඔහුට විවිධ ප්‍රශංසාත්මක ලිපි කිහිපයක්ම අධ්‍යාපන අංශයෙන් ලැබී ඇත.

කරඳන ශ්‍රී සුචරිතවර්ධන මරණාධාර සමිතිය - දකුණු කරඳන සණස සමිතිය – අක්කිදන බෞද්ධ සමිතිය – කරඳන ශ්‍රී ජිනරතන ගුණානුස්මරණ සමිතිය – කිරිඇල්ල සුභ සාධක සමිතිය වැනි පොදු සංවිධාන අලංකාර වූයේද ක්‍රියාත්මක වූයේද චන්ද්‍රසේන මහතාගේ ක්‍රියාකාරිත්වයෙනි, මහපෙන්වීමෙනි.

ක්‍රි: ව: 1992 දී ජාත්‍යන්තර ගුරු දිනය වෙනුවෙන් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරණ ලද උපහාර උත්සවයේදී සබරගමු පළාතේ

ඉතා ආදර්ශවත් විදුහල්පතිවරු සියදෙන අතරෙන් කෙනෙක් ලෙස චන්ද්‍රසේන මහතා උපහාර ලැබීය. මේ ක්‍රියාදමයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු පර්ෂද විද්‍යාල විදුහල්පති පදවියකින්ද පිදුම ලද්දේය.

කරදන විද්‍යාලයට හා තවත් අවශ්‍යතාවයන්ට ඉඩම් පරිත්‍යාග කිරීමටද නොමසුරු වූ චන්ද්‍රසේන මහතා කරදන ඇරපොල පාර කැපීමේ මහා ශ්‍රමදානයේදී ද පූරෝගාමීව කටයුතු කළේය.

චන්ද්‍රසේන මහතාගේ පියා ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ කතෘවර පඬිවරයෙක් වූවාසේම පවුලේ තවත් කීප දෙනෙක්ම ඒ තත්වයේ සිටි බව කිව යුතුය. තම ඥාතාගේ සහෝදරයෙක් වූ කරදන සෝභිත නායක ස්වාමීන් වහන්සේද තමාගේ සුළුපිය කෙනෙක් වූ කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. කරදන ප්‍රදේශයේ ඓතිහාසික ස්ථාන පිළිබඳව වරින් වර ඔහු "සමගිය" වැනි නොයෙකුත් සඟරා වලට ලියන ලද ලිපි මහත් රාශියකි. කරදන ගල්ලෙන් විහාරය - කිරිඇල්ලේ නෑදුන් රජමහා විහාරය වැනි ස්ථාන ගැන වටිනා ලිපි ඔහු විසින් සපයා ඇත.

# පූජ්‍ය පණ්ඩිත ඇරැපොල පේමරතන ස්වාමින්වහන්සේ.

කුරුවිට කෝරළේ මැද පත්තුවට අයත් ඇරැපොල පදිංචිව සිටි ඇරැපොල ලියන ආරච්චිලාගේ පොඩිසිඤ්ඤෝ අප්පුහාමි සහ කරදන ලේකම්ලාගේ කිරිමැණිකේ යන දම්පතීන්ට ක්‍රි: ව: 1903 දී ලැබුණු කුඩා දරුවාට ගුණවර්ධන යන නම තබන ලදී.

කුඩා අවදියේදී ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබාගත් මෙම දරුවාගේ අභිලාෂය පරිදි ක්‍රි: ව: 1916 වර්ෂයේ දී ගමේ පන්සලේ දී පැවිදි බිමට පිවිසියේ කහවල සුවිසුද්ධාරාමාධිපතිව වැඩ විසූ මීවනපලානේ විපුලසාර ස්වාමීන් වහන්සේගේ ආචාර්යත්වයෙනි. පැවිදිවූයේ ඇරැපොල පේමරතන නාමයෙන්ය

ක්‍රි: ව: 1928 දී මල්වතු මහා විහාර උපෝෂිතාගාරයේ දී පහමුණේ මහ නායක හිමියන් උපාධ්‍යායව හැරම්ටිගල ශ්‍රී ධීරානන්ද නායක හිමියන් හා ශ්‍රී සද්ධර්ම කීර්ති ශ්‍රී කරදන ජිනරතන නායක හිමියන්ද කර්මාචාර්‍යව මල්වතු විහාරයේ ගරුතර සංඝ සභාව වෙතින් උපසම්පදාව ලැබුවේය.

1930 වර්ෂයේදී රත්නපුර සුධර්මශාලා පිරිවෙන්හි ද 1936 දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණටද ඇතුලත්ව උසස් අධ්‍යාපනය ලැබූ මෙම ස්වාමීන් වහන්සේ දක්ෂ කවියෙකු විය. ඒ ස්වාමීන් වහන්සේ රචනා කරණ ලද කවි කීපයක් මෙසේය

පොසොන් පොහොය දිනය ගැන.

අද වැනි පොසොන් පුර පසළොස්වක් දක
ඔබ සම්බුදු සසුන මෙහි පිහිටෙව් සේක
ඉවසුම් මෙමෙව පුරුදුයි ඇසුරෙන් ඒක
නැතිනම් මමයි හිමියනි වණ්ඩා ශෝක

සිංහලයිනි,

අනුර විජිතපුර සීගිරි පොළොන් නරු
නගරවල විසූ නිදහස් බෙලෙන් සරු
එවර මුතුන් මිත්තන් කළ වැඩ මහරු
මෙවර බලව සිහලුනි කොතරම්ද ගරු

කිසිත් බියක් නැති හරි පිරිමියෙකු ලෙසින්
කැමැත්තෙන්ම නිදහස් රණ බිමට ගොසින්
මළොත් නුඹේ සොහොනට දෙවියන් අහසින්
අවුත් මදරා මල් දම් පුදත් තොසින්

අතපත් අවිය නොතබා නිදහස කැන්දූ
හෙළ පුත් රුවන ලක් මවගේ මන බැන්දූ
මැරුණත් ඔබෙ නමට බැඳගෙන ගී සින්දූ
කවදත් කියති රස කර කර සුර ළන්දූ

# පූජ්‍ය කොටාමුල්ලේ මේධංකර ස්වාමීන් වහන්සේ.

රත්නපුර කුරුවිට එක්නැලිගොඩ අභයතිලක රත්නා රාමාධිපතිව වැඩවිසූ මෙම ස්වාමීන් වහන්සේ කවියෙහි දක්ෂයෙක් වී ඇත. ඒ ඒ අවස්ථාවලදී ලියූ කවි රාශියක් තිබෙන බව සඳහන් වෙයි. මේ ස්වාමීන් වහන්සේ ලියා ඇති කවි කීපයක් මෙසේය.

අතත් සිතත් පිරිසිදු මහ ගුණා වන්
නෙතුත් වතුත් යෙදු දුගීවෙත මනා වන්
දිමුත් සපිරි රුසිරෙන් දන පිනා වන්
මතුත් අපට මැති සඳ වාසනා වන්

නීති රීති දැනුමෙන් සුර ගුරා වන්
පීති පැති ගුණයෙන් නිසි යුරා වන්
බීති ජාතියෙන් තොර කෙස රිද වන්
ජාති ජාති මැති ඔබ වාසනා වන්

මනහර සමන් කුළු පායෙන් බැස වෙසඳ
නෙකයුරු රුවැති පෙනපිඩු අබරණ පැළඳ
සිරිබර සොඳුරු කළුගඟ අභන මනනද
සමුදුරු හිමි වෙතම යන රඟබල සබඳ

# තිඹිරිපොළේ අදිකාරම්.

දෙහිඔවිටට නුදුරු කුඩා ගමක්වූ තිඹිරිපොල සිටි තිඹිරිපොළේ අදිකාරම් කුමා දක්ෂ කවියෙක්ව සිටි බව සඳහන්වේ. මොහුගේ කවි කීපයක් මෙසේය.

වැදූ කුසේ වාමින්නේ නැති සෑටී දෙමව්පියන් සීත මලක් වැනී
සෑදූ සියලු සැප සම්පත් දූන්නත් දරුවන්ගේ සීත ගලක් වැනී
ලදූ සියලු ගම් බිම් පරවෙණි මව්පියන්ගෙ ඇති සැමදේම ගනී
වැදූ කුසේ පව් කොහෙත්ම නොසිතයි දෙමව්පියන්හට යකෙක් වැනී

ගුරුව උපන් ජාතක දරුවෝ දැන් මව්පිය නොබලන බව දන්නේ
දරුව ජාතිණය ගන්ධපතාගෙන පෙලක් ඇවිත් කුස උප දින්නේ
බැරුව වැටුණු ද වස්තුව නැත්නම් බල්ලෙක් විතරත් නොතකන්නේ
බොරුව නොවේ මෙපද අහපල්ලා තිඹිරිපොළේ මැතිඳුගෙ සන්නේ

# හංගමුවේ ජයසිංහ මනම්පේරි මහතා.

හංගමුවේ ජයසිංහ මනම්පේරි රචනා කළ කවි කීපයක් මෙසේය.

නැතිකම දිළිඳුකම ලෝකයටම තිත්ත
මහ පිළිකුලකි කාගෙත් ඇති අක මැත්ත
දනවත් කමෙන් මුලු දිවියම රැක ගත්ත
කිසිවෙක් වෙයිද ඒකයි විම සිය යුත්ත

ඇතී නැතී දෙකේ අතරෙහි ඇති පර තරය
පෙර හා අපර මෙන් සැසඳිය හැකි දුරය
එකිනෙක ගැටෙන තැන තතු මහ බිය කරුය
නොසිතිය හැකි වූ පමණට ජර දුක් බරය

තනිකර දමා ලොව නොතකන දිළිඳු කම
යසිසුරු ගෙනගෙන සතහන සිතැඟි තම
දනපතී කමට හිමි වීය යුතු නියම නම
වැඩි දෙනෙකුගේ දුප්පත්කම කියනු කිම

# කරඳන තිලක මහතා.

රත්නපුරේ කුරඳන තිලක ලියූ කවි කීපයක් මෙසේය.

පොදු වැඩ වලට ලැදි සන්ද මගේ සිත
පිළිගත නොහැක අන් අය ඒ වගේ නැත
සිතිවිලි නොමහ යන හැටි මේ යුගේ කැත
සිහිවත කඳුළැලින් දිව රෑ පෙහේ නෙත

කැත අදහස් වලින් පිරි පුහුදුන් එක්ක
මහ මග ගියහුටත් බැට දුදනන් දක්ක
හැකි වුව නමුත් රට වැට බඳිමින් රැක්ක
සුරැකිය හැකිද කටවල් කරමින් මක්ක

වැදි බණ දෙසන්නන් හා උරෙන් උර ගැටී
සුදුව සුරාවද ඇබ්බැහි නොකර සිටී
සුදනන් වෙතොත් සුළු කොටසක් අතර වැටී
පාගන තුරුම මුහුණෙහි ඇත අඳුර කැටී

සමගිය සමාදනය සහමුලින් සිදී
දෙස් පාළනය කරගහගත් බැවින් බිදී
මූලිකයන් නොවැති ගම් යස සිරින් හිදී
පුපුරයි මගේ හද යාවිද මෙයින් මිදී

පෙර මෙහි තිබුණ සහයෝගය අයින් කර
පිරිහුණු රටක් කරගති ලක සිරින් තොර
ළදුවත් උපත යලි උතුමන් වරින් වර
දිනිසුරු මෙනි අහස ගනඳුරු වලින් බර

# කන්දෙ වලව්වේ ආතර් ඇහැලියගොඩ මහතා.

රත්නපුර ඇහැලියගොඩ කන්දෙ වලව්වේ විසූ ආතර් ඇහැලියගොඩ දක්ෂ කවියෙක් විය. මෙම කවියා රුවන්පුර ගැන ලියූ කවි කීපයක් මෙසේය.

1) නව යොදුන් කුරුවිටි කුකුල්වනසිරින් අඩුවක් නැති කොලොන්නද
අටකලන් කඩවතද මැද කෝරල හතෙන් සොඳ ලෙස සැදුම් ලද
මිණි රැසින් වත කුමුදු පුබුදන පිහිටි සමනොළ මුනිඳු සිරි පද
මෙම රුවන් රට උපන් අයහට වෙන සැපක් අන් තැනක මොකටද

2) කලක් යනවිට පොළොව යට ඇති කුඩා ගල්කැට දලන් සේ විය
දලන් සන්නත් තවත් කල්යන විටදි වටිනා මැණික් වේ මය
ගලක් මැණිකක් කරණ බලගතු ගුණය මේ පස්වල තිබෙමය
එයින් මිණිබිම කිසිම බිමකට දෙවෙනි නොව අගතැන් ගනීමය

3) තිලොව තිලකවූ මුනිඳු සිරිපද පිහිටි සමනොළ මෙරට කන්දකි
කෙරුව ඇරයුම් පතුල තබනට දෙවිඳු මිතුමොක් සැප ලබන්නෙකි
බරව කුසලට සාදු නද එහි පවත්වන මහ සාදු සද්දෙකි
මෙලොව හැමකඳු රැසම සිරිපද කන්ද පාමුල කුඩා කෙන්දකි

4) ඇසල නිකිණියෙ සිරිත් විලසට ලබයි පෙරහර කරණ වාර ය
එකල මිණිපුර සමන් දෙවොලට ගලයි බැති මහ ජන පිටාර ය
සකල උවදුරු වලින් මිදෙනට වෙමින් නෙකවිදි බාර හාර ය
පතල තෙදබල සමන් සුරිඳුට කරණ පෙරහර අති උදාරය

# මාරපන කිරිහාමි.

රත්නපුර මාරපන ප්‍රදේශයේ විසූ කිසි උගත් කමක් නැතත් හිතු හැටියේම කවි කියන්නට හැකියාවක් තිබූ මොහු විකට කවියෙක් ලෙසින් එකල ප්‍රසිද්ධව සිටිය බව දැන ගන්නට ඇත. ප්‍රදේශයේ විසූ උපාසක මහතෙක් දිනක් ඔහුට කවියක් කියන්නට යයි කියා ඇත. මෙම උපාසක රාලගේ හොර අඹුවක් සිටිය බවත් මේ වනවිට ඇය ගැබිනියකව සිටි බවත් මාරපන කිරිහාමි දැන සිටියේලු. ඉල්ලීම ඉටු කරමින් මේ කවිය කීවේලු.

වග දන්නා උපාසක රාල තමුසෙ ට
සැල වෙන්නා ටික ටික දැන් ලෝ කෙ ට
බඩ එන්නා නෙරවාලා ඉස්සර ට
උඹ දන්නා බෙතක් නැද්ද ඒක ට

උදෑසන ගොම අවුලමින් සිටි පාසල් ළමයින් කීප දෙනෙක් දුටුවිට මේ කවිය කියා ඇත.

එළවළු වවන්නට කියමින් උදෑසන
කොලහල කර ළමයින් අවුදින් නිතින
වෙල සැමතැන තිබෙන ගොමටික ගෙන යමින
බල පිරිසිදු කරණ සැටි දෙමළුන් ලෙසින

තවත් දිනක ගමේ බන්ඩියා නමින් සිටි කොලුවෙකුට මේ කවිය කීවේලු.

මන්ඩියක් නොවෙද ගොවිතැන් කරන්නේ
හන්දියක් නොවෙද වැඩකොටු බදින්නේ
දන්ඩියා නොවෙද දියපිට පිනන්නේ
බන්ඩියා මොකද කරබාගෙන ඉන්නේ

දිනක් ගමනක් යමින් සිටියදී කෝපි කඩයකට ගොස් කෝපි බී ඇත. කෝපි සමඟ ලැබුණු හකුරු කෑල්ල කුඩා වූ නිසා ඔහුගේ හිත නරක් විය ඒ ගැන ඔහු මෙසේ කියා ඇත.

කඩේ සිටින අංගොගෙ මූනේ නපුරු
බඩේ ගින්දරට ඉල්ලුවෙමී හකුරු
තුඩේ තියන්වත් මදි සල්ලියෙ හකුරු
කඩේ ගිනිවැදෙයි වෙළඳමෙන් නපුරු

දිනක් කුඹුරු වැඩට ගිය කිරිහාමිට දවල් බත සමඟ ලැබුණ ඉස්සන් හොද්දෙහි කෑලි නොවීය හිත නරක් වූ කිරිහාමි මෙසේ කීවේලු.

උස්සා නොවෙද උඩ සේවය කරන් නේ
පිස්සා නොවෙද ගල උඩ ගේ හදන් නේ
විස්වාසෙට නොවෙද ගැහැණුන් ගෙනෙන් නේ
ඉස්සන් දෙන්න ඇයි හැන්දට නේන් නේ

# ගලගම විලියම් අප්පුහාමි මහතා.

රත්නපුර බෙලිහුල්ඔය ගමෙහි උපන් ගලගම විලියම් අප්පුහාමි කවියා එඩිතරව කවි ලියූ කෙනෙක් වශයෙන් සඳහන් වෙයි. ඉංග්‍රීසි, පාලි, සංස්කෘත යන භාෂා පිළිබඳවද හොඳ අවබෝධයක් තිබූ මොහු ගම්සභා ලිපිකරුවෙක් වශයෙන් කටයුතු කරණ ලද බව සඳහන් වෙයි. නිතර පුවත්පත්වලට ගලගම කිවියර නමින් කවිලියා ඇති මොහු මොක්පුර මාවත හා කරගස් තලා ඉතිහාසය නමින් කවි පොත් දෙකක්ද ලියා ඇත. ඔහු ලියා ඇති රසවත් කවි කීපයක් මෙසේය.

බෙලිහුල් ඔයේ ගල් සෙලවෙයි ලිස්සන වා
හිරිකටු ඔයේ හෙල වැහැලා බොරවෙන වා
ඉහින් කතින් කුඩැල්ලන් ලේ බොන වා
දුප්පත් කම නිසා රස්සාවට යන වා

කණ්නඩි දමා බස්තම ගෙන හඳ පානේ
චන්දය හිභාගෙන ගොස් පිළිකනු ගානේ
චන්ගෙඩි ගුරා එනකොට නෝනගෙ මූණේ
සැන්ගානවලු උපගුරු වැතිරී යානේ

# ඔමල්පේ හෙන්රි තෙන්නකෝන් මහතා.

විකට චිත්‍ර ශිල්පියෙකු වශයෙන් ප්‍රසිද්ධව සිටි ඔමල්පේ හෙන්රි තෙන්නකෝන් ද සබරගමුවේ උපන්, ළමා වියේ සිටම කවි නැඟීමේ හැකියාව පළ කළ කවියෙකි. ඔමල්පේ විද්‍යාලයෙහි හිටපු විදුහල්පතිවරයෙකු වූ පුංචි අප්පුහාමි තෙන්නකෝන් මහතා ඔහුගේ පියා වූ අතර මව වූයේ සේනානායක මාබරණ දෝන ගිමාරා හාමිනේය. 1930 දී ඔමල්පේ දී මෙලොව එළිය දුටු හෙන්රි තෙන්නකෝන් රත්නපුර සිවලී විද්‍යාලයෙන් අධ්‍යාපනය හදරා පසුව චිත්‍ර කලා ගුරුවරයෙකු වශයෙන් රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කයන් හි විදුහල් කීපයකම සේවය කළේය.

ළමා කාලයේ පටන්ම හෙන්රි තෙන්නකෝන් කවි ගෙතීමෙහි හපනෙකු වූයේය. ගැමියන් සමග ළඟින් ඇසුරු කළ ඔහු ගමේ සිදුවන යම් යම් සිද්ධීන් අළලා හිටිවන කවි කීමෙහි ද සමතෙකු විය. ඔහුගේ වැඩිමහල් සොහොයුරා විවාහ වනවිට තුදුස් වියෙහි පසුවූ ඔහු තැපැලෙන් ලැබුණු සොහොයුරා ගේ මංගල ජායාරූපය ලැබුණු බව දන්වමින්, තම මැණියන් ලියන විලසින් පහත සඳහන් කවිය ලියා සොහොයුරාට තැපැලෙන් යැවීය.

එම්බා පුත්තරය එම්බා පුත්තර ය
ගොම් බානක් වගෙයි උඹලගෙ චිත්තර ය
තම්බා කකා මගෙ ආසිරි බිත්තර ය
කම්බායක් එවනු සමඟින් උත්තර ය

පාසැලේදී යහළුවන් සමඟ එකතු වී කවි සහරා ලිවීම ද ඔහුගේ විනෝදාංශයක් විය. කවි ලිවීමෙහිදී සරළ සුගම ශෛලියක් අනුගමනය කළ ඔහු ගේ කවි බොහෝ විට උපහාසය දනවන හාස්‍ය රසයෙන් යුක්ත විය. වරක් නිවසේ නවාතැන් ගෙන සිටි ගුරු මහත්මියකගේ සටහන් පොතක තිබූ පිරිමි කේන්දරයක් තෙන්නකෝන් කවියාගේ නෙත ගැටිණි. කේන්ද්‍ර හිමියා ගේ දසාව සඳු වූ අතර ඔහුට හංස නම් යෝගයක් ද යෙදී ඇති බව කේන්ද්‍රයේ සටහන්ව තිබුණි. තෙන්නකෝන් කවියා එම කේන්ද්‍ර පිටපත යටින් මෙසේ ලිවීය.

" දසාව සඳු හට බාරයි ඒ මදිවට හංස යෝගෙ
කසාද බැන්දෙත් නියතයි හැඳේ ඔහුට අංස බාගෙ "

වරෙක තෙන්නකෝන් කවියා සිය මිතුරෙකුට මුදලක් ණයට දුන්නේය. මෙම ණය මුදල ඉක්මණින් ආපසු ගෙවන බවට මිතුරා පොරොන්දු වුව ද මාස කීපයක් ගත වුවත් මුදල් ආපසු ලැබෙන බවක් නොපෙනුණි. තෙන්නකෝන් කවියාට ඔහු ගෙන් ණය මුදල ගැන විමසීමට සිතුණි. ඒ සමගම මිතුරාගේ සහෝදරිය ද ඇයගේ දියණිය සමඟ පැමිණ තමාගෙන් ණය මුදලක් ලබාගත් බව ඔහුට සිහිපත් විය. ඒ පිළිබඳවද සටහන් කර ඔහු පහත සඳහන් කවිය සිය මිතුරාට ලියා යැවීය.

උඹට නැති බැරි වෙලාවට මට තිබුණු මුළු සේසතම දුන්නා
උඹේ අක්කත් දුවව පෙන්නා මගේ චැක් කොළයකට ඇන්නා
මගෙන් ගත් ණය අද දෙතැයි හෙට දෙතැයි මං ඔහේ බලා උන්නා
සල්ලි බැරි නම් ලේලිවත් මට දියන් මා ඇය බාර ගන්නා

තමාට ලැබෙන ලිපිවලට කවියෙන් පිළිතුරු යැවීම තෙන්නකෝන් කවියාගේ විනෝදාංශයක් විය. විටෙක ඔහුගේ මවට දුවකගෙන් ලැබුණු ලිපියකට පිළිතුරු ලිපියක් ලියන ලෙස මව තෙන්නකෝන් කවියාගෙන් ඉල්ලා සිටියාය. එයට පිළිතුරු වශයෙන් ඔහු ලිව් කවි පංතියකින් උපුටාගත් කවි කීපයක් මේ.

එව් පත ලැබිණි එව් දවසට පහුවෙන් ද
අපි හැම දෙනම එය කියවා රස වින් ද
එනමුත් අනේ පිළිතුරු පහු වුණු හින් ද
පොඩ්ඩුව මගේ තරහා වෙච්ච මන් ද

ළඟදී කාමරංගා පිටියේ දූ ට
වැළඳුණි පැපොල බෝ වීලලු බෑණා ට
කරුමෙක මහත මේ ගස්ලබු මදිවා ට
හැඳුණලු සරම්පත් ඇගෙ පොඩි පැටවුන් ට

ලඟකදී ආවෙ නෑ දුව රත්මලවින් නේ
ඇය දූන් කාමාරංගා පිටියෙයි ඉන් නේ
ලෙඩ දුක් තියෙද්දී අක්කගෙ ළමයින් නේ
ඇයි දෙවියනේ ඇ කොහොමද පිට ඉන් නේ

නිවාඩුවට එන අය තව නැත ආ වේ
මුල් දින තුන හතර තනිවයි ගත වූ වේ
යන්තම් පරණ අවුරුදු දා හැන්දූ වේ
පොඩි කොලු කොහේදෝ ඉඳලයි පා වූ වේ

ආද හිටම හොඳ හොඳ සෙල්ලම් පැවා
ආසා කෑම සාද දෙන්නැයි කී වා
හඳලා දීලාත් උඹ කිව් කිව් ඒ වා
අවුරුදු පැලේ තිව් ඒවත් උඹ කෑ වා

මෙහිදී කවියා "පොඩි කොලු" යනුවෙන් හඳුන්වා ඇත්තේ තමාමය.

වරෙක පව්ලේ අය සතුටු සාමීච්ඡයේ යෙදී සිටි අවස්ථාවක එකිනෙකා ගේ හිටිවන කවි කීමේ හැකියාව මැණ බැලීමට තෙන්නකෝන් කවියාට සිතක් පහළ විය. කවි කීම ආරම්භ කළ ඔහු එතැන සිටි තමාගේ වැන්දඹු සොයුරියට මේ කවි කීවේය.

බලමින් සිට මල්ලිගෙ ඇස් බැන්දු න්
ඇ දූන් වී ඇත අන්දුන් කුන්දු න්
කොපමණ සිටියක් ඇ හට බන්දු න්
දූන් කාලෙක සිට ඇ කණ වැන්දු න්

කවි ගෙතීමේ සහජ කුසලතාවක් තිබුණ ද තෙන්නකෝන් වඩාත් ප්‍රසිද්ධ වූයේ විකටචිත්‍ර ශිල්පියෙකු වශයෙනි. ලංකාදීප පුවත්පතට ඔහු ලියූ සමාජ සමයං හා විහිළු තහළු ද සිළුමිණ පුවත්පතට ලියූ පොඩි එකාගේ ලියුම ද බෙහෙවින් ජනප්‍රිය විය. තෙන්නකෝන් කවියා එකුන් පණස් වන වියේහිදී එනම් 1979 වසරේදී මිය ගියේය.

# දෙමුවාවත ප්‍රේමාලෝක හිමි.

" දෙමුවාවත ප්‍රේම කුමාර් " යන ආරූඪ නාමයෙන් පෙනී සිටිමින් කොළඹ යුගයේ කවි පරපුරේ පුරෝගාමියෙකු ලෙස නමක් දිනාසිටි පූජ්‍ය දෙමුවාවත ප්‍රේමාලෝක ස්වාමීන් වහන්සේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළයේ මැද පත්තුවේ රක්වාන දෙමුවාවත ගම් ප්‍රදේශයේ උපන්නේය.

1928 ජුලි මස 17 වෙනි ද උපත ලැබූ අතර පැවිදිවීමට පෙර හඳුන්වනු ලැබුයේ ඇහැළඹ ආරච්චිල්ලාගේ අන්දියස් අප්පුහාමි යනුවෙනි.

දෙමුවාවත ශාන්ති නිකේතනාරාමය හා පන්නිල බුද්ගල්ලෙන යන විහාරද්වයාධිපති අතිගරු පන්නිල පියරතන ස්වාමීන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1943 මැයි මස 20 වෙනි ද දෙමුවාත ප්‍රේමාලෝක නමින් පැවිද්ද ලබා ඇත.

පැල්මඩුල්ල ශ්‍රී සුධර්මෝදය පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනේ උසස් අධ්‍යාපනය ලබා ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් හා විද්‍යාලංකාර පිරිවෙන මගින් පැවැත්වූ සාහිත්‍යාචාර්ය විභාගයෙන්ද සමත් වූ මුන් වහන්සේ රත්මලාන පරිවෙණාචාර්ය අභ්‍යාස විද්‍යාලයේද පුහුණුවක් ලබා ඇත.

දිස්ත්‍රික්කයේ පිරිවෙන් කීපයකම ආචාර්ය වරයෙක් වශයෙන් කටයුතු කළ දෙමුවාවත ප්‍රේමාලෝක හිමියන් අපවත්වන තුරුම වැඩ වාසය කළේ සමරකන්දේ පුරාණ ගල්ලෙන් විහාරයකය.

කවි මඩුවල මුලසුන දරමින් කාව්‍ය සංවාද මෙහෙයවීමෙ හැකියාවක් තිබූ මුන් වහන්සේ පුවත්පත් සඟරාවලට ලියූ කවි ප්‍රමාණය අති විශාලය. සබරගමු පළාත් සභාවෙන් කාව්‍ය විශාරද සම්මානය ලැබූ මුන් වහන්සේ කවි ධර්ම දේශනයට ද දක්ෂයෙක් විය. දෙමුවාවත ප්‍රේමාලෝක හිමියන් රචනා කරණ ලද පද්‍ය කිපයක් මෙසේය.

වනරොද විසින් ගිලගත් දිගු කලක් වෙත
බියකරු බවක් පාමින් කලු ගලක් මත
විෂ්මය ජනක බලයක් රැඳි සුරත් සිත
නා ගස් දෙකක් මැද තනි බෝ ගසක් ඇත

මට බත බුලත තේ ටික ළඟවම ගේන
සමහර විටක අහුමුළු අතපත ගාන
උපහාසයේ කෙවිටෙන් ඉවතට දන
ලස්සණ දකුම් කළු පොඩි දරු වෙකි සේන

කෙතරම් වෙහෙසුනත් දයිවය හරහ ටය
සැනසුම සතුට දෙක ලැබගනු උගහ ටය
කොයිදේ කළෙත් කොයි කවදත් එළි පිටය
ඔහුගේ මුදල් පෙට්ටීය මගෙ ඇද යටය

ලස්සණ ලලිත ශතියෙන් සුරලොවින් බට
දෙව ගෙන කැයි හැකිය කෙනෙකුට හිතත් නාට
වෙහෙසෙන නිතර ඇගෙ නෙත් පුද ලබත් නට
පොරකති තරුණ සිටුවරු අඩ දතින් සිට

වටිනා ඇඳුම් පැළඳුම් ඇඟ දරා ගෙන
සහරා මිටියකුත් සුරතෙහි රැවා ගෙන
වැදගත් කෙනෙකු මෙන් තොරතුරු කියා ගෙන
ආවා කෙනෙක් දවසක් මා සොයා ගෙන

# දේවාලෙගාව නිමල් කුමාරවංශ මහතා.

සබරගමු කවි පරපුරේ ශ්‍රේෂ්ඨතම කවියෙක් වූ දේවාලෙගාව නිමල් කුමාරවංශ මහතා කොයි කා අතරත් ප්‍රසිද්ධ වූයේ " කුමාරේ " යන නාමයෙනි. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් හින්දි විෂය සහිතව ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත් කුමාරවංශ කවියා රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලයට හින්දි ගුරු භවතෙකු ලෙසින් සේවයට පත්විය. ඉන්පසුව නිවිතිගල සුමන මහා විද්‍යාලයේ ද රත්නපුර ධර්මපාල මහා විද්‍යාලයේ ද සේවය කළේය. දරුවන් හතර දෙනෙකු ගේ පියෙකු වන කුමාරවංශ කවියා අසනීපය නිසා විශ්‍රාම ලැබීමේ නියම වයසට පෙරාතුවම විශ්‍රාම ලැබිය.

අවස්ථාවට ගැලපෙන කදිම කවි කීමෙහි හැකියාවක් දක්වූ ඔහුගේ කවි බොහෝ ජනප්‍රිය විය. දිනක් . . . . මඟුල් ගෙදරක පවත්වන ලද සාදයක දී නිවසේ සිටි හැමදෙනාට පෙනුමෙන් කවි කී ඔහු කුස්සියේ සිටි දර පලන කළු තරබාරු පුද්ගලයා ගැන ද කවියක් කීවේ කාගෙත් ආරාධනයෙනි.

ඇඟ පත කළුය ලොකු උඩු රැවුලකි මූනේ
රැයකදි එහෙම දුටුවොත් බිය වෙන වානේ
කට රත්මලානේ දත් ටික අඟු ලානේ
මොහු පිට කොටුවෙ යන විට බඩ මර දනේ

අර්ථයෙන් මෙන්ම රසයෙන්ද පද සංවිධානයෙන් ද යුත් කුමාරවංශ කවියා ගේ කවි ගුණයෙන් හා හරවත් බවෙන් යුක්ත විය.

එකල රත්නපුර ප්‍රදේශයේ කුමාරවංශ කවියාණන් නැති කවි සංවාදයක් හෝ සාහිත්‍ය උත්සවයක් හෝ නොමැති තරම විය. කුමාරවංශ කවියා රචිත පද්‍ය පන්තියක් මෙසේය.

## මල් නැති වැල්

යව් වන බඹර සමනලුනට යටින් සිට
ලව් කික සුවය විඳුමට පැන වටින් ගෙට
යව් වන කුසුම් දෙන ලියකට විටින් විට
ගව් රව ලබන්නට පිළිවන රටින් රට

කුල් මත් වෙවී කියු ගී බිඟු කැලට දෙඩා
නිල් පැහැ ගැහී විඳ යව්වන කලට විඩා
වැල් යන නමුත් මිළිනව හුර තලට හඩා
මල් ඇති වැලය හැඩ මල් නැති වැලට වඩා

බිඟු දැල් බමන මුමුනන මල් පිපුණ වැල
නොයි දූල් කැකුළු නලවන විට වදුලු තුළ
සමනල් බඹර මීහි ලොල් වන විහඟ කැළ
පිළිකුල් කරති! මල් නැති වැල් සියලු කල

වැඩිපුර කුසුම් හටගත් විට වැලක හිමේ
එහිබර ලියට දනුනත් පල දරණ සමේ
සිරිහර රසය ගෙන එනවිට මලවී තෙමේ
නැතිකර ජනක බල වැල ගස දෙසට නැමේ

ර ත් සර කැකුළු පියකරු මල් පිපුණු වැලේ
ම ත් වන බඹරු හැසිරෙති! ඉව වැටුණු වෙලේ
සි ත් කල් කුසුම් නැති තුරුලිය වැඩුණු කැලේ
නෙත් අඳවීම ලොකු සැපතකි! ඉහල පෙලේ

පමණට වැඩිය මල් පිපුනම වැලක ලොවේ
ගසකට බරකි දුකකින් කල දවස ගෙවේ
නැතිවිට එකම මලකුදු සැප සතුට සුවේ
විඳිනට නොහැක! තුරුලිය එය කැමති නොවේ

මල් හට ගැනුණු විට තුරුහිමි පහස ලැබී
වැල් වල අගය වැඩිවී උයනකට ඔබී
කල් ගත කරන්නට දිවියෙම කඳුලු! බිබී
වල් බිහි කරණ මල් නැති වැල් මොටද තිබී

ගසකට මීසක සුරකින තුරුලිය කුලය
වැලකට නොමැත! එහි මල් පුබුදින බලය
කලකට නොපරවන බී පිණිකැට
මලකට හැකිය බබලන්නට මුළු

# කරදන විද්‍යාරත්න මහතා.

කරදන ජිනරතන මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා රජයේ ලිපිකරුවෙකු වශයෙන් රත්නපුර දිසාපති කාර්‍යාලයේ සේවය කරණ ලද මෙම කවියා විශ්‍රාම ලැබීමට පෙරාතුවම වයස අවුරුදු හතලිස් හතර ලැබූ අවස්ථාවේම හෘදයාබාධයකින් මිය පරලොව ගියේය. කොයි කාගෙත් හොඳ හිත දිනාගත් මොහු දක්‍ෂ වොලිබෝල් ක්‍රීඩකයෙකු විය. ගොවියෙක් හා වඩු කාර්මිකයෙකු ලෙසින් ජීවන වෘත්තීන් රැසකට සම්බන්ධව කටයුතු කළ ඔහු විනෝද කාමියෙකු විය. කවි ලිවීමට මෙන්ම කවි කීමටද සහජ දක්‍ෂතාවයක් දැක්වූ කරදන විද්‍යාරත්න කවියා නිතර පුවත් පත් සඟරා වලට කවි ලිව්වේය. සුප්‍රසිද්ධ කිවි පී. බී. අල්විස් පෙරේරා මහතා ගේ ශිෂ්‍යයෙකු වූ මොහු සබරගමු කවි මණ්ඩලයේ සාමාජිකයෙකු විය.

# දිමියගොඩැල්ලේ මුදියන්සේ මහතා.

කුරුවිට සිත්ගස්වත්ත රජයේ විද්‍යාලයේ අකුරු කරවූ දිමියගොඩැල්ලේ මුදියන්සේ කවියා "කුරුවිට දිමියා" යන අන්වර්ථ නමකින් ද කවීන් අතර ප්‍රකටය. එරෙව්වම වෙල්යායකින් මැදිවූ දිමියගොඩැල්ල ගමෙහි පිහිටි ඔහුගේ නිවහන ර දවස්වල කවීන්ට තෝතැන්නක් විය.

අංගනුවර තරුණ කවි සමාජයේ සාමාජිකයෙක් වූ ඔහු කවි ගෝලයන් සිය ගණන් බිහි කොට ඇත. එම සේවය අගයකරමින් සිය ගෝල පිරිස හිතවත් කවීන්ගේ හා ගම්වාසීන්ගේ සහයෝගයෙන් 1992. 09. 15 වෙනි දින දිමියගොඩැල්ලේ මුදියන්සේ කවියා සමරා උත්සවයක් පවත්වන ලදී.

ඇඳුම්- පැලඳුම, ගෙදර- දොර ගමන බිමන කතා බහ පමණක් නොව කවි ලිවීමේදිද කියවීමේදිද විශේෂත්වයක් දක්වූ දිමියගොඩැල්ලේ කවියාගේ පද්‍ය පන්ති ලක්දිව සෑම ප්‍රසිද්ධ පුවත්පතකම වාගේ පලවී ඇත. පළනොවූ කවි පන්ති සිය ගණනක් වෙති.

සමුද්‍රඝෝෂ විරිතෙන් කවි හතලිහ පනහ එකම තැපැල්පතේ ලිවීමෙහි දක්‍ෂතාවයක් දක්වූ ඔහු නිතර හිතවතුන්ට ලිපි ලියන ලද්දේද කවියෙන්ම විය. සිංහල භාෂාව හැසිරවූ අන්දමද ඉතා උසස්ය.

කවි නීති රීති සිංහල ව්‍යාකරණ නීති රීති අකුරටම පිළිපැද කවි ලිවීමට හැකියාව ලැබී ඇත්තේ සහජයෙන්මය. නිදහස්ව නිවහල්ව ගොවිතැන සිය ජීවන වෘත්තිය කරගත් දිමියගොඩැල්ලේ මුදියන්සේ කවියා 1994. 10. 29 වෙනි දින අභාවප්‍රාප්ත විය.

## ඉරණමයි – දයිවයයි.

| | |
|---|---|
| "දෙවියකු අතින් ආවා" යන අරුත | පිට |
| දයිවය කියා බලයක් යම මිනිහෙ | කුට |
| ඇත්දැයි කියා ලක් කරමින් විමසූ | විට |
| බැලුවිට ඒක බොරුවක් බව හැඟුණි ! | මට |
| පාවෙන අහසෙ ගහලොවකට - තරුව | කට |
| මිනිහා වෙනස් කළ හැකිදැයි සැකකි | මට |
| දද දන මූලාකොට විපතට හෙළනු | වට |
| ඇත ඉරණමක බැඳ මිනිහා සියලු | විට |
| සිතමින් සිතැඟි ලෙස කටයුතු | කිරිමට |
| නොහැකිය පරිගණකයට හා | රොබෝලට |
| මිනිහගෙ මැවුම ඒ ඒවට | කදීමට |
| දයිවය බලපවත්වන බව හැගේ | මට |

කුජ- බුද- ගුරු- සිකුරු- සඳ - තරුවලට යන
වාහන තිබේ අද මිනිහා නිපද වන
ගහ තරණය කරන විදු නැණ බලය ගෙන
මිනිහා හමුවෙ ඉරණම සුණු විසුණු විණ

ඉර හඳ වායු ගස් ගල් ගිණිදෙවි යන්ද
මිනිහා ආදි කල්පිත ඒවට වැන්ද
ඉරණම දයිවෙ ගැන සිතුවත් ලෙස අන්ද
එය අද ලොවට පිළිගන්නට පුලු වන්ද?

මිනිහට සහජයන් නිසගින් ලැබී ඇති
බලතල නුවණ දෙවියන් පර දවා යති
ඉරණම දයිවෙ ඒ නැණබල නසා ලති
සමහර අයට මෙය තව වැට හිලා නැති

ඉරණම සමහ දයිවය යයි කියන දෙක
මිනිහා පිරිහුමට ලන හේතුවකි එක
නැණබල චිත්ත ශක්තිය ඇති අයට සැක
නැත ඉරණමක් - දයිවය මහ විහිලු වක

ඉරණම දයිවෙ දෙක නිමවා සකස් කළේ
මිනිහා විසින්මය යොදවා මිනිස් බලේ
අව්වාරවත් ලෙස එයටම යටත් කලේ
එහෙයින් සැහැලනා ඔහු සතු උසස් මොලේ

මිනිහගෙ මිනිස් බල හමුවෙහි අයී මිත
ඉරණම දයිවෙ වැනසී පැර දීලා යත
කිසිවක් කිසිවෙකුට ඉන් සිදු වෙලා නැත
වෙන්නෙත් නැතැයි නැණසට පැහැ දිලා නැත

# සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ – 1.

කළු ගඟේ පහුරු වලින් භාණ්ඩ හුවමාරුව හා මගී ප්‍රවාහනය කෙරුණු යුගවලදී ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වූයේ ගංගාවමය. මේ ගංගාවේ විවිධ කටයුතු වලදී භාණ්ඩ අලෙවිය සිදුවිය.

දිනක් මෙසේ පහුරක ගිය කවියෙක් මුවගම තොටුපල ලඟ බත්කඩයක නැවතී සිට කියන ලද කවියක් මෙසේය.

වට පෙළ සඳිසි ගෙවුයන් පළතුරෙහි නිමා
පිට ගම සළෙළු දිය නාමින් හරිති ගිමා
සිට යන සළෙළුන්ට ගිමනක් නැත මෙමෙහ මා
තොටමුල බත් කඩේ බල මීතුරෙ මුවග මා

කලවානෙ පරගල වලව්වක නිළමේ කෙනෙකුගේ ප්‍රථම බිරිඳ හදිසියේම මිය ගියේය. ඇය සමග විවාහ වී සිටියදී ඔහුට රජයෙන් මුහන්දිරම් නිළයක් ද ලැබී තිබුණි. ධනයෙන් ද පොහොසත් විය. එසේම ඇයගෙන් දරුවන් හතර දෙනෙක් ද නිළමේට ලැබුණි.

ප්‍රථම බිරිඳගේ අභාවයෙන් පසු නිළමේ දෙවන බිරියකද ගෙනා වේය. ඇයගෙන්ද නිළමේට දරුවන් සතර දෙනෙකු ලැබුණු නමුදු පවුලෙ අඩ දබර අසමගිකම් පැන නැගුණි. මුහන්දිරම් පදවියද නැතිවිය. ධනයද භානිවිය., මේ සිද්ධිය දත් පුරාණ කවියෙක් එය කවියට නැගුවේ මෙසේය.

ජේම ගුණැති පරගල මුල් වලව්ව ට
නාම ගරු මුදලි නම පත්වී සතු ට
සැම සත පතල මැතිගේ අගය ගරු කොට
නාමය මිස නොමැත. සම්පත පතිණි යට

උතුම් මැතිතුමා පසු මැණිකෙට බය ව
දෙතුන් දිහා නොකායති ගෙදරින් පිට ව
සතුන් සොයනවා කොට බැන වැද ලසො ව
නිතින් දෙදෙන දබරින් කල යවන බව

දන රට තොටෙ සැමතැන මෙය සැලව සිට
මොන කරුමේද නොදැනෙයි කිව් කතා වට
පණ යනවා නොපෙණෙයි පූරුවෙ පවට
වෙන අහනුන් නොගනිල්ලා දෙවනු වට

පළමුවන් බැඳුනු ලිය වැර දුනොත් හෙම
දෙවනු නන් තිබෙද්දී පණ ලියෙක් හෙම
බැඳ ගැනුන් පැතු අයෙකුට වෙති මෙ හෙම
අපායෙට් නගින ගින්නට වැඩි තරම

වයස සම නොවේති පසු බඳනා අයට
දවස දෙවේලේ දඹරින් පසුව සිට
දිවස පෙනෙන ඉසි මතයන් බලා සිට
වෙහෙස නොවිඳ දහමය බලනු මුල් කොට

ඉල්ලති පළමු පවුලේ දරු දායා ද
මුල්වෙති දෙවනු පවුලද කියති මෙලෙස ද
සොල්පද මම කරපු යුතුකම මදිවා ද
එල්ලෙමි බොවුවෙ වැලලෙමි උඹ නිසා අද

මාගේ දරුවන්ට නුදුනොත් දායා ද
රගේ දූනෙයි මගෙ වගකී දෙවනු ල ද
අගේ දූනෙයි මම නම මැරුණාම අ ද
ඇගේ අත් හපාගෙන කියති මේ ලෙ ද

මුහන්දිරම් නිළමෙට දන් තේරිච් චී
වටින් පිටින් එන මිතුරන් හට නිච් චී
බැණුන් රවුන් මම ළඳගෙ දූක බය වෙච් චී
සමන් සුරිඳු නෑ තුවද කිරි අප්පොච් චී

බය කියා උතුම් නිළමේට මෙලෙසට ම
ලිය කියා බණින කළ සිහිනැති නිය ම
ලය කියා ගන්ට බැරි මගෙ උණුවී ම
කිය කියා යදිති නිළමෙ වැටී බී ම

ගිහිගෙට නම් පළමු ලද පළ නුදුන් පිට
තපසට නම් යාම යුතුකම නිසා මට
ලට පට නම් වේය ගිහිගෙයි උන් අයට
සැබෑවට මම මෙපද කෙරුවෙමි දූක ඇසට

අනේ මිතුරු තරුණනි ලොව දූනගල් ලා
ගුණේ ඇති ලියෝ සෙව්මද වේ දුබ ලා
සෙනෝ සිතින් උන්නත් හිමියන් මර ලා
විනෝ සෑම අයට දුක්දෙති දූනගල් ලා

පළමු පවුල ඇරුණත් මැරුණත් මිතු ර
දෙවනු පවුල් නොබඳිල්ලා තිර සාර
වෙන මෙඅවුල නොදූනෙයි කරුමේ සාර
දූක මේ අවුල කෙරුවෙමි මෙම පද සාර

කිසියම් —කවියෙක් විසින් රචනා කරණලද ඒකායන මාර්ගය දක්වෙන පුරාණ කවි මෙසේය.

වෙහෙසව සසර ඇවිදින දන නිම නැතුව
මෙහි අවහොතින් හරිමග දූනගෙන යුතුව
පහසුව පිණිස තනවන ලද කවි යුතුව
මනුලොව මඩම මෙබලව නැණසින් යුතුව

අතර මග තිබෙන මඩුවට ගොඩ නැඟුණු
අතර ඉද්දිපිට තුන් පාරක් තිබෙණු
අතර මංවේය ඉන් දෙකකින් නොයණු
අමර පුර යන්ට හරිමග තෝර ගණු

සරම්ක් සොරකම් කිරිම ගැන නිළමේ කෙනෙක් කියන ලද වස් කවියක්.

වෙලේ පැලඋඩ තිබුණ ඇඳිවත ගත් සොරා මේ දෙවී යනේ
කෙලේ කාටත් අසල් වැසි නින්දවමයි අනෙ අව ගුණේ
මැලේ ඇවිලුණු ලෙසට හොරුගේ ඇඟේ ගිනිවැල් වෙළ මිනේ
බලේ පෙන්වනු සමන් සුරිඳුනි සොරා සැනෙකින් නස මිනේ

තවත් අවස්ථාවකදී බල්ලෙකුට කියන ලද විස් කවියක් මෙසේය.

බුල් කියා බල්ලෙක් ඉද කෙසර යුර
ගාල් කිරි හරක් අල්ලා කයි නිතර
ඊල් වෙන බළල් පැටවුන් කයි නොහැර
වෙල් සුමන සුරිඳුනි ඌට දෙනු මර

විහිළුවට ලියා ඇති බලි කවි.

හැට පිරිච්ච වඳුරෙකු වෙඩි තියාලා
මිට කැඩිච්ච කොට කැත්තෙන් කපාලා
කට කැඩිච්ච අප්පල්ලක උයාලා
දෙස් පලයන් බලියට ආ වඩාලා

කන්දේ රිලව්ගෙ ඉඟි බිඟි කෙරූ මට
නින්දේ වපුරව් එක බිජු පැ ලට
සංගේ නැති මුගෙ බලි කවි කී මට
. . . . . . වස්දෙස් පලයන් බලි යට

පුරාණ කිවි වරයෙක් බෝපත් ඇල්ල සම්බන්ධයෙන් කරණ ලද පද්‍ය පන්තියක්.

එල්ල කරම මට පවසන කවිපද සැම වියතුනි ඉවසනු ලොල් ලා
අල්ල මැදට රේඛාව වැටුණු ලෙස පරුවත බිඳුනා ඇත දුල් ලා
මැල්ල නොවී ජල ගෝසා කරමින් පරුවත පල්ලට එක එල් ලා
ඇල්ල උතුම් පරසිඳු බෝපත් පිටි ඇල්ල බලනු මිතුරනි දුල් ලා

පොළොව පිහිටිද පටන් තිබෙන වග කාටත් වැටහෙයි දනගල් ලා
මෙලොව තිබෙන මේ පිහිටිලි අතරින් බලන්ට ඇල්මකි සිරිදුල් ලා
එලව ගොසින් ලොව ඉංග්‍රිසි මහතුන් බලන්ඩ එන වග දනගල් ලා
සැළව තිබෙන මේ පරසිදු ජල කඳ බලන් මෙබෝපත් පිටි ඇල් ලා

රටින් රටට පාරවටු වෙලා දුන් කවුරුත් බැලුමට එනවා ලූ
කටින් කටට ආරංචි වෙලා ගොස් ඇල්ල බලන්නට එනවා ලූ
පිටින් ඇවිත් සෙන් නෑදෑ මිතුරන් එකතුව බත් බැඳගෙන යා ලූ
උතුම් ප්‍රසිද්ධ ඇල්ලෙන් නැඟු ජලකඳ දුටුවන් සිත කුල්මත් වේ ලූ

බිඳුනේ ගල එක රියනේ දියරැළ වැටුණේ බිඳ දෙරණත දු ල්ලා
මුදුනේ තිබූ අත වදිනේ දෙව්වෙත හරිනේ චාමර කොඩි අ ල්ලා
මුදුනේ පරුවත වැදුණේ රැලවැද නිතිසේ ගෝසාවකි ලො ල්ලා
හඬිනේ නද දෙන ලෙසිනේ බලසකි සොඳි සේ බෝපත්පිටි ඇ ල්ලා

තුවක්කුවට කී තේරවිලි කවියක්.

පවර මෙසිරිලක මවු නැති අහනෙක් ඉද්දර යහනේ සැතපෙන් නේ
ඉසේ කූරුලා කනේ හඳුන්ගා දබර අතක් වෙත බබලන් නේ
පිට පිට විලි ඇත ඊට වැඩුම් ඇත කාලා ඒ බඩ නොපිරෙන් නේ
වදන්ට මයි රිසි වැදුවොත් හඩ ඇත සබේ සියළු අය තෝරන් නේ

හඳට කියන ලද තේරවිලි කවියක්.

කනේ තෝඩු නැත ඉනේ පිළිත් නැත තනේ මදක්වත් නැත උන්නේ
අනේ මෙහෙම දුන් කොතැනක බැලුවත් ඒ රුව නැත වෙන ගෑහැණුන්නේ
සෙනේ සිතින් හිමියා හැර බසකට කවදවත් නැත සිත උන්නේ
දනිද සකිමේ ලිය කවුරුද මට පුළුවන්නම් තෝරා දෙන් නේ

එක්නැළිගොඩ මැතිඳුන්ට එගම කවියෙක් කියූ කවියක්.

ඉර බාරයි ඉරපිට යන ගිරවුන් ට
හඳ බාරයි සඳපිට යන සාවුන් ට
මල බාරයි මලපිට යන බඹරුන් ට
අප බාරයි එක්නැළිගොඩ මැතිඳුන් ට

ශ්‍රී පාදස්ථානයේ නායක පදවිය ලබා ගන්නා බලාපොරොත්තුවෙන් සබරගමුවට පැමිණි බැදිගම රතනපාල නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් මාරපන ශ්‍රී නාගරාම-විහාරස්ථානයේදී විහිළුවකට කියන ලද කවියක් මෙසේය.

සිතට නදා වන පිරියෙන් වෙන් කර පී
කයට වදා දෙන කඳු මන් වල හැර පී
නිවට ඇදා වන කුළු සෙනසුන ලැග පී
අපට මෙද සෙනසුරු දෙවියා කෙළ පී

මෙය අසා උන් උන් වහන්සේගේ හිතවත් ස්වාමීන් වහන්සේ නමක් විසින් මේ කවිය කියන ලදී.

වෙනිසුරු පෙලිය බටකොළ දීගමේන් වරෙ ක
මෙහෙසුරු තැලිය තද දුක් දී බර වසෙ ක
මුනිසුරු වෙලිය දුක් රැහැණින් සිය වසෙ ක
සෙනසුරු කෙළිය කාටත් එලෙසැ යි සල ක

මේ අවස්ථාවේදී තම ප්‍රියම්භිකා වත්ගෙපා වෙන් වීමේ වියොගයෙන් පෙළෙමින් සිටි තවත් කවියෙක් කියා ඇති කවියක් මෙසේය.

වෙනිසුරු ටික කලයි බට කොළ දී පෙළි යේ
මෙහෙසුරු බර වසයි තද දුක්දී තැලි යේ
මුනිසුරු සයවසයි දුක් රැහැණින් වෙලි යේ
සෙනසුරු මට තමයි හරි කෙළියම කෙළි යේ

කර්තෘ සඳහන් කිරීමට නොදත් එහෙත් රසවත් කවියක් මෙසේය.

සසර සරණ සතට නියම මහලු වයස පැමිණි කලට ගතද
ඇකිල වතද මැළව සෙලවෙන් දතා
එවර දෙඇස නොපෙනෙ දෙකන බිහිරි ගතිය සමග දෙතොල
සැලුම යුතුව කටිනි හඬද ලො ලො ගායතා
අදර ගුණැති හිතැති මිතුරු ඤාති සැවොම ඉවත බලති
පනසෙ විසුව පෙමැති කතද නුරුස්සා යතා
මෙවර වහම මහලු දෙගුරු ජාත පුතුද අපිය කරති බලව
විඳින දුකෙක මහත ඒ ජරා සතා

එක් දිනක් කිසියම් විහාරස්ථානයක අලුයම මිදුල අමදමින් සිටි පොඩි හාමුදුරුවන් වහන්සේ නමක් මිදුල අමදමින් සිටින ගමන්ම මේ කවිය කියා ඇත.

සූරිය සුනෙර වට දෙවරක් ගියා දෝ
කාරිය පදින රත ඇන ඉගිලුනා දෝ
වීරිය කරන පණිදූට අසුවුනා දෝ
සූරිය උද වන්නට කිම පමා දෝ

මේ අසාසිටි සංඝාවාසයේ උන් ස්වාමීන් වහන්සේ නමක් ඊට පිළිතුරු වශයෙන් මේ කවිය කියා ඇත.

සූරිය සුනෙර වට දෙවරක් ගියෙත් නැත
කාරිය පදින රත ඇන ඉගිලුනෙත් නැත
වීරිය කරණ පණිදූට අසු උනෙත් නැත
සූරිය උද වන්නට තව පැයක් නැත

රත්නපුර හිඳුරන්ගල ප්‍රදේශයේ සිටි කවි කීමට දක්ෂ එහෙත් වෙදකම ජීවන වෘත්තිය කරගත් වෙදරාල කෙනෙක් කියන ලද කවි කීපයක් මෙසේය.

තරන් බලා අරගති වී මල්ල නෙ කා
ඉතින් කදිර දෙවි නඩු බැලුවොත් යෙහෙ කා
බලත් තෙද පතිණි ගිරි කුරුම්බර ය කා
උරන් ලේ කුරිරු තෙද මහ සොහොන් ය කා

දූරිය සමන් රණ මයුරා පිට වැඩ ලා
ඇරිය සැරෙන් දෙතනේ ගල සිදුරු ක ලා
කාරිය නොදන දුන්නෙන් ගති වී මල් ලා
සූරිය දෙවි බලෙන් පලයන් මුල මැකි ලා

අත්දරා ආයුධ අරගත් කඳ කුම රූ
යුත් තෙද අසුර යුදයෙන් ජයගෙන ඉසු රූ
පත්කර වී මල්ල අරගනිය නොවී ස රූ
සත්තක ලෙසින් ඇර කදිරා පුර ඉසු රූ

# සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ - 2.

සබරගමු ප්‍රදේශයේ විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ වරින් වර ප්‍රකාශ වෙන ලදුව කට පාඩමින් පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආ පද්‍ය නිර්මාණ රාශියක් ඇත. ඇත්ත වශයෙන්ම මෙවා ලියන හෝ කියන ලද්දේ කවරෙක්ද යන්න නිගමනය අපහසුය. කෙසේ වුවද සබරගමුවද සම්බන්ධව ඇති රචනා හෙයින් කොයි කාලයක හෝ මේ පෙදෙස් වල වූවෝ ඒවා ලියන්නට කියන්නට ඇතැයි සිතිය හැකිය.

ක්‍රි. ව. 1798 දී මහනුවර රජ බවට පත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පසුව දරුණු පාලකයෙක් ලෙසට කටයුතු කළද ඔහු රජ පැමිණි මුල් කාලයේ එබඳු තත්වයක කෙනෙක් නොවූ බවත්, හොඳ ගතිගුණ ඇත්තෙකු බවත් සඳහන් වෙයි.

සබරගමුවේ කවියෙකු මෙ රජුගේ උදර ගතිගුණ ගැන සඳහන් කොට ලියන ලද කවි දෙකක් මෙසේය.

අරණා ලෙව් දන මන සිරි කිර ණා
කිරණා අමයුරු විකුමැති නර ණා
නරණා ලිය සැදි හිමි පද සර ණා
සරණා නොමගත් කොද රුපු තර ණා

සත දුක් හැර මුකුලිත අර වින් දේ
දියතෙක් පිරි රුපු ගණදුරු බින් දේ
සිරි වික්‍රම රජ සිහ නර නිත් දේ
සිරිලක් තුබ තල නොවෙද දිනින් දේ

ඇහැළපොල නිළමෙ තුමා සබරගමු පාලනය කරණ අවස්ථාවේ දී මහනුවර මහ අදිකාරම් තුමා ඇහැළපොල නිළමේ හමු වීමට එන බව දන්වා එවා ඇත. එය දන්වා ඇත්තේ මෙසේය.

දුල්ලේ බල විකුම් ලක හිමියන් බසට
පල්ලේ ගම්පහේ අගමැති සඳ සතුට
ඇල්ලේ පොල මහ මුකවෙටි දෙවෙනි කොට
එල්ලේ වෙයි කියව දකිනට සඳු දිනට

ඊට පිළිතුරු වශයෙන් යවන ලද කවිය මෙසේය.

නිසියට පිල්ල තුළ සුවිපුල යුරු යහ තේ
වීසුමට මැල්ල නොව සිරි සරසවි දෙදෙ තේ
ලක හිමි ලොල්ල වඩවන එමැතිඳු සුගු තේ
කොතනට එල්ල වෙනවද යන වග නො දතේ

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා අල්ලාගත් ස්ථානය හා දිනය සිහිවීම පිණිස එකල විසූ කිවිදෙකු විසින් ප්‍රබන්ධ කරණ ලද කවියක් මෙසේය.

වසර කිතු එක්වා දහස් අටසියේ පසළොස් වැන්නෙ දී
පෙබරවාරි මස දහට වෙනි දින නමදගල නම් පියසෙ දී
පතර ලෙස සිරි විකුම් නරණිඳු අල්වගත් බව නොවහ දී
නතර නොව ගොස් බ්‍රවුන්රිග් රජ තුමා හට දන්වන ල දී

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇල්ලීමට සේනාව කොළඹින් පිටත්ව මහනුවරට ගමන් කළ ආකාරය සහ තෙල්දෙණියේදී රජ අසුකරගත් අන්දමත් සියැසින් දුටු කිවියෙකු විසින් ඒ පිළිබඳව ප්‍රබන්ධ කරණ ලද රසවත් කවි පන්තියක් කිරිඇල්ලේ එපිටවල සුදර්ශණ වලව්වෙ ඩබ්ලිව්. කේ. රණසිංහ බණ්ඩාර මහත්මා ගෙන් ලැබී මෙහි පහත දක්වනු ඇත.

තන් අවිගත් සෙනග නොයෙක් ගතාටමුණයෙන් පාර බලා
සෙත්කඩ ගල් පුරට ගොසින් නොදක එරජ සිතට මුලා
ඉන් පිටතට ගොසින් සැනක තෙල් දෙණියෙදී වට කරලා
පින් පව් දෙක අත් හිටවයි ගත්තු නිරිඳු වැඩම වලා

වෙහෙසව රජු සිව්මැලි ගත රාහුට පත් සඳ සේ
දහස වටින කණක බරණ නැති වුණි සිය දහ සේ
පහස විඳින අග මෙහෙසුන් කෙසරුට පත් ඇතු සේ
දහස විතර ඇත ඒ දුක් කියන්ට බැරි මෙලෙ සේ

චන්ඩ පාරු බාල ඇමති රැස්කර මත නන් ද
කන්ඩ දිදී ඇති කරමින් ඔවුන් තැනු සින් ද
වෙන්ඩ පිහිට කෙනෙක් කවුද අසුවුණි නර නින් ද
යන්ඩ හැරිය රටින් පිටත අවර දිනිඳු මෙන් ද

ඉල්ප ළිඳක් සිඳු පිට නැගි දිය බුබුලක් මෙන් ද
කල්ප - යකුත් පවතින සොඳ ගේක වියන් බන් ද
අල්ප කමක් නැතුව කිසිත් දෙන මුරු සිත මින් ද
සොල්ප දිනක්'ලක නරනිඳු කොළොම් පුරෙර් ඉන් ද

තැන් තැන්වල රහස් නුවර ඇඳලා සොඳ වන් ගු
වෙන් වෙන් කර රජ සම්පත් යස විලසට සැන් ගු
යන් තන් වත් නැතුව කිසිත් ගත්තු මෙකුරු මන් ගු
ඉන් පිට රට යන ලෙස රජු මුහුද නැවට නැන් ගු

රාම රාවණ යුද්ධය සිහිපත් කරවන සබරගමුවේ ඇති පැරණි කවි දෙකක් මෙසේය.

සාම සැරේ ගෙන සුරත දරා ගෙන රාවණ හට විද්ද
හුම සැරේ වෙද දෙරණ හිරා ගෙන් සෙන හඬ මෙන් සද්ද
රාම කිර්ති විදුලිය ගිනිගෙන සැර මෙරටට කැර කෙද්ද
කීම අසන් රාවණ දෙවි සමඟිව විෂ්ණු දෙවිඳු කල යුද්ද

රොසින් විෂ්ණු කිරි මුදට වැඩලා සිට අත දිගු කෙරුවා
එරන් දුන්න ජලයට සෙන හඩ මෙන් මතු වෙනවා
සැණෙන් දුන්න දිව සළුව වසා ගෙන පෙරහැර කර එනවා
තෙදින් එ රාවණ යුදයට පුල්වන් දෙවියෝ නික් මෙනවා

රත්නපුර සබරගමු මහ සමන් දේවාලයේ දිය කැපීමේ මංගල්‍යය සඳහා ගෙනයන දේව අහුල සම්බන්ධව පුරාණ කිවිවරයෙකු විසින් ප්‍රබන්ධ කරණ ලද කවියක් මෙසේය.

රුවන් කණක මුතු මැණික්ද බබළන පත්මරාග යන යසසිරි රැල්
මෙවන් පසිඳු කළු ගංගා ජලපිට මකර තොරණ සිංහාසන වල්
සවන් බිහිර කර පොකුරඹ ගෝසා යනෙන කැළඹි ගඟ ඉදිරිය රැල්
සමන් දෙවිඳු අඹ කෙලියට වැඩි තැන සැදුනි මෙවන් තිර දේව අහුල්

මීයන්ට කැපකළ පුහුල් ගෙඩිය.

එක් කලෙක පුහුල් ගෙඩියක් සොයා ගිය කෙනෙක් නිවසක් අසල පිටුපසින් යන විට එම ගෙය ඇතුළේ උඩහල්ලක පුහුල් ගෙඩියක් තිබෙනු දක්කේය. මෙයින් සතුටට පත් හෙතෙම එය දුටු බවක් නොඅඟවා ඉස්සරහ පැත්තෙන් ගෙට ගොඩවී මේ ගෙදර පුහුල් තිබේ දැයි ගෙහිමියාගෙන් ඇසුවේය. ගෙදර අය එක වරටම අනේ අපේ ගෙදර පුහුල් නැතැයි කියා ඇත. මේ ගැන නොසතුටුවූ පුද්ගලයා පහත දැක්වෙන වස්කවි දෙක කියවා ඇත.

කාරිය බොරු නොවෙයි මකියන වචන දුට
තේරිය තියෙන්නේ ඔය අන්ත දකුණ ට
බේරිය දර දෙළොසක් පුසුලේ වට ට
සූරිය පෑව්වා වැනි උඩ හල්ල පිට

තද රාවණ බිඳ ජයගත් විද එක ල
වැද හුණුවල් කන්ද පසුකර මැදි බුබු ල
තෙද ඇති සමන් දෙවියන් සිරිලක ලක ල
අද රෑ නිබඳ කාපන් මීයෝ පුහු ල

කිරිඇල්ල ප්‍රදේශයේ තරුණියක් ඒ ආසන්න ගෙදරකට දීග ගොස් කරදරකාරි ජීවිතයක් ගත කළාය. ඒ අවස්ථාවේ ඇය විසින් කියන ලද කවියක් මෙසේය.

කිරි ඇලි ගමේ සොඳ සෙල්ලමින පසු වෙලා
කිරි ඇලි ගඟේ දිය නාලා සිසිල් වෙලා
මද්ද ගෙදර යම කරු වෙකුට අසු වෙලා
ඉබේ පන යාය කරදරය වැඩි වෙලා

රත්නපුර කුකුළු කෝරළේ කාන්තාවක් තම දරුවා ගඟේ වැටී මළ සොවෙන් කියන ලද කවියක් මෙසේය.

කුකුළු කලවාන හපුගොඩ ඔතන ගඟේ
ගලා ගෙන වතුර එනවා කුකුළු ගඟේ
අඩා වැලපෙන්ට ළමයෙක් හෙදර මගේ
ගසා යන්ට කිම උපදෙස් කුකුළු ගඟේ

මීන්නාන ප්‍රදේශයේ බණ්ඩාර කෙනෙකු ප්‍රදේශයේ කලකට ඉහත වාසය කළ විරූපී පුද්ගලයෙකු ගැන ලියා ඇති කවියක් මෙසේය.

ලෙනවන් වපර දෙඇසා දක්මට කුරිරූ
මිටිවන් ඇඟට කුදුවන් කොඳු ඇටය දුරූ
උල්වන් නිකට රැවුලෙන් ගැවසී රූදුරූ
නිරයෙන් නර ලොවට මූ එව්වේ කව්රූ

පුරාණ කාලයක සිය බිරිඳට ආලයෙන් ගෙදර දෙරේ මෙහෙවර කරණ පුරුෂයෙකු දක එක් අයෙක් විහිළු කර ඇත. ගෙහිමියාද ඊට නොකිපී මිත්‍රයාට ද සරදම් වශයෙන් පහත සඳහන් කවිය කියා ඇත.

නැද්ද පොරණ දහමේ වග අසා හෙ ම
සිද්ද කර ගන්ට කම් සැපත ලොබ ව ම
ලද්ද පබාවති තම ගන නිසා පෙ ම
ඇද්ද වසුන් කත් කුස රජ වී බොහො ම

සබරගමුවේ පැරණි කවියෙක් කැරලා ගැන කියන ලද කවි දෙකක් මෙසේය.

යකා තමයි ගස් උඩ දඹු කැපීම ට
රවා බලයි ඌ ඉඳගෙන කොරෝ දෙ ට
නොකා නොබී බැරි මේ වැඩ කරන්න ට
නිකා ඉන්ඩ බැරුවද කැරලෝ ත ට

පළුව වඩන් රැලි අල්ලපු රතු සැට ට
බෝපත් ලාපු සුදු කවනිය බඩ දිග ට
රත්තරනෙන් තැනුවා වැනි හොට අග ට
මෙවැනි රුවක් කොයින්ද කැරලෝ ත ට

අටකලන් කෝරළේ ගම්මානයක් සම්බන්ධව කියන ලද පැරණි කවියක් මෙසේය.

කුට්ටාපිටිය දෙනවක පැල් මඩුල් ලා
හුණුවල ඕපනාකේ උඩපුස් වැල් ලා
දෙරවල බුලත්ගම සහ පඹදෙනි මුල් ලා
සකිසඳ ඉඹුල්පේ දෙනගමු පීල් ලා

දිනක් මේ පෙදෙස්හි ගොවියන් කීප දෙනෙක් නක්ෂත්‍ර යෝගයකට අනුව මෙන්නක ඇල් වී වපුරන්ට ගොස් ඇත. ඔවුහු නැකැත් වේලාව එනතුරු ගලක් උඩට වී ගිනි මොලවා ගෙන කවි කියමින් විනෝදයෙන් සිටියෝය. එහිදී ඉන් එක් ගොවියෙක් කී කවියක් මෙසේය.

වල් පීරා ගෙන ඇවිදින් මෙහි මිතුර
ගල් පායා ගිනි මොලවා ඉඳ වැතිර
ඇල් බිජු වඩා ලා අප යන්නට ගෙදර
කල් නොයවා තරිඳු පායයි බල මෙවර

එම ගොවියාම අමු හේනක පැලකදී වල් ඌරෙකුට කියන ලද වස් කවියක් මෙසේය.

කේසර සිංහයෙකු වැනි මේ හොට බරියා
නාඹර අමු හේන රැකිලා රැම ගියා
වීරිය අපේ සැම නිෂ්පල වීම ගියා
සූරිය දෙවියනේ අද කාපන් කොවියා

කිරිඇල්ල විසූ කවියෙක් හේනක් ගැන කියන ලද කවියක්.

අඳුරු වෙලා කිරිඇල්ලට වහින් නා
පඳුරු වෙලා හේනේ වල් වැවෙන් නා
අක්ක නංගෝ නැති අරුමේ දුනෙන් නා
මෙද ඇල්හේන නෙළුමෙන් ඇරෙන් නා

අතීතයේදී පිරිමි අය කොණ්ඩය බැඳීම සිරිතක් විය. එකල තරුණ මනාලයෙක් හවරියක් ලා කොණ්ඩය බැඳීම ගැන කෙනෙක් කියා ඇති කවියක් මෙසේය.

ඇන්ද පට සරොන් මනමාලය වෙන් ඩ
බැන්ද හවරි ලා කොණ්ඩේ ලොකු වෙන් ඩ
කැන්ද ගෙන එන්ඩ යන මගුලේ උන් ඩ
නින්ද මෙහෙම නොකරන් වෙන පිරිමින් ඩ

අතීතයේදී තරාදිය ගැන කෙනෙක් ලියා ඇති තේරවිලි කවියක් මෙසේය.

නයිදේ කෙනෙකුගෙ වෙතේ හුහක් කල් පමා වෙලයි රාලට දෙන්නේ
කොයිදේ දුන්නත් දෙන්න බෙදගෙන එකෙකුගෙ අත බැම්මේ ඉන්නේ
ඇයි දෙයියනි නෙත් අටක් තියනකොට එක නෙතකටවත් නොපෙනෙන්නේ
දයි දයි උන් උපදින වේලාවට වෙරි නැති වතුරට නම වැටුනේ

ඒ කාලයේම ලියන ලද තවත් ජන කවියක් මෙසේය.

ගහෙන් වැටීලා හතරට කැඩීලා ඉන් එක මිනිහෙක් ගෙයි ඉන් නේ
කන්නට තරහෙන් බොටුව කඩාගෙන තව එක මිනිහෙක් ගෙයි ඉන්නේ
හෙමින් හෙමින් ඔහු ලිපේ වැටීලා මහර දලක් දලයි ඉන්නේ
මෙවැනි මෙතුන් දෙන සමගි කරන්නට මැරිච්ච මිනිහෙක් මට දෙන්නේ

මෙය මෙම කවියා ලියා ඇත්තේ බුලත් විට සම්බන්ධයෙනි.

අල්ලේ තබා පිහියකින් පුවක් ලියන විට කිතුල්පෙ නිළමෙගෙ අල්ල කැපී තුවාල විය,. ඒ නිසා ගිරයක් තනා එවනමෙන් මිල්ලවිටියේ ලොකු ආචාරිනයිදේට පහත සඳහන් කවිය ලියා යැව්වේලු.

මිල්ල විටියෙ ලොකු ආචාරී නයිදෙ ට
එල්ල කර කියමි මගෙ සිතු දයාව ට
අල්ල කැපිලා මට වුන මුලාව ට
බෙල්ල ඇදි ගිරා පැටවෙකු එවනු ම ට

ඒ අනුව ආචාරී නායිදේ ගිරයක් තනා පහත සඳහන් කවියත් සමඟ නිළමෙට යවාඇත.

දයාවෙන් නිළමෙ එව් හසුන දැක බලා
සොයා මත් බලන කළ ගිරවෙකු දකලා
පියාඹුත් නොහැකි මගෙ ගිරවා නොමලා
දයාවෙන් බාරගනු මම ඇත එවා ලා

පුරාණ කවියෙකුගේ තවත් තේරවිලි කවියක් මෙසේය.

කටෙ එකක්වත් දත් නැත උන්නේ ඉසවට දත් වාසය උන්නේ
පිටෙ එකෙක් ඉඳ කිරි ආහර දෙයි ඔළුව වනා ඉඳ නැල වෙන්නේ
රටෙ ගෙනිච්චත් ගොදුරට ගන්නේ කිරි ආහරමයි දැන ගන්නේ
වැටෙද මේ පද කීවා සකියනි පුළුවන්නම් තෝරා දෙන්නේ

# සාගර පලන්සූරිය මහතා.
## (කලල්ඇල්ලේ ආනන්ද සාගර හෙවත් කේයස්)

කලල්ඇල්ලේ ආනන්ද සාගර යන වචන තුනෙහි මුල් අකුරු ගෙන (ඉංග්‍රීසියෙන්) කේ - ඒ - එස් යන කෙටි නාමයෙන් ''කේයස්'' ලෙස හඳුන්වන මෙම කවියා සබරගමුව ඒකාලෝක කළ මිණි පහනක් බඳුවිය. අටකලන් කෝරළේ කලල්ඇල්ලේ උපත ලැබූ මොහුගේ ළමා කාලය අනෙක් බොහෝ වියතුන්ගේසේම සෞභාග්‍යමත් එකක් නොවීය. නොයෙකුත් දුක් ගැහැට මැද හැදුන වැඩුණ ඔහුගේ දියුණුවට අත්තිවාරම වැටුනේ විහාරස්ථානයෙන් ලැබුණ පිටුවහල නිසා බව දැනගන්නට ඇත.

කලල්ඇල්ලේ ආනන්ද සාගර යනුවෙන් පැවිදි වී සිටි ඔහු ඉන්පසු උපැවිදිව සාමාන්‍ය පාසල් කිපයක මෙන්ම දිවයිනේ නමගිය පාසල් කීපයක ද ගුරු භවතෙකු ලෙසින්ද සේවය කළේය. ජිවිතයේ අවසාන කාලයේ දේශපාලන ක්ෂේත්‍රයට පිවිසි කේයස් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ලෙසද කටයුතු කෙළේය.

කොළඹ යුගයේ මධ්‍යතන යුගයේ සිටි ඉහළ පෙලේ කවියන් අතර වඩාත් කැපී පෙනුණ කේයස් ලියූ කවි දහස් ගණනක් ඇත. තමාගේ කෘතිවලට අමතරව පද්‍යාවලි නමැති පොත් කීපයක් සංස්කරණය කළ අතර එම පොත් උසස් විභාග වලට නියමිත පොතක් වශයෙන්ද භාවිතයට ගැනුනේය.

කේයස්ගේ කෘති අතර වඩාත් ජනප්‍රිය කෘතිය වූයේ ''සුදෝ සුදූ'' ය. එතෙක් සිංහල පද්‍ය සාහිත්‍යයේ පැවත ආ ආවේණික සම්ප්‍රදායෙන් බැහැරව ස්වභාවෝක්තිය පද්‍ය කරණයට යොදගත් ඔහු රසවත් රචනාවක් කර ඇත.

එදිනෙද කතා ව්‍යවහාරයට ළංවූ බසක් පද්‍ය කරණයට යොදගත් කවියන් අතර කේයස් වඩාත් ජනප්‍රිය විය. සුදෝසුදූ කාව්‍ය සංග්‍රහයේ මෙබඳු සකස්කර ගත් බසක් දක්නට ලැබුණේය. සුදෝසුදූ ග්‍රන්ථය ආරම්භයේ කටුරොද ගම්මානය ගැන ඔහු කියන්නේ මෙසේය.

ගොඩ මඩ දෙකම සරුසාරය පල බර ය
කටු රොද ගම්මානෙ තරමක පිටි සර ය
ඒ ගම මැදින් ගලනා ගහ මන හර ය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙළ වර ය

කතා කරණ බස කාව්‍ය කරණයට යොදගෙන ඇත්තේ මෙසේය.

ගබින් රාළගේ අර තක්කඩි කොලුවා
අපේ එළ දෙනට පොල්පිත්තෙන් තැලුවා

ව්‍යංගාර්ථය කවියට යොදා ගෙන ඇත්තේ මෙසේය.

කටුරොද මඩ වගුරු වල මානෙල් ඕලු
මැණිකෙගෙ මුහුණ දකුම්ට පොරකන වාලු
පැල්පත තුළ තනිව වෙසෙනා ඇගෙ පාලු
කැපුමට සුළඟ රස ගී පවසන වාලු

කවියෙන් දෙන අදහස වඩාත් උද්දීපනය වීමට කදිම වචන මාලාවක් යොදා-ගැනීමටද කේයස් සමත්ව ඇත.

නියරෙන් ලියද්දට බැස මග හැර අදිරි
සුන්දර මුහුණ බැලුවා උතුරණ මිහිරි
කලකින් මුණ ගැසුන අර ඉස්සර මිතුරි
දූන් හරි ලස්සණයි මල් ඉතිරෙණ කුමරි

සුදෝසුදු කවි කතාවේ එන ප්‍රධාන චරිත තුනකි. අදිරි කාලයකට පසුව දුටු හීන්මැණිකේගේ දුටු අපූර්ව සුන්දරතාවය පළකිරීමට යොදා ගෙන ඇත්තේ " උතුරණ මිහිරි " " මල් ඉතිරෙණ කුමරි " යන වදන්ය.

හරි කලකින් නොව මේ ළමයා දූක්කේ
මොකද ළමයො අද මේ රෑ අරුමැක්කේ
ඉඳගන්නකො පුටුව කබලක් වට මක්කේ
සැපසේ තේද අපෙ වයසක ගම ලොක්කේ

හැමදමත් තියා ගන්නට හොරෙන් බර
පුළුවනි ළමයො ඒකී වස උපන් මෙහෙර

මෙ චරිත නිරූපනයට සංවාද උපයෝගී කරගත් ආකාරයයි. කේයස් වරින්වර ලියා පළ කරවන ලද පද්‍යපන්ති එකතු කර " විසිවුණ තරු " නමින් පද්‍ය සංග්‍රහයක් කළේය. එහි එන රසවත් පද්‍ය පන්තියකි " කණ උන්දෑ " පද්‍ය පන්තිය.

මා දිනු ගමෙ පොඩිකාලේ වෙසෙන කල
මතකයි හොඳට නා ගහමුල තිබුණ පැල
කව්රුත් දන්න හඳුනන යක් ගැහැලෙ පොල
කණ උන්දෑයි විසුවේ මෙම කුටිය තුළ

මෙ එම පද්‍ය පංතියේ එන කවියකි.

# සබරගමුවේ කවියෝ කියන ලද තලමලේ කවි.

සංසරත්න ඇති සභවර දෙනමක් තලමල පිපුණා දක නෙති නේ
ධර්ම රත්න යෙප් දහම් දෙසන විට පියුම් පිපෙයි ඒ මල මුදු නේ
නිල්වන් තලමල රන්වන් සුළඟට කිඳුරු නදක් සේ නද දෙන් නේ
අදිකාරිමය ගම විහාරෙ දොරකඩ රන් කොත සේ තලමල පිපු නේ

සතර කොනට අතු බෙදී ගෙනා රන් දිරුම මෙනා අසබොඩ වැටු ණා
නිතර නුරා අහනෝ යනෙනා විට මුකුළු සිනා කරමින් බල නා
ඉයුරු ගෙනා මල්දම් එදිනා රන් පටක මෙනා ඇතට දිලෙ නා
පැතිර ගෙනා කිරි ඇලී ගමිනා තලමල පිපුණා දෙව්පුර වටී නා

බුදුන් වඩින්නට යනෙනා සලෙළුන් කියති සින්දු කව්පද බැඳ ලා
යොදුන් ගණන් සිට බඹරිඳු ඇද්දින් ගුවනේ මිතුපිව නද දී ලා
පිපුනෙ නැතිව මල ඉසිරුණ අන්දම සුළඟට නෙය්යාඩන් කර ලා
නැදුන් විහාරේ ළඟ පිපි තලමල ඇතට රන්කොත වැනි දිලි ලා

ජේම සිතින් දර්මෙ අදහාගෙන බුදුන් වඩින්නට යමුව අනේ
සැම නෙතින් වට බලාපු බැල්මට පෙනේය රන්කොත් දෙක ලෙසි නේ
රාම සැරෙන් කෙළ ගෙන එන මැසි කඳ රොන් ගනියති මල් ඉති ගානේ
නාම පසිඳු කිරි ඇල්ලෙ විහාරේ එකතැන තලමල් දෙක පිපු නේ

පෙල පොරනේ අපි කරපු පිනේ මහිමෙන් ලැබුනේ මේ මල් වරු නේ
පුදමු අනේ මුනිඳුට ගොසිනේ බුදු මහුලකිනේ අපි සන් තොසි නේ
සුර රජුනේ නුඹෙ නඳුනුයනේ මිස නැත කොතනේ මේ මල් වරු නේ
සකි සඳිනේ අපි ගිය ගමනේ කැළණියෙ පිපුණේ මේ මල් වරු නේ

සැරයන ජලපිට හන්ස පයෝදර සැරයෙනී දෙපසේ චාමර ලා
පෙර දින නළ ගිරි හස්ති රාජයා පැරදුනෙ මුණිඳුට යුද කර ලා
යවගිය මුණිඳුට දහම් දෙසීමට ලියවති නිසි පොත් යොමු කර ලා
දූරණියගල තල මලක් උදරම් බල මිතුරේ මාවතට වෙලා

ගොසින් බැසපු තැන දූරණියගල ගම එකතැන තල් ගස් දෙක මැවු නේ
වියන් බැඳපු දෙවියන් සැසනයේ වඩින්ඩ සැමදෙන එකතු උ නේ
බලන්ට විස්තර බෝවිය ලක්ෂණ යන එන සලෙළුන් එගොඩ උ නේ
රන්ගේ වත්තේ පිපි ඒ තලමල මැණික් තොරණ වන් ලෙස දිළි නේ

සොබමන් තල ගස වැඩෙමින් දිගු අතු පතරින් දසඅත පැතිර තො සේ
දවසින් දවසට වැඩෙමින් ඒ ගස මුදුනෙන් රන් කරඩුවකි ය සේ
බඹරුන් නද දී එති යති ගුවනේ සළෙළුන් සිත් පොළඹයි එක සේ
හිඳුරන්ගල පිපි මනරම තලමල ජයරන් කොත විලසින් දිලි සේ

බෝධිමළුව සහ තලාවිටිය සොඳ එල්ලාවල ගම පාරට වූ
වියල ගොඩද නාකන්දල සමගිව කැන්දන් ගමුවට සොඳ කිට වූ
අස්ගහුලද මා හර ඇහැළියගොඩ උතුම් කරමු කිවයි රට වූ
මෙගම් නවය මැද පිපුණා තලමල මාහින්ගොඩ පාරට කිට වූ

පෙරහැර එනවා නැටුම් නටනවා ඇතුන් ගෙනෙනවා සිත   ලොල්ලේ
බුදුන් වඩිනවා පැතුන් පතනවා එමල බලනවා සිත   ලොල්ලේ
බඹරිඳු එනවා නාද කරනවා රොං ගෙනියනවා සිත   විකලේ
මෙමල වඩනවා ප්‍රීති වඩනවා සිත් පැහැඳෙනවා සිත්   ලොල්ලේ

සීතා කෝරළෙ ගඟබඩ පත්තුවෙ වැඩුනා හනගස උඩ ගුව   නේ
හනමල පිපුණා පූස්ම සුවඳ නැත අඩුවට හනමල දිලිසෙන්   නේ
වනන්තරේ සිට බඹරිඳු ඇවිදින් රොන් ගෙනියන්නට විමසන්   නේ
එක්ව සිටින අභයනාත් කැමති නම් වස් ඇර සින්දුව කියම්   අනේ

ඇට වපුළල් ලොව පැලව ගියේ ගස උස වැඩුණේ උයනක්   ලෙසිනේ
උණ ගොපිළල් ඇතුවට සැදුනා දූක මෙම ලෙසිනේ තලමල ලකු   නේ
මල් කැකුලෙන් මල පුබුදු උනා දූක සිත ලොබිනේ මග බැස   යන්නේ
එගොස් හිලෙන් බැස උස් අරිනා ලෙස දෙවි සොදිනේ අප රැක   දෙන්නේ

දෙරණෙ නෙරළුපිට වැවුණෙ මෙතල ගස පෙනුනෙ දුරට තොසිනේ   ලෙසිනේ
දරුමෙ ලියන ගුරුවරුන් කමාවන් නොදනේ මෙමට වැරදුනිද   අනේ
ගුවනෙ නටන බඹරිඳුනෙ හඬන හඬ වැවුනෙ කණට පිණිබිඳු   ලෙසිනේ
දෙහිගම්පල් කෝරළේ ලෙවන් ගම දෙසිය දෙකක් තල මල් පිපු   නේ

වෙලට බැසේ බැලුවාම යසේ රයිගම් පියසේ තලමල් දිලි   සේ
පෙලට ගසේ මුතු ඇමුණූ ලෙසේ රන් කෙඳි විලසේ පාරට දිලි   සේ
රටව යසේ ආසිරි සැපදේ බො හො කල් යසසේ දෙවිරැක   දෙමිනේ
රුවට මෙසේ වෙන කොයි දේසේ අපි නොදුටු ලෙසේ තල මල්   වරුනේ

මූදුනේ බැඳි අත වඩිනේ දෙවි වෙත මෙහි ඇති වරදක් දුරලන්   නේ
හසිනේ හඬදෙන වරුණේ බලසකි පූජිත තලමල ගස මූදු   නේ
වරුණේ මම දූන් කියනා කවිපද පොරණ පිපුණ තලමල්   වරු ණේ
පිපුණේ කොතනද රයිගම කෝරළේ හොරණ ගමෙ බෙලි ගහ   උයනේ

මුල් පොළවෙ සිට ජල දකිනානෙක් මුල් ඇදලයි ගහ උස වැඩු   නේ
කල් මතු බුදුවෙන තිලෝක මුණිඳුට රන් කොඩියක්දෝ සෙවන   උනේ
ඉන්පුර පසළොස්වක සඳ විලසින් සඳ වැනි තලමල් පුබුදු   උනේ
මල්වතු හිරි පිටියේ මඩ පෝරුවෙ අතුකෝරළෙ මැතිඳුගෙ   උයනේ

නන් සොඳ යහලේ වලව්වේ වත්තේ ඉන් සොඳ තලගස් දෙක   වැවුණේ
පෙම් බැඳි ආලේ වඩවන ලීලේ කෙටල ගහක් සේ මල පිපු   නේ
රන් සොඳ මාලේ දිළිසෙන්නා සේ වටරැළි ඉසිරි මල පිපු   නේ
අපි යමු රාලේ බලන්ට තලමල් දිව්‍ය පුරේ රන්බවු උය   නේ

වට තුනලු සකි තිස් බඹලු උස ඊපිට ගුවනේ රන් කඳ   ලූ
අට කොනළු ගුවනේ තිබෙලු තව තිස් අටකුත් වටකර කැ කු   ලූ
සොඳ රුවලු ඉරු රැස් ලෙසලු දවසට තුන් පාටින් දිලිසේ   ලූ
සොඳ රුවලු පත්දන් වැටලු මල පුබුදු උනේ වැමෙන් පිට   ලූ

# සබරගමුවෙ අප්‍රකට කවි හා කවියෝ - 3.

ඈත කාලයේ මෙ ප්‍රදේශයේ සිඤ්ඤෝ නැමැති රාළහාමි කෙනෙක් වාසය කර ඇත. මොහුට කිසිවෙකු ලිපියක් රැගෙන ගියහොත් ඒ ලියුම දමා ගැසීම ඔහුගේ චරිතය. මෙ බව දත් එක්තරා කවියෙක් පහත දැක්වෙන පද්‍යය සිඤ්ඤෝ රාළහාමිට ලියා ඇර ඇත.

මාපියගම සිඤ්ඤෝ රාළහාමි ට  
දීපිය ලියවිනක් ගොස් උදයෙන්ම හෙ ට  
දපිය ඔහෙ කියා තරවටු කළොත් ත ට  
දීපිය වමේ අත දිගහැර කළමුල ට

දෙඩම්පෙ වලව්වෙ ජයසේකර මැතිණියට අභිනව වලව්වකට යන දිනයේ කිසියම් කෙනෙක් ලියා ඇති කවියක් මෙසේය.

පිනින් නුඹ ගොසින් අභිනව වලව් වට  
පාතින් තිබෙන අස්නක වාඩිවී සිට  
ඈතින් සිටම ජයසේකර මැතිණි යට  
දෝතින් මෙපත දීපන් හිස නමා සිට

අටකලන් කෝරළයේ රටේ මහත්මයාගේ බස්නායක නිළය සම්බන්ධයෙන් රචනා කරන ලද කවි කීපයක්.

සවසිරි පිරි නොමිනා සිරි ලක පෙරවිසු මන නර ණා  
දෙව් තෙද බල සුමනා බල දන පිදුවෙය නෙක ලෙසි නා  
සිව් දිග දන විසිනා පෙර සිට නොමහැර සිරිත මෙ නා  
සව් පුදකර දෙවනා මෙමැතිඳු දෙවිඳුන් රකිනු මැ නා

රුවන්පුරය කිරුළේ සබරගමු දිසාවටම බැබ ළේ  
සමන් සුරිඳු දෙවොලේ අනුහස ලෙසින් රත්න සුදි ළේ  
එවන් තැනය මෙකලේ ලැබගත් බස්නායක එති ලේ  
උතුන් මැතිඳු දෙවොලේ සිරින් සැරදේවා සියලු ක ලේ

සිරිසර කිවිසරදා උරමුව පැනසරයට ගති දා  
පෙමකර අටකරද කෝරළෙ මේ කරවන මැති දා  
ගුණතිර දැක පැහැද හෙළ නරනිඳු සහ ගරු සමු දා  
තුටකර පැවරූ මෙදා බස්නායක නිළයට මැති දා

# සබරගමු කවි.

වරින් වර සබරගමුවෙ විසූ අප්‍රකට කවියෝ බොහෝ වුවද ඔවුන්ගේ නිර්මාණ අසන්නට ලැබෙන්නේ ඔවුන්ගේ නම ගම ඇතුළුව නොවේ. එක් එක් අය මතකයෙන් ගෙනා එබඳු කවි දන්නා අය මේ ප්‍රදේශයේ බොහෝ සෙයින් ඇත. එබඳු රචනා කීපයක් මෙසේය.

ප්‍රදේශයේ එක් ස්ත්‍රියක් ස්වකීය ස්වාමි පුරුෂයා මළ පසු සොහොන් කොට ඊමතු පිට ගලක මේ කවිය එහි සටහන් කර ඇත.

ලද ලද තම සැප ත්
දීමෙන් සතන් සිත් ගත්
මහිමි හට පින් වත්
ලැබෙවා මතු නිවන් සම්පත්

පුරාණ තොවිල් කවියක්

පියම රතැඟිලි අත්දවා නෙක කරණ සර මෙත් දන් පියේ
මෙයට පොලු හඩ ගැසූ තරමට වැටි වැටි මස් බන්ඩි යේ
සියඹ එකතින් ප පා ඇවිදින් කකා සැවුලගෙ නන්ඩි යේ
වයඹ කොන බැස වරෙන් කෙළිපුද ගන්න වට්ටක් කන්ඩි යේ

පුරාණ කියමනක්

එක් එක් රියන් දෙරියන් තුන් හතර රියන්
පස් මත් රියන් සරියන් සඳහ සත් රියන්
අට නව රියන් දහ එකොළොස් දොළොස් රියන්
දහතුන් රියන් සිව් පදයක් කියා දියන්

තේරවිලි කවි දෙකක්

සීමා පහුරපිට සිව් පාවෙක් යාලූ
මස් දූටු කළ උගේ බඳ පිට මෝරා ලූ
මක් දූන්නත් අල්ලන්නට බැරි වේ ලූ
මෙතුන්පදේ තෝරාපන් උඹ යා ලූ

තේරුම:-

අටක් දූන් කලට ඉන් ඉරුවික් දේලූ
පසළොස දූන කලට මුල් මානෙල් දේලූ
මස්ස දූන් කලට ඇසවත් නොපෙ නේලූ
මෙතුන් පදේ තෝරා පිමි මම යාලූ

පුරාණ තේරවිලි කවි කීපයක්

පරුවත තුනක් නැගෙමින් බඩ පුරා ගෙන
ඔරු නොපදිනා ජල දෙක කඳට බැඳ ගෙන
දරුවෙක් කුළුඳුලේ උකුලට වඩා ගෙන
දරුබර කතක් ඇත පෙරසිට කිළි නො වන

උන් රට මෙතේරිය අමුනකි දිය ගන් ඩ
තුන් අවුරුදු ළමයෙකි ගිනි මොලවන් ඩ
උන් බැස ගිය තොටෙ බැරි පිනා යන් ඩ
පන්හිඳ ගත් අයට මිස බැරි තෝරන් ඩ

රට රට හැම තැන තොටමුන වල්වල නිතරම මොහු ගැවසී ඉන් නේ
වට පිට යන කළ පයින් ගමන් නැත වඩා ගනයි මොහු ඇවිදින් නේ
කට ඇත උගුරද රසදිව සමගින් බඩවැල් දරණේ නැත උන් නේ
අට හැට කෙළ හැට ලක්‍ෂ ආයු ඇත කවදුවත් මුන් නොමැරෙන් නේ

පානැත සිව් අතක අතැඟිලි දෙදාසෙ ක
දා යන නටු අටෙන් ගැලවෙන දිවසයෙ ක
බෝවෙන පස් දෙනක දරුවන් සිරස මුක
රෑ වෙන තුරා රැක ඉඳ කරඹ වනය ක

කොස් ගෙඩියක් පිළිබඳව රචනා කරණ ලද කවියක් මෙසේය.

බාලේ පටන් ලේකම් ලියුමට කැම තී
ආලේ බලා අහනෝ ඇට කා බල තී
කාලේ අන්තිමට කව්රුත් හොඳ කැම තී
රාලේ ඇඟට නවතින් පන ගියේ නැතී

රයිගම කෝරළයේ සිට කුකුළු කෝරළයට දීග ගිය රිදී නැන්ද කෙනෙක් කී කවියක් මෙසේය.

රයිගම කෝරළේ ගම මැද ඉප දීලා
කුකුළු කෝරළේ දුදනන්ට අසු වෙ ලා
වේලේ දෙවේලේ කැඳපත් වරා ලා
සොඳයි අයියන්ඩී දුන් සැටි සොයා ලා

ගලතුරේ මද්දුවා හෙට්ටිගේ රතු උපාසක තැනට පාඩම තිබුණ පුරාණ කිවිවරයෙකු ගේ ලිය විල්ලක් මෙසේය.

ගසක බැලිමි ගස් රුකුලක නොවේ යමි
ගලක බැලිමි ගල් රුකුලක නොවේ යමි
තුඹසක බැලිමි බිම් රුකුලක නොවේ යමි
මම දුටු මීය පිට පිට මී තුනයි එමි

ඇහැළියගොඩ වලව්වේ බලියක් බැලීමට ගිය අයෙකු එම බලියාගය කළ ඇදුරා පිණුමක් ගැසීමේ දී පහත් නිවුණ අන්දම දක කියන ලද කවියක් මෙසේය.

බලියක් තිබුණි ඇහැළියගොඩ වලව් ‌වේ
එළියක් නැතිව අඳුරේ කන්නලව් ‌වේ
වලියක් මම ගොසින් දුටු පල හිලව් ‌වේ
පිනුමක් මොටද බලියට මල ඉලව් ‌වේ

කිතුල්පෙ නිළමෙ වැසි දිනක කුඩයක් ඉස්ලාගෙන යනවිට එක්තරා තරුණියක් කුඩය යටට පැමිණියාය. ඒ අවස්ථාවේ දී ඔහු කියන ලද කවියක් මෙසේය.

කුටත් වඩන තුඹෙ ගණ රන් තන කැකු ළ
මටත් ඇහට ලංකර නොකරන් අවු ළ
වටත් පිටත් බලමින් මාවත් අස ළ
හෙටත් මෙහෙම සරි ගියෙ නම් මඟෙ කුස ළ

සැරිසරා නඩු විසඳන මොලමුරේ නඩුකාර මැතිතුමා ගලතුරේ කිසියම් ස්ථානයක නඩු විසඳන දිනක බබා නයිදේ නැ මැ ති කෙනෙක් බොරු සාක්ෂියක් දෙනු බලා සිටි තවත් කවි කීමෙහි දක්ෂයෙකු මෙම කවිය කියා ඇත.

සුබා ගුණ වඩන මොලමුරෙ මැති වෙත ට
සබාවට ගොසින් බොරුවෙන් කීවා ට
ලැබා අපහාස එතුමාගේ අණ ට
බබා නයිදෙ දමුවයි ගල් වැටෙන් පිට

# සබරගමු ජනප්‍රවාද ආශ්‍රිත කවි.

**උපායෙහි දක්ෂ යකැදුරෙකුගේ කවි:—**

උපායෙහි දක්ෂ යකැදුරෙක් මෙහි කලකට පෙර විසූවේය. මොහු දක්ෂ යකැදුරෙක් මෙන්ම අපරාධ කාරයෙකුද විය. මොහුට විරුද්ධව තිබූ වරෙන්තුවකට අල්ලා ගැනීම සඳහා රාජ පුරුෂයෝ උත්සාහ ගත්තද උපායෙහි දක්ෂ ඔහු අල්ලා ගත නොහැකිවිය. දිනක් මොහු කිසියම් ගෙදරක තොවිලයක් කරණ බව දැන ගන්නට ලැබී රාජ පුරුෂයෝ ඒ ස්ථානයට සොයා ගොස් ඇත. රාජ පුරුෂයන්ගේ පැමිණීම ඉවෙන් මෙන් දැනගත් ඇදුරා ඔවුන්ගෙන් ගැලවී යාමේ උපාය මාර්ගයක් ගැන කල්පනා කළේය. තොවිලය සම්බන්ධ කවි කියන අතරෙ වරක් ඔහු තම අතවැස්සාගේ නම කියා කතා කර මේ කවි දෙපදය කීවේය.

වරෙන්තුවක් අරගෙන විත් සිටියේ
ඒකට උපමා කොහොමද සැටියේ

ඇදුරා කවියක පදයක් හෝ දෙපදයක් කියූ විට ඉදිරි පද සම්පූර්ණ කිරීම අතවැස්සාගේ සිරිත විය. මෙය අත්වැල් ගී කීම යැයි කියනු ලැබේ. ඇදුරාගේ අතවැස්සාද කවටයෙකු විය. හෙතෙම ඉදිරි දෙපදය මෙසේ සම්පූර්ණ කළේය.

නැඹිලියට බත් අරු හොඳ සැටියේ
අමතන්නට ඔහෙ ගිය ගිය සැටියේ

ඉන්පසු තොවිලය නොනවත්වාම කරගෙන ගියේය. තොවිලයේ වෙනසක් කිසිවෙකුට නොදැණුනි.

මෙම තොවිලය අද "දූරුහැව" දැමීම යනුවෙන් හඳුන්වන තොවිලයකි. එම තොවිලය අවසානයේ ඇදුරා "දූරුහැව" හෙවත් කෙසෙල් පතුරු හෝ කොළ වලින් සකස් කරන ලද මැස්සක දමා සොහොන් බිමකට හෝ ගං අයිනකට ගෙනයාම සිරිතය. එහිදී හෙතෙම නූල් මතුරා ගෙනැවිත් ආතුරයාගේ අතෙහි ගෙලෙහි බඳියි. ඇදුරා නූල් මතුරාගෙන එනතුරු ආතුරයා හා අනෙක් අය බලා සිටිති. රාජ පුරුෂයා හා අනෙක් අය මේ ඇදුරාද මැතිරූ නූල් අරගෙන එනතුරු බලා සිටියේය.

මෙසේ බලා සිටි පිරිස වෙත මැතිරූ නූල් ගෙනාවේ අතවැස්සාය. ඇදුරා නැඹිලිය සහිතවම අතුරුදන් වී තිබුණි.

**ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක් බලි ඇදුරෙකුගේ කවි :-**

ආදි කාලයේ ප්‍රභූ ගෙදරක බලියාග ශාන්ති කර්මයක් සිදු කළේය. විශාල මඩුවක් සකස් කර යාගය පැවැත්වීමට කටයුතු යෙදවූයේය. බලියාග දින ළඟාවත්ම ඇදුරෝ යුහුසුළුව බලිඅඹන්නට විය. බලි දිනය උදාවිය. ඇදුරෝ කඩිමුඩියේ සකස් කළ බලි කෙලින් කර තැබුවේය. හදිසියේ කල වැඩක් හෙයින් එක් බලියක හිස පහතට සිටිනසේ ඔසවා තිබුණි.

කටයුතු අවසානයේ ප්‍රභූ වරයා බලි මඩුවට පැමිණ එක් එක් බලිය ළඟට යමින් ඒවායේ නම ගම බලි ඇදුරාගෙන් අසන්නට පටන් ගත්තේය.

හිස පහතට හරවා තිබුණ බලිය ළඟට පැමිණ ඒ බලිය මොකක් දැයි ප්‍රභූ වරයා ඇසුවේය. බලිකාරයාට වැරද්ද පෙනුනේ ඒ අවස්ථාවේදීය. නමුත් එය වැරදීමක් බව කීවොත් උදහසට පත්වේය යන හැඟීමෙන් එය නොහඟවා වහාම මෙම කවිය කියා ඇත.

සැන්දෑ ජාමෙ කෙළ ඇවිදින් නේ
රබබඩ පැණිමයි භෝජන වන් නේ
ගල්ලෙන් දුටුකළ වාසෙ කරන් නේ
වවුල් රකුසු ආතුර රැක දෙන් නේ

යනුවෙන් "වවුල් රාක්ෂ බලිය" ලෙසින් එය පෙන්වා ජයග්‍රහණය ලැබීය.

**කවිකාර භික්ෂූන් වහන්සේ නමක් ගැන:-**

එක් දිනක් සිවුරු හැර ගිය කෙනෙක් (හීරළුවෙක්) "අංකුටුවල නම් ස්ථානයක මාලු අල්ලමින් සිටියේය. මේ අවස්ථාවේ පැවිදි කාලයේ තමාගේ ගුරුවරයා වශයෙන් සිටි භික්ෂූන් වහන්සේ නම මේ ස්ථානයෙන් වැඩම කරන්නේ සිවුරුලූ අය මාලු බාමින් සිටිනු දැක්කේය. ඒ දැක මේ කවිය කියා ඇත.

දන්ගොටු නිලේ හැරවිත් දූන් ගම සිටින
විත් පටු කුලේ දළු ගොඩගේ සහ රුවන
පින්වැඩි කැලේ බැඳි පෙරහන් කඩ රැගෙන
අංකුටු වලේ දිය පෙරතියි පිට පටින

දංගොටු නිලේ — පැවිදිකම
විත් පටු කුලේ — ගෘහස්ත භූමිය
පින්වැඩි කැලය — පැවිදි භූමිය

**විහිළුකාර භික්ෂූන් වහන්සේ නමක්:-**

දිනක් දුර බැහැර පළාතක සිට භික්ෂූන් වහන්සේ නමක් තෙල්වත්තේ පන්සල නමින් හඳුන්වන විහාරස්ථානයකට වැඩම කළේය. එසේ එනවිට පන්සලේ සිටි තෙල්වත්තෙ හාමුදුරුවෝ පිටත වැඩම කොට තිබුණි. පිටතින් පැමිණි භික්ෂූන් වහන්සේ රෑ බෝවන තුරුත් බලා සිට තෙල්වත්තෙ හාමුදුරුවෝ නො වැඩියෙන් ආපසු වැඩම කරන්නට සිතුවේය. එසේ සිතා අඟුරු කැටයක් ගෙන ඉදිරිපස බිත්තියේ කවියක් ලියා එම හාමුදුරුවෝ යන්නට ගොස් ඇත.

ගල් වත්තේ වපුලට බිජු පලක් නැත
සිල් ගන්නේ කුමටද නුවණ නැති සිත
කල් මත්තේ දනිතොත් මෙහි එවුම නැත
තෙල් වත්තේ මහණට සිල් කොහෙත් නැත

**ගෙවල් අසල වැවිය යුතු ගස් වර්ග පිළිබඳව ජනප්‍රවාද වල එන කවි දෙකක් මෙසේය.**

සපුනා කිණිහිර ගිවුළුද අඹබා
එපනා දෙඹ බෙලි නෙරළු ක දඹබා
සුමනා බඳුවද මලිගීය දඹබා
තිබෙනා ගෙත් ගෙට සවසිරි පුඹබා

ගෙදරකඩ නොවැවිය යුතු ගස් :-

එරබදු වතුසුදු කතුරුද රඹා
පරසිඳු තුල් කපු සහ නුග නිඹා
පෙර මිදුලෙහි ළඟ තිබුනොත් සඹා
සුරනිඳුගේ මත් ඉසුරු කළඹා

**භික්ෂූන් වහන්සේ නමකට විහිළුවක්.**

ඇහැළියගොඩ දෙල් හිටියා වත්තේ මුහන්දිරම් මහතාගේ මෘත ශරීරය කැන්දන්ගමුව තැපැල්පලේ පන්සල සමීප ඉඩමක භූමිදනය කරන ලද්දේය. මේ සිද්ධියෙන් බයවූ විහාරස්ථානයේ සිටි කුඩා හිමි නමක් පන්සල අතහැර යන්නට ගියේය. ඒ අවස්ථාවේ එම මුහන්දිරම්ගේ බෑණා කෙනෙකු පහත දක්වෙන කවිය කියා ඇත.

කරුණක් කියමි මකියනවා අහ පල්ලා
බොරුවක් ලොවේ කීවට මුනි සිතවිකලා
සිවුරක් ගන්ට බැරි වුනි සෝනා දකලා
වරුවක් නොසිට දිව් සැටි අද දූන ගල්ලා

මහන කම කියා සිවුරක් පොරොව ගන
බොහොම සත නිවන් දක්වන අදහ සිත
ඔහොම පණ තියා රකිනා සිල් කුමන
බොහොම හොඳයි දිව් ගලවා ගිය ගමන

කෙලෙස් නැතිකරණ මහතෝ මෙහම කොට
පොලොස් කන අපට කියති බණ එමට
තිදස්පුර දෙවිඳු දකලා දිව නෙතට
මිනිස් පහස දුරලා ගිය සුර ලොවට

අසාලා නැද්ද පෙර උතුමන්ගෙ තෙද
නසාලා සෙනහ යකු කෘ වැනසූ වෙද
දෙසාලා මුනිඳු එරුවන් දහම් කඳ
විශාලා නුවර යකු සිටියේ නැද්ද

නෙකය ලොවට කිව්දෝ ඇති මුත් හේමා
මෙකය විදුලි විලසට වෙයි නැති වීමා
මෝහඳුරු දුරු කලොත් සත හට වැඩ වෙමා
මෙකවි මම කලේ රතගිර කිව්ඳු තුමා

**රත්නපුරේ නවදුන් කෝරලේ උපාසක අම්මා කෙනෙකු කුකුළු කෝරලේ සිටි තම දුවට ලියා යවන ලද කවියක් මෙසේය.**

කුකුළු කෝරළේ සිටිනා දුවේයා
දතේ සදලා දුන්නේ සිහි වෙන්ට
සිල්පේවුනාම කන්ට හකුරු මුලක් එවාපන්
මෙක කියාපන් කිරි අප්පුවෝ උඹ

මේ ප්‍රදේශයේ එක්තරා භික්ෂූන් වහන්සේ නමක් තවත් භික්ෂූන් වහන්සේ නමකට ලියා එවන ලද බෙහෙත් සීට්ටුවකට අයිති කවි කිහිපයක් මෙසේය.

මිදිකර ඇටගෙන උණුදිය රෙහිලා පදම බලාලා බාගන්නෙ
වැඩිපුර කෝටලා පිටිගෙන ලිප්ගල් දෙකට දෙපයදී ඉඳගන්නේ
වැඩිපුර ඉඩ ඇති බඳුනක වත්කර තද උණුසුම් පිට පිටිලන්නේ
කඩිනම් කර හොඳ ගැට නොගැසෙන්නට හතිකට කලවම් කරමින්නේ

ඔරු පදිනා ලෙද ඇද ඇද පතුගා දියවර තුනකින් තම්බන් නේ
තරු පේනනා ලෙස ඇස්වල දුම් වැද පදම බලාලා බාගන් නේ
බොරු නොවෙනා ලෙස ලෙලි නැති පොල් ගෙඩි තරමට ගුලි කරවා ගත් නේ
ඔරු දමනා ලෙස මාත්තු සමගින් මද උණුසුම් පිට වලදන් නේ

මිරිස් ඇඹුල් ලුණු සම්බර තිබ්බොටු හොද්දෙන් දඩමසයෙන් කෑවයි
සුරුස් ගාණ පවතින සෙම් කැසි මුසු විසි මේහය හරිසස් මෙ වයි
හරස් අතට බණ්ඩිය බෙරිමද හන්දි කෙටුම ඉදිමුන් මෙ වයි
සරස් කියා ගුණ වෙයි මේ කී ලෙඩ තද බඩ ගින්නට අත් දුටුවයි

බැදිගම අප්පුහාමි නැමති අය ගාල්ලේ රාලහාමි කෙනෙකුට යවන ලද ලිපියක තිබූ කවියක් මෙසේය.

රටින් ගෙනන ගුළ කැඩිච්ච හාලුත් නැති කල මුට්ටුව
තුටින් බුදින රට දෙල් ගැට නැති කල වෙයි ඇඟ කෙට්ටුව
කටින් දොඩන නරිවාදම් එතකොට නැතිවෙයි ගැට්ටුව
විටින් විටම පිහිට වෙන්නෙ අපරට කුරහන් පිට්ටුව

මේ ප්‍රදේශයේ කෙනෙක් රචනා කරන ලද තේරවිලි කවියක් මෙසේය.

සන්සාරේ සාගර මැද ලොකු වෙනවා.
දුන් බාලේ එන මුනිඳුට පිට දෙනවා
මේවායේ මුදුනෙන් මල විහි දෙනවා
තුන්දරේ නම ඇති ගස තෝරනවා

කිසියම් කවියෙක් එක් කාන්තාවකට කියූ කවියක් මෙසේය.

කාරිය අසන් බෙම්තොට නයිදේ වරුන
බාරිය තුක් ලැබුණ මේ තුන් ලොව වටින
විරිය කෙරෙයි විෂ්ණු දෙවිට සරිලන
සූරිය වැන්න මේ තුන් ලොවට පායන

කුරක්කන් අඹරමින් සිටි එක් කාන්තාවක් දැක කිසියම් කෙනෙක් කී කවියක් මෙසේය.

සුරක්කං රුසිරු රූ සිරි ලද ලියනෝ
සුරක්කං ලෙසට එන නුඹෙ කැකුළ තනෝ
තරක්කං මෙමට නොකරන් සෙනෙහසි නෝ
කුරක්කන් තදින් නොකොටං වැටෙයි තනෝ

එයට එම ස්ත්‍රිය කියන ලද පිළිතුරු කවිය මෙසේය.

ලොවටත් පැවත එන දේ කි කුරක් කත්
පවටත් ඉපදිලා කරණා නරක් කත්
අපටත් මෙහෙම කවි සිපද කියත් නෑ
වැටෙතත් අනේ නොකොටා බැරි කුරක් කත්

තවත් කවියෙක් කියන ලද කවියක් මෙසේය.

යලට මහට දෙකටම ඇත්නම් හෙරලි
කහට ගැට පමණ වෙනකොට වෙයි පෙරලි
මහට මස් දමා ගැහැණුන්ගෙ සැරසිලි
කැහැටු අහනත්ට දිව බෙහෙතකි හෙරලි

පැල් රකින කෙනෙකුට යටිපව්වේ සිටි කවියෙක් කියන ලද කවියක්.

අරල හිරල ගිරි කුඹුරේ පැ ලේයා
හිරල ගඳට එති ඌරෝ රෑ ලේයා
කතා නොකර තෝ හිටපිය පැ ලේයා
කතා කළොත් තා ගෙන යයි කැ ලේයා

සිවුරු හල අයෙක් පසුව විවාහවී, විවාහ ජීවිතයෙන් කළ කිරුණු පද කවි දෙකක් ලියා තමා විවාහ වී සිටි කාන්තාවටද පැවිදි ජීවිතයේ ගුරු හිමියාට යැව්වේය. ඒ කවි දෙක මෙසේය.

කාන්තාවට ලියන ලද කවිය;-

ආදර ගුණ මිතුරු කම බැඳිලා නොප වූ
ඒ පෙර තිබුණු හොඳ සිත් කරගති කිළි වූ
මා ඇර වෙන පිරිමි ගෙන්නූ මීස අරි වූ
ඒ හැර වෙන මොකද මට කරණ වම බො වූ

ගුරු ස්වාමීන් වහන්සේට දුන් කවිය:-

හඳුනා ලියන්නේ දකලා තත ලෙල්ල
මදනා නැසූ පමණෙකි අම්මා පල්ල
තිබුණා විලිය පුරවා තයිලම පෙල්ල
අඳිනා ටික මෙන්න සමිඳුනි වැර හැල්ල

පුරාණ කාලයෙහි පිට රටින් මෙරටට පැමිණි අයෙක් ගැන ලියන ලද කවියක් මෙසේය.

රටින් නොරටින් හිඟා කා යට නිවට කෝකත් කෑ දියා
රකෙත් මැයි අත් තැනෙක වැදසිට ඇද වසුන්කත් දර දියා
වටින් උපමාවක් යොදලා අඩුව ගනිමැයි සිතූ දියා
පිටින් ආ බොර දිය තිබෙද්දී ගොඩ ගියැයි වල තිබූ දියා

# සබරගමු කවි පරපුර . . . . . .


කාව්‍ය ශාස්ත්‍රය.

කරදන විදනෙලාගේ කඩිසරඅප්පුහාමි මහතා.

කරදන ලේකම්ලාගේ අප්පුහාමි මහතා.

ඇලපාත මුදලි ( විමල ධම්ම ) තුමා.

නක්කාවිට වෙදරාල මහතා.

දෙරපනේ මුකවෙටි අතපත්තු මුහන්දිරම් මහතා.

හල්කඳලියේ ලේකම් මහතා.

පණ්ඩිත වේරගම පුංචිබණ්ඩාර තුමා.

අප්පු සිංඤො මහතා.

පුස්සැල්ලේ කපුරාල මහතා.

කළුගොඩ රාල හා කැකිරිගොඩ රාල දෙපොල

නැකැත්කාර තෙරනමක්.

එපිටවල දසනායක අප්පුහාමි විදනෙ මහත්මයා.

දොඩම්පෙ ලොකුබණ්ඩා සහ උක්කුබණ්ඩා දෙපොල

නැදුරණ හෙන්ද්‍රික් රාමචන්ද්‍ර අප්පුහාමි මහතා.

දොඩම්පෙ බාලහාමි වෙද මහත්මයා.

උක්කැත්තෙ කන්දෙ ලේකම් මහතා.

කුට්ටි කන්දෙ මල්හාමි කවියා.

කිරිඇල්ල ඒදණ්ඩමුල වත්තෙ ලොකුහාමි විදනෙ මහත්මයා.

ඒදණ්ඩමුල වත්තේ මුදලිහාමි ලේකම් මහත්මයා.

කිරිඇල්ලේ හාමි ආරච්චි මහත්මයා.

එපිටවල දසනායක මුදලිහාමි විදනෙ මහතා.

දුම්බර නෝනන්චි කංකානම.

රත්නපුරේ මෝයස් තිලකරත්න මුදලි තුමා.

නවදුන් කෝරළේ කර්තේලිස් අප්පුහාමි ගම ආරච්චි මහතා.

මාරපන අංගප්පුලියා

පුස්සල කන්ද.

කරවිල කන්දෙ හාමුදුරුවෝ

නවදුන් කෝරළේ සිටි කවියෙක්.

නවදුන් කෝරළේ වේරගම ආරච්චි මහතා

යටිපච්චේ අතුකෝරළ අප්පුහාමි

නවදුන් කෝරළේ රන්මල්හාමි කිව්දිය.

කරදනශ්‍රී සෝභිත මහා ස්ථවිර පාදයන් වහන්සේ.

කරදන ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ

කොස්ගොඩ රාල සහ උඩුගහපිටියෙ රාල.

කරදන කේ. එන්. ටී. ගුණදාස මහතා

බඹරබොටුවේ සුධර්ම සෙනෙවිරත්න මහතා.

අත්තරගම බණ්ඩාර රාජගුරු තුමාගේ ශිෂ්‍යයෙක්

කරදන කේ. එන්. ටී. චන්ද්‍රසේන මහතා

පූජ්‍ය පණ්ඩිත ඇරැපොල ප්‍රේමරතන ස්වාමීන් වහන්සේ

පූජ්‍ය කොටාමුල්ලේ මේධංකර ස්වාමීන් වහන්සේ.

තිඹිරිපොලේ අදිකාරම් තුමා.

හංගමුවෙ ජයසිංහ මනම්පේරි මහතා.

කරදන තිලක මහතා.

කන්දෙ වලව්වේ ආතර් ඇහැළියගොඩ මහතා.

මාරපන කිරිහාමි මහතා.

ගලගම් විලියම් අප්පුහාමි මහතා

ඕමල්පේ හෙන්රි තෙන්නකෝන් මහතා.

දෙමුවාවත ප්‍රේමාලෝක ස්වාමීන් වහන්සේ

දේවාලෙගාව නිමල් කුමාරවංශ මහතා.

කරදන විද්‍යාරත්න මහතා,

දිමියගොඩැල්ලේ මුදියන්සේ මහතා.

සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ – 1

සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ - 2

සාගර පලන්සූරිය මහත්මා.

සබරගමුවේ කවියෝ කියන ලද තලමලේ කවි.

සබරගමුවේ අප්‍රකට කවි හා කවියෝ - 3

සබරගමු කවි.

සබරගමු ජනප්‍රවාද ආශ්‍රිත කවි.



ISBN 955 - 9290 - 02 - 9

ඉසුරු මුද්‍රණ - හිග්ගස්හේන, කුරුවිට.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : ..2017-10-03........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ....S. A. C. Sadaruwan....................................

Signature : ..........................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN..........................................................

Name : T.N. NEIGHSOOREI..........................................................

Signature : ..........................................................................

Date: ..2017-10-03.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*